පුවත්පත
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න

අරුණ

2023 ජූලි 18 අඟහරුවාදා | හතර වැනි කාණ්ඩය | 246 කලාපය | මිල රු 60.00 | www.aruna.lk

## දොස්තරලා නැතිව
# කටුගහහේන රෝහල වැසෙයි
## බාහිර ප්‍රතිකාර පමණයි




■ බන්දුතිලක තඹවිට - මතුගම

මතුගම කටුගහහේන ප්‍රාදේශීය රෝහලේ සේවය කළ වෛද්‍යවරුන් තිදෙනකු අසනීප වීම නිසා එම රෝහලේ නේවාසික ප්‍රතිකාර නතර කිරීමට තීරණය කර ඇත. මෙම රෝහලේ වෛද්‍යවරුන් පස්දෙනකුගෙන් සමන්විත වුවද ඉන් එක් වෛද්‍යවරියක් ස්ථාන මාරු වීම් ලබා ගොස් ඇති අතර තවත් වෛද්‍යවරියක් සේවයෙන් ඉවත් වන බවට ලිපියක් ලබා දී තිබේ.

02 පිටුවට

## තුන්දාහේ බුෂ් එක 78,000ට ගත්තැයි
# පොස්පේට් නිලධාරියාට සේවක විරෝධය



## "මේ මිනිහගේ වැඩ තහනම් කරන්න"
- රාජ්‍ය ඇමැති චාමර

■ තිසර සමල් - අනුරාධපුර

එප්පාවල ලංකා රාජ්‍ය පොස්පේට් සමාගමේ නිරීක්ෂණ කටයුත්තක් සඳහා කර්මාන්ත රාජ්‍ය ඇමැති චාමර සම්පත් දසනායක ඊයේ (17 වැනිදා) පැමිණි අවස්ථාවේ ආයතනයේ වංචා දූෂණවලට සම්බන්ධ බවට චෝදනා කරමින් විධායක නිලධාරියකුට සේවකයෙක් පහර දුන්නේය. මෙම පහරදීම සිදුකරනු ලැබුවේ රාජ්‍ය ඇමැතිවරයා ඉදිරිපිටදීය.

02 පිටුවට

# වතුර පිට යවන ගොවීන්ගේ සහන මල්ල කපා දමයි

■ සාලිය කුමාර ගුණසේකර

ජලය නාස්ති කරන ගොවීන්ට කිසිදු සහනයක් ලබා නොදීමට කෘෂිකර්ම අමාත්‍යාංශය සැලසුම් කර ඇත. කන්නවලදී වගාවට ජලය නිකුත් කිරීමෙන් පසුව එම ජලය වගාවට නොයොදන ගොවීන්ගේ සහන කපා හැරීමට නියමිතය. ඒ අනුව, ජලය නාස්ති කරන ගොවීන්ට රජයේ කිසිදු සහනාධාරයක් හිමිනොවන බව කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහන් කරයි.

02 පිටුවට

### ගෙවල් ගිනි තියලා වට්ටන්න බැහැ
## අපි දැන් ඉන්නේ ගේමේ
-ප්‍රසන්න රණතුංග



මින් ඉදිරියට සිය පාක්ෂිකයන්ට හිරිහැර කළහොත් ඒවාට පොලියත් සමග වන්දි ගෙවීමට සිදුවන බව නාගරික සංවර්ධන හා නිවාස ඇමැති ප්‍රසන්න රණතුංග පැවසීය.

02 පිටුවට

### මූලික අයිතිවාසිකම් පෙත්සම්වලින්
## ජනපති සමාවට අභියෝග කරන්න බැහැ
### නීතිපති ශ්‍රේෂ්ඨාධිකරණයට කියයි

■ කේ.එස්. උදයකුමාර

අධිකරණය මගින් වරදකරුවන් කරනු ලබන පුද්ගලයන්ට සමාව ප්‍රදානය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ජනාධිපතිවරයා වෙත පැවරී තිබෙන බලය මූලික අයිතිවාසිකම් පෙත්සම් තුළින් අධිකරණය හමුවේ අභියෝගයට ලක් කළ නොහැකි බව නීතිපතිවරයා ඊයේ (17වැනිදා) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.

02 පිටුවට

### කොළඹ-ගම්පහ-කළුතර
## බරවා රෝගීන් බරටම

■ සුනිල් රූපසිංහ- පල්ලේපොල

ජලාශ සහ වැව් ආශ්‍රිත කලාපවල බරවා මදුරුවන් බෝවීමේ ප්‍රවණතාව ඉහළ ගොස් තිබේ. ජපන් ජබර සහ සැල්වීනියා බරවා මදුරුවන් බෝවන ස්ථාන බවට හඳුනාගෙන තිබේ.

02 පිටුවට

### ඖෂධ මරණ හොයන්න
## සත් පුද්ගල කමිටුවක්

■ හෂිනි කුලතුංග

රජයේ රෝහල්වලදී ලබා දුන් ඖෂධ නිසා සිදු වූ බව කියන මරණ සම්බන්ධයෙන් සොයා බැලීමට සෞඛ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල විසින් සත් පුද්ගල කමිටුවක් ඊයේ (17 වැනිදා) පත්කරන ලදී.

02 පිටුවට

## ඇක්සිඩන්ට් ලෙඩාගේ ඔක්කොම අතගාගෙන ඇඩ්මිට් කරලා
### උස්සපු කාඩ් එකෙන් බඩුත් අරන් තෙලුත් ගහගෙන

■ ඉෂාර රත්නකාර

රිය අනතුරකට ලක්ව සිහිසුන්ව මාර්ගයේ වැටී සිටි පුද්ගලයකුගේ මුදල් පසුම්බිය සොරාගෙන එහි තිබූ මුදල් සහ බැංකු කාඩ්පත් භාවිත කර රුපියල් තිස්පන්දහසකට (35,000) ආසන්න ඇඳුම් පැලඳුම් සහ ආහාරපාන ලබාගත් සැකකරුවකු රිමාන්ඩ් භාරයේ තබන ලෙස අධිකරණය ඊයේ (17 වැනිදා) නියෝග කළේය.

02 පිටුවට

## රාජ්‍ය සේවකයන්ගේ දරුවන් වෙනුවෙන් චක්‍රලේඛය බුරුල්වෙයි

■ නිලන්ත මදුරාවල

වසර මැද ස්ථාන මාරු ලබන රාජ්‍ය සේවකයන්ගේ දරුවන් ජාතික පාසල්වල අතරමැද ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීමට අදාළව ඒ සඳහා වන චක්‍රලේඛයට සංශෝධන ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

02 පිටුවට

## රට හාලෙන් බියර් හදල හමාරයි

■ සාලිය කුමාර ගුණසේකර

බියර් සහ සත්ත්ව ආහාර සඳහා දේශීය සහල් යොදා ගැනෙන බවත්, කිසිදු ආකාරයකින් සහල් ආනයනය කිරීමට ඉඩ නොදෙන බවත් කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසුවේය.

02 පිටුවට

## ඖෂධ- ශල්‍ය උපකරණ 64ක් බාල බව තහවුරු කරලා
-විශේෂඥ වෛද්‍ය චමල් සංජීව

07 පිටුවට







### 70 පැන්න උපදේශක
# ජපන් ටීචර්ගේ නාඩි බලා වැඩ අල්ලන්න ගිහින්
### ගෙදර එක්කන් ගියේ අඩුපාඩු හදන්නලු

■ දර්ශාන් කානිල් - මොරටුව

අමාත්‍යාංශයක උපදේශක තනතුරක් දරන 71 හැවිරිදි ආචාර්යවරයකු ජපන් භාෂාව උගන්වන රූමත් තරුණ ගුරුවරියකට ලිංගික අතවර කළැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරන බව මොරටුව පොලිසිය පවසයි.

02 පිටුවට

# එහෙන් මෙහෙන් එන අයිස්, හෙරොයින් පොලිසියත් මත් කරයි

■ එෆ්.අස්ලම්

මෙරට මහජන ආරක්ෂාවට, මෙන්ම මත්ද්‍රව්‍ය හා අපරාධ උවදුරු මැඬලීමට පොලිසියෙන් සිදුවන්නේ විශිෂ්ට සේවයකි. රටපුරා එම භාරදූර කාර්යයට ඇපකැප වී සිටින නිලධාරීන් ගණන අසූනව දහසකි. නමුත් දැන් පොලිසිය ගැන වෙනත් මානයකින් කරන කතා බස්ද අසන්නට ලැබේ. ඒ පොලිසියේ නිලධාරීන් දහසකට වැඩි පිරිසක් හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍යවලට නැඹුරු වීම නිසාය. මෙය පොලිසියේ කීර්තිනාමයට එල්ල වන බරපතළ කැළලක් බව අමුතුවෙන් කිව යුතු නැත.

මෑතකදී ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් අහඹු ලෙස යොදු ගනිමින් කරන ලද පරීක්ෂණ වලදී පොලිස් නිලධාරීන් 100 කට වැඩි පිරිසක් අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් භාවිත කරන බව හෙළිවී තිබේ. පොලිස් මූලස්ථානය සඳහන් කරන අන්දමට පොලිසියේ නවක නිලධාරීන් රැසක් මෙලෙස අයිස් හා හෙරොයින් භාවිතයට නැඹුරු වී තිබෙන බවත් එවන් නිලධාරීන් දහසක් ඉක්මවූ පිරිසක් සිටිය හැකි බවත් වාර්තා වේ.

මෙලෙස මත්ද්‍රව්‍ය භාවිතයට හුරු පුරුදු වී සිටින නිලධාරීන් පොලිසියේ වැටලීම් අංශ මගින් අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගෙන් ලබා ගන්නා මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් ඒ සඳහා මුදල් වැය කිරීමක් නොකරන බවත් පැවසේ. කෙසේ වෙතත් පොලිසියේ එවන් ක්‍රියාවන් ගැන දැන් කියන්නට ඇත්තේ නඩුත් හාමුදුරුවන්ගේ බඩුත් හාමුදුරුවන්ගේ කියා පමණි.

මේ සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ ප්‍රධානියකුගෙන් අප කළ විමසුමකදී කියා සිටියේ උද්ගත වී ඇති මෙම අහිතකර තත්වයට පාදක වූ පොලිස් නිලධාරීන් හඳුනාගැනීම සඳහා පොලිස් ස්ථාන මට්ටමින්ම පුළුල් අවධානයක් යොමු කරන බවය.

පොලිසිය ගැන
පොලිසියට කියන්න
011-2013046/
011-2 2430913/ 118
අපරාධයක්/
හදිසි අවශ්‍යතාවක් නම්
119

# ඕ.අයි.සීලාට ගෙම්බර් දාන්න ගිය පොලිස් ලොක්කෙක් ජෝකර් කෙනෙක් වෙයි

■ එෆ්.අස්ලම්

මම මෙතැනට ආවේ උඩින්ම ඉල්ලගෙන ඕයි. හැබැයි පුතෝ මම මෙතැනින් යන්නේ තමුසෙලා ඔක්කොම අරගෙන යැයි බස්නාහිර පළාතේ උසස් පොලිස් නිලධාරියකු පසුගියද පොලිස් ස්ථානාධිපතිවරුන් හා වැටලීම් කණ්ඩායම් නිලධාරීන්ගේ රැස්වීමකදී ප්‍රකාශයක් කර තිබුණේ පොලිස් ස්ථානාධිපතිවරුන් අතර උපහාසයට ලක්වෙමිනි.




මෙම උසස් පොලිස් නිලධාරියා මීන් පෙර සේවය කර ඇත්තේ පොලිස් විශේෂ කාර්ය බලකායට අනුයුක්තවය. නමුත් ඉහළ දේශපාලන හා පොලිස් නිලධාරීන්ගේ සම්බන්ධතාවන් සමගින් මොහු කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රබල දිසාවක් භාරව රාජකාරි අරඹා ඇති අතර මොහුගේ දූෂිත ක්‍රියාවලට සම්බන්ධ වී ඇත්තේ තම ගෝල බාලයන් වූ පොලිස් ස්ථානාධිපතිවරුන් හා පරීක්ෂක නිලයන්වල පසුවන පිරිසකි.

මොහු සම්බාහන මධ්‍යස්ථානවලින් මාස් පතා මුදල් ලබා ගන්නේද ස්ථානාධිපතිවරුන් හරහාය. ඒ වෙනුවට බාධාවකින් තොරව සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑමට මොහු ඉඩකඩ ලබාදෙන්නේ අදාළ ස්ථාන වැටලිම්වලට යන පොලිස් කණ්ඩායම්වලට ඇයි තමුසෙලා ඕක අස්සේ රිංගන්නේ, ඒ ගැන මම බලාගන්නම් යනුවෙන් බැණ වදිමිනි.

එසේම කඩුවෙලට නුදුරින් මෑතකදී නිවසක් ඉදිකළ මෙම නිලධාරියා ඒ සඳහා අවශ්‍ය ගල්,වැලි, සිමෙන්ති, මෙන්ම නිවසේ ගෘහ භාණ්ඩ ද ලබා ගෙන ඇත්තේ පොලිස් ස්ථානාධිපතිවරුන් මගිනි. එක්තරා ස්ථානාධිපතිවරයකුගෙන් මෙම උසස් නිලධාරියා ලී වලට ප්‍රසිද්ධ මුහුදුබඩ ප්‍රදේශයකින් ලක්ෂ 15 ක පමණ ලී බඩු ලබාගෙන ඇති අතර ඒ සඳහා ශත පහක් හෝ ගෙවා නැත.

මෙවන් ක්‍රියාවලට ඍජුව හා වක්‍රව මැදිහත් වී සිටින මෙම නිලධාරියා ගැන පොලිස් ස්ථානාධිපතිවරුන් රැසක්ම සිටිනුයේ බරපතළ අප්‍රසාදයකිනි. ඔවුන් පවසන්නේ මෙම නිලධාරියාගේ නිවස ඉදිකිරීමට හා වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ව්‍යාපාරිකයන් ඉදිරියේ ඇප වූ තමන්ට දැන් බරපතළ ප්‍රශ්නයක් මතුව තිබෙන බවය.

# ළමා අපචාර වළක්වා ගන්න හොරණම අවදියෙන්

■ ඉන්දික සංජීව විතාන-හොරණ

හොරණ මූලස්ථාන පොලිසිය මගින් සිය බල ප්‍රදේශය තුළ මෙම වසරේ ගෙවුණු මාස හයට ළමා අපචාර සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 142ක් පවත්වා ඇතැයි හොරණ පොලිසිය පවසයි.

හොරණ මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චින්තක පනාවලගේ උපදෙස් සහ මගපෙන්වීම මත කාන්තා සහ ළමා අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක සුමනලතා ලියනගේගේ මෙහෙයවීමෙන් මෙම වැඩසටහන් පැවැත්වුණි.

මේ යටතේ දරුවන්ගේ ආරක්ෂාව, රිය අනතුරු, ළමා අපයෝජනය ආදි කරුණු සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කළ අතර විශේෂයෙන් පාසල්, දහම් පාසල්, රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන ආදිය කේන්ද්‍ර කරගෙන මෙම වැඩසටහන් සංවිධානය කර තිබිණ.

පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ගෙවුණු හය මසක කාලය තුළ ළමා අපචාර විශාල වශයෙන් අඩුවක් දක්නට ලැබුණු බවත් මෙහිදී බොහෝ ප්‍රශ්නවලට හේතුව ලෙස අනාවරණය වී ඇත්තේ දරුවන්ට ජංගම දුරකථන ලබාදීම බවත් අනාවරණය වී තිබේ.

# මහනුවර කොස් යායක් කරන්නට සැරසෙන එස්.අයි මහත්තයා



■ විජේරත්න හල්බලුව-හාරිස්පත්තුව

උප පොලිස් පරීක්ෂක චන්ද්‍රලාල් මහනුවර පොලිස් සේවාස්ථ පුහුණු ඒකකයට අනයුක්තව සේවය කරන නිලධාරියෙකි. මේ නිලධාරියාගේ ඒකායන අරමුණ මහනුවර දිස්ත්‍රික්කය පුරා කොස් පැළ ලක්ෂයක් සිටුවීමය. කඩුගන්නාව කුරුකුත්තල පදිංචි උප පොලිස් පරීක්ෂක චන්ද්‍රලාල් මේ දවස්වල නිරතව සිටින්නේ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල්, වෙහෙර විහාර, ඇතුළු විවිධ ස්ථානවල කොස් පැළ රෝපණය කිරීමේ වැඩවලය.




රෝහිත චන්ද්‍රලාල් සඳහන් කරන්නේ තම ජීවිතයේ එකම බලාපොරොත්තුව මහනුවර දිස්ත්‍රික්කය එකම කොස් යායක් බවට පත් කිරීම බවය. තමන්ට දැනුම් තේරුම් ඇති ද පටන්ම උත්සාහ කළේ සමාජයට යම්කිසි සේවයක් ඉටුකිරීමට බවද ඔහු කියා සිටියේය.

උප පොලිස් පරීක්ෂක රෝහිත සමාජ සත්කාරක වැඩසටහන් ආරම්භ කළේ ලේ දන්දීමේ කඳවුරු සංවිධාන කරමිනි. ඔහු විසින් මේ දක්වා ලේ දන්දීම් කඳවුරු 70 ක් සංවිධාන කර ඇත. ඒවායෙන් ලේ දන් දුන් පුද්ගලයන් දහසකට වැඩිය. ඒ කාලයේදී ලේ දන්දුන් පරිත්‍යාගශීලීන් වෙත තමන් විසින් පරිත්‍යාග කළ කොස් පැළවල දැන් ගෙඩිත් හටගන්නා බව ඔහු කීවේ නිහතමානී අභිමානයකිනි.

කොස් පැළ ලක්ෂක් සිටුවීමේ වැඩ සටහන ක්‍රියාවට නංවමින් සිටින ඔහු මේ වන විට කටුගස්තොට ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන බලනගල පොත්ගුල් විහාරය,උඩතලවින්න රතනජෝති විද්‍යාලය,පොල්ගොල්ල කුල්ලකොටුව නන්දාරාම විහාරය, පූජාපිටිය වටගොඩ පුරාණ විහාරය ,පන්විල ලුණුකැටිය මඩිත්ත පුරාණ විහාරය ආදි ස්ථානවලදී කොස් පැළ බෙද දීම සිදුකර තිබේ.

ඔබගේ ගමේ නගරයේ පොලිසියෙන් සිදුවන අසාධාරණකම් මෙන්ම පොලිස් නිලධාරීන්ගේ රටම නොදකින හොඳ නරක අපට ලියන්න කියන්න.
අරුණ RIB, අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
011-5978984
aruna.editor@liberty.lk

# අරුණ වාණිජ ලෝකය

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වත්තේගමට



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් - සිය වත්තේගම පාරිභෝගික සේවා නියෝජිත කාර්යාලය (Agency Business Development Center) පසුගියද අංක 73/සී මහනුවර පාර, වත්තේගම යන ස්ථානයේදී විවෘත කරයි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය නියෝජනය කරමින් ලලිත් ද සිල්වා මහතා ප්‍රධානි බෙදහැරීම් (සාමාන්‍ය රක්ෂණ), ජගත් වෙල්ගම මහතා සහකාර සාමාන්‍ය අධිකාරී/ප්‍රධානි ජාතික විකුණුම් (ජීවිත), ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දිගන ශාඛාවේ කාර්ය මණ්ඩලයද, එම ප්‍රදේශයේ සම්භාවනීය ආරාධිත අමුත්තන් සහ පාරිභෝගිකයන් සහභාගි විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පාරිභෝගික සේවා නියෝජිත කාර්යාල (Agency Business Development Center) තුළින් පාරිභෝගිකයන්ට තවදුරටත් සමීපවෙමින් තම සේවා සැපයීමට අවස්ථාව සැලසෙන අතර, ඔවුන්ගේ සියලුම රක්ෂණ අවශ්‍යතාවන් පහසුවෙන් සහ වේගවත්ව සපුරා දීමට කටයුතු කරයි.

## Hayleys Aventura වෙතින් සන්නාම සමුළුවක්



ප්‍රමුඛ පෙළේ කාර්මික විසඳුම් සැපයුම්කරුවකු වන Hayleys Aventura ආයතනය ඔවුන්ගේ අන්තර්ජාතික මට්ටමේ නිෂ්පාදන නවෝත්පාදනයන් පිළිබඳව අවබෝධය බෙදාගැනීම වෙනුවෙන් ලෝකයේ වඩාත්ම කීර්තිමත් කාර්මික සන්නාම සහ ඔවුන්ගේ ඉහළ කළමනාකාරිත්වයද එකතු කරගනිමින් සංවිධානය කරන ලද සන්නාම සමුළුව පසුගියද සාර්ථකව පවත්වන ලදී.

Hyster (ඇමරිකා එක්සත් ජනපදය), Prestar (මැලේසියාව), Suzhou Asia Fuji (චීනය), Goodpack (සිංගප්පූරුව), A & D (ජපානය), A-Safe (එක්සත් රාජධානිය) සහ මෑතකදී එක් වූ Avery Weigh-Tronix (එක්සත් රාජධානිය) ආදී ගෝලීය වශයෙන් කීර්තිමත් ප්‍රමුඛ පෙළේ සන්නාම රැසක් මේ සඳහා Hayleys Aventura සමග අත්වැල් බැඳගෙන තිබිණි.

මෙම සන්නාම සමුළුවේදී ප්‍රදර්ශනයට තබා තිබුණු නිෂ්පාදන හරහා තාක්ෂණික සැසි සහ ක්‍රියාකාරකම් සමග බාධාවකින් තොරව එකතු වීමට අවස්ථාව ලබා දුන් අතර එමගින් සහභාගීවන්නන්ට එම විසඳුම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට සුවිශේෂී අවස්ථාවක් ලැබිණි.

## ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමය දශක හයක විශිෂ්ටත්වය සමරයි




1956 දී Pfizer - Dumex Ltd ඖෂධ නිෂ්පාදන අංශයට පිවිසීමත් සමගම ශ්‍රී ලංකාව බටහිර ඖෂධ කර්මාන්තයට දැවැන්ත පිම්මක් ලබා ගත්තේය. මෙම තීරණාත්මක පියවර ඖෂධ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව සාර්ථකත්වය දක්වා යන ගමනක ආරම්භය සනිටුහන් කළේය. ඖෂධ නිෂ්පාදන සමාගම් වන GlaxoAllenburys (Ceylon) Ltd, Reckitt & Coleman (Ceylon) Ltd, M.S.J. Industries (Ceylon) Ltd , Pfizer -Dumex Ltd සහ Warner-Hudnut (Lanka) Ltd ලංකා වාණිජ මණ්ඩලයේ අනුග්‍රහය යටතේ 1963 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමය (SLPMA) ආරම්භ කරන ලදී. එතැන් පටන් Reckitt & Coleman (Ceylon) Ltd ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනය නවතා දමන ලදී. Pfizer -Dumex Ltd සහ Warner-Hudnut (Lanka) Ltd හි අනුප්‍රාප්තිකයන් වන M.S.J Industries (Ceylon) Ltd හි විදේශීය කොටස් හිමියන් විසින්, ශ්‍රී ලාංකේය සමාගම් වෙත ඔවුන්ගේ අවශ්‍යතා බෙදාහරින අතර, ඒවා දැන් Morison Limited, Astron Ltd. & Gamma Interpharm (Pvt) Ltd ලෙස හැඳින්වේ. SLPMA දශක හයකට වැඩි කාලයක් ජාතික ඖෂධ සුරක්ෂිතතාව සඳහා විශිෂ්ට මෙහෙවරක් ඉටු කරමින් සිටී.

## 'The Scale-Up Shop' වැඩසටහන් සඳහා අයැදුම්පත් විවෘතවේ



ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ අපනයන ක්ෂේත්‍රයේ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන දිවෙන ව්‍යාපෘතියේ මුලපිරීමක් ලෙස සකස් වූ 'The Scale-Up Shop' එහි කිරීම වැඩසටහන් සඳහා අයැදුම්පත් විවෘත කිරීම පිළිබඳව අප ඉතා සතුටින් දැනුම් දෙමු. මෙම වැඩසටහන යුරෝපා සංගමය (EU) සහ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධනය සඳහා වූ ජර්මානු ෆෙඩරල් අමාත්‍යාංශය (German Federal Ministry for Economic Cooperation and Development)-(BMZ) සම - මූල්‍ය දායකත්වය දරමින් එකාබද්ධව සහ (Deutsche Gesellschaft f r Internationale Zusammenarbeit GmbH) (GIZ), Ceylon Chamber of Commerce, Dilmah Tea සහ National Innovation Agency (NIA) සහයෝගීතාවෙන් ක්‍රියාත්මක කරන ලද 'කාබනික කෘෂිකර්ම අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහාය' (Support to Small and Medium Enterprises in the Organic Agriculture Sector) වැඩසටහනේ කොටසක් ලෙස ක්‍රියාත්මක වේ.


## මහජන බැංකුවේ 62 වැනි සංවත්සරයට ලේ දන්දීමේ කඳවුරක්



මහජන බැංකුවේ 62 වැනි සංවත්සරය නිමිති කරගනිමින් පැවැති ලේ දන්දීමේ කඳවුර කොළඹ 02, මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලයීය ආපන ශාලාවේදී පසුගියද පැවැත්විණි.

මහජන බැංකුවේ සුබසාධක දෙපාර්තමේන්තුව සංවිධානය කළ මෙම ලේ දන්දීමේ කඳවුරේදී බැංකු කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් ලේ පරිත්‍යාග කළ අතර, මේ අවස්ථාවට මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරිනි/ සාමාන්‍යාධිකාරිනි රේණුකා ජයසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (බැංකු සහාය සේවා) නිපුණිකා විජේරත්න, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) කේ.ඒ නිහාල් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (සුබසාධන සහ සේවක ණය) අජිත් රත්නායක යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

## DFCC බැංකුවෙන් දැයේ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක්




DFCC බැංකුව රටේ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් වීම සඳහා 'DFCC Read the Way' නමින් විශේෂ වැඩසටහනක් ආරම්භ කර තිබේ.

ආර්ථික ගැටලු ඇතුළු විවිධ අභියෝග නිසා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීම දුෂ්කර වී ඇති දරුවන්ට පොත්පත් පරිත්‍යාග කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. මෙමගින් දරුවන්ට කියවීම හුරුකරවමින්, අනාගතයේදී සාර්ථක පුරවැසියන් සහ නායකයන් බවට පත්වීමට අවශ්‍ය මගපෙන්වීම ඔවුන් වෙත ලබාදීම DFCC බැංකුවේ පරමාර්ථය වී ඇත.

අධ්‍යාපනය යනු සිය 2030 තිරසාර සංවර්ධන ක්‍රමෝපායෙහි ඉදිරි දැක්ම තුළ DFCC බැංකුව අවධානය යොමුකරන ප්‍රධාන අංශ 6 අතරින් එකකි. අධ්‍යාපනයට අමතරව මෙම මෙහෙවර යටතේ DFCC බැංකුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, පරිසරය, ශරීර සුවතාව, ආපදා සහන සහ ව්‍යවසායකත්වය යන අංශ කෙරෙහි අවධානය යොමුකරයි.

'අභියෝගවලට මුහුණ දිය හැකි ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම' යන තිරසාරත්ව අරමුණ යටතේ මෙම අංශ 6 ට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක වේ. මේ යටතේ DFCC Read the Way වැඩසටහන අමතරව 'DFCC සැමට ඉංග්‍රීසි' සහ Caritas Sri Lanka - SEDEC සමග එක්ව හඳුන්වා දුන් 'DFCC අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන' වැනි වැඩසටහන්ද DFCC බැංකුව මගින් ක්‍රියාවට නංවා ඇත.

## නෙස්ලේ ලංකා සංවිධානය කළ පාසල් පෝස්ටර් චිත්‍ර තරගය නිමවෙයි



'මිහිතලයේ යහපැවැත්ම වෙනුවෙන් සිත්තමක මෙහෙවර' නමින් නෙස්ලේ ලංකා සමාගම සංවිධානය කළ සමස්ත ලංකා පාසල් පෝස්ටර් චිත්‍ර තරගය පසුගියද සාර්ථකව අවසන් වූ අතර, කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ කාණ්ඩවල ජයග්‍රාහකයන්ට සම්මාන පිරිනැමීමද සිදුවිය. ලෝක පරිසර දිනය නිමිත්තෙන් මාස දෙකක් පුරාවට පැවැති මෙම තරගය, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ දායකත්වය හිමි පාසල් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනේ දෙවැනි අදියර ලෙස සංවිධානය කර තිබිණි. කලාප, පළාත් සහ සමස්ත ලංකා යන වට තුනක් යටතේ පැවැති තරගයට දිවයිනේ සියලු ප්‍රදේශ නියෝජනය කරමින් 60,000කට වැඩි නිර්මාණ ප්‍රමාණයක් ලැබී තිබීම විශේෂත්වයකි.

"ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය අවම කිරීමට අපි දැඩි සේ කැපවී සිටිනවා. ඒ වෙනුවෙන්, අපගේ ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හෝ නැවත භාවිත කළ හැකි අයුරින් නිර්මාණය කිරීමටත්, අපද්‍රව්‍ය වෙන් කිරීම සහ එකතු කිරීම ශක්තිමත් කිරීමටත්, අපි අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්නවා. රටේ තිරසර සංවර්ධනය සහතික කරමින් අනාගත පරපුර තුළ යහපත් පුරුදු ඇති කරන පාසල් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන එම ගමනේ වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකියි. '' යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ බර්නාඩ් ස්ටෙෆාන් මහතා පැවසීය.

## කොමර්ෂල් බැංකුව 'ඒෂියාමනි' සම්මානය දිනයි

කොමර්ෂල් බැංකුව, එක්සත් රාජධානියේ ප්‍රකාශිත කීර්තිමත් 'ඒෂියාමනි' සඟරාව විසින් 'ශ්‍රී ලංකාවේ ඩිජිටල් විසඳුම් සඳහා හොඳම බැංකුව' ලෙස සම්මානයට පාත්‍ර වී ඇති අතර මෙයින් ඩිජිටල් නවෝත්පාදනයේ මෙරට ප්‍රමුඛයා ලෙස බැංකුවේ ස්ථාවරය යළිත් තහවුරු වී ඇත.

බැංකුව මෙම සම්මානය දිනාගත්තේ ඩිජිටල් බැංකුකරණ විසඳුම් සහ ව්‍යාපාර සඳහා පරිසර පද්ධති සංවර්ධනය කිරීමෙන් වෙළෙඳපොළ නායකත්වය ශක්තිමත් කිරීම උදෙසාය. එය ඩිජිටල් බැංකුකරණ යෙදුම් භාවිත කරන ගනුදෙනුකරුවන්ගේ වර්ධනයත්, නව ඩිජිටල් සේවාවන් සාර්ථක ලෙස එළිදැක්වීම මගින් සනාථ කර ඇති අතර, එම ගනුදෙනුකරුවන්ගේ ඉහළ තෘප්තියද සාක්ෂි මගින් පෙන්වා දී ඇත. ජංගම යෙදුම් නව්‍යකරණය සහ දේශීය ඩිජිටල් ව්‍යාපාර සමග උපාය මාර්ගික සන්ධානයන් පිහිටුවීමද එහිදී ප්‍රමුඛත්වයක් ගෙන ඇත.

මෙම සම්මානය පිළිබඳව අදහස් දක්වමින් කොමර්ෂල් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී සනත් මනතුංග මහතා ප්‍රකාශ කළේ, 'ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ඩිජිටල් නවෝත්පාදනයේ ප්‍රමුඛයා ලෙස කොමර්ෂල් බැංකුව පිළිගැනීම ගැන ආඩම්බර වෙමු. අපගේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන්, තාක්ෂණය සහ නවෝත්පාදන තුළින් විශිෂ්ටත්වය ළඟාකර ගැනීමට අපගේ කැපවීම පිළිබිඹු කරනු ලබයි.' යනුවෙනි.

වසරේ හොඳම කාල හිමි

# ලොව සහය දිවීමේ කණ්ඩායම් අතර ශ්‍රී ලංකාවට දෙවැනි තැන



මෙම වසරේ ලෝක මලල ක්‍රීඩා තරගවාරයේ මීටර 400x4 පිරිමි සහය දිවීමේ ඉසව්වේ කණ්ඩායම් වාර්තා කළ කාල අතර ලොව දෙවැනි තැනට පත්වන්නට ශ්‍රී ලංකා මීටර 400x4 පිරිමි සහය දිවීමේ කණ්ඩායම සමත්ව සිටී.

ඒ පෙරේද (16 වැනිදා) තායිලන්තයේ පැවැති ආසියානු මලල ක්‍රීඩා ශූරතාවේදී ශ්‍රී ලංකා පිරිමි සහය දිවීමේ කණ්ඩායම දැක්වූ දක්ෂතා හේතුවෙනි.

මෙහිදී ශ්‍රී ලංකාව මිනිත්තු 3.51.06ක දක්ෂතාවක් වාර්තා කර තිබේ. මෙම කාලය හොඳම කාල අතරින් 10 වැනි ස්ථානයේ පසුවන අතර පළමු ස්ථානය ෆ්ලෝරිඩා සහය දිවීමේ සංචිතයට හිමිව තිබේ. දක්ෂතා හි මුල් ස්ථාන 10 අතරින් දෙකම බලය ඇමරිකානු සහය දිවීමේ කණ්ඩායමට හිමිව තිබේ. ශ්‍රී ලංකාව ඉතාලිය සහ බ්‍රිතාන්‍ය කණ්ඩායම් අභිබවා මෙම දස්කම දක්වා තිබීම කැපී පෙනේ.

එළැඹෙන අගෝස්තු මාසයේදී හංගේරියාවේ බුඩාපෙස්ට් හි පැවැත්වීමට නියමිත ලෝක මලල ක්‍රීඩා ශූරතාවේ සුදුසුකම් ලැබීමේ දින වකවානු ලබන ජූලි 31 වැනිදා අවසන් වීමට නියමිත අතර ඒ වනවිට ශ්‍රී ලංකා සහය දිවීමේ කණ්ඩායමට මුල් ස්ථාන 16හි රැඳී සිටීමේ අවස්ථාව හිමිවුවහොත් ඔවුන්ට ලෝක ශූරතා වරම් හිමිවනු ඇත.

# ෂකීල් සහ සල්මාන් ලංකාවට වදයක් වෙති



ටෙස්ට් ලෝක ශූරතාව යටතේ පැවැත්වෙන සංචාරක පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර ටෙස්ට් තරගාවලියේ පළමු තරගයේ දෙවැනි දිනය සඳහා වර්ෂාව හේතුවෙන් තරගය නවතන විට සිය පළමු ඉනිම ක්‍රීඩා කරමින් සිටින පාකිස්තානය පන්දුවාර 45කදී කඩුලු 5ක් දැවී ලකුණු 221ක් රැස් කරගෙන සිටියේය.

නොදැවී කඩුල්ලේ රැඳී සිටින සවුඩ් ෂකීල් සහ අගා සල්මාන් පිළිවෙළින් ලකුණු 69ක් සහ ලකුණු 61ක් ලබා සිටියේය.

කඩුලු 6ක් දැවී ලකුණු 242ක් ලබා සිටියදී දිනය ඇරැඹූ ශ්‍රී ලංකා ඉනිමේ ගැලවුම්කරු වූ ධනංජය ද සිල්වා සිය ටෙස්ට් ක්‍රිකට් දිවියේ 10 වැනි ශතකය වාර්තා කළේය. එය ගාල්ල ක්‍රීඩාංගණයේදී ඔහු වාර්තා කළ 3 වැනි ශතකය ලෙසින් වාර්තා පොත් අතරට එක්විය. එය ඔහුගේ 50 වැනි ටෙස්ට් තරගය වීමද විශේෂත්වයකි.

ධනංජය අන්තයක හුදකලා වෙද්දී සෙසු කඩුලු සියල්ලම මුළු ලකුණු 321කට සීමා කරමින් දවා ගන්නට පාකිස්තාන පන්දු යවන්නෝ සමත් වූහ.

පන්දු යැවීමේදී පාකිස්තානයේ ෂහීන් ෂා අෆ්‍රිඩි, නසීම් ෂාහ් සහ අබ්‍රාර් අහමඩ් අතරේ කඩුලු 3 බැගින් බෙදී ගියේය. දිනය පුරා කඩින් කඩ වර්ෂාවෙන් එල්ල වූ බාධා මැද සිය ප්‍රථම ඉනිම සඳහා පිටියට පිවිසි පාකිස්තාන ඉනිමේ පළමු කඩුල්ල ලකුණු 3කට සීමා කරන්නට කසුන් රාජිත සමත් විය. ඒ අනුව එක් ලකුණක් ලබා සිටි ඉමාම් උල් හක් අතිරේක ක්‍රීඩක කමිඳු මෙන්ඩිස් අතට උඩ පන්දුවක් ලබාදීමෙන් දැවී ගියේය. අනතුරුව පිටියට පිවිසි පාකිස්තානය ආරම්භක පිතිකරුවන්ට රිසි සේ පන්දුවට පහර දෙමින් කඩුල්ලේ රැඳී සිටින්නට ශ්‍රී ලංකා පන්දු යවන්නෝ ඉඩ ලබා නොදුන්හ.

ඒ අවසරයෙන් පාකිස්තාන ලකුණු පුවරුවේ මුළු ලකුණු 101ක් වනවිට මුල් කඩුලු 5ක්ම ක්‍රීඩාගාරය වෙත හරවා යැවිණි. පාකිස්තාන මුල්පෙළ විසුණු කළ ප්‍රභාත් ජයසූරිය දිනය නිමාවන විට ලකුණු 83කට කඩුලු 3ක් බිඳ හෙළූ අතර කසුන් රාජිත සහ රමේෂ් මෙන්ඩිස් අතරේ එක් කඩුල්ල බැගින් බෙදී ගියේය.

අද (18 වැනිදා) තරගයේ 3වැනි දිනයයි.

## ලංකාවේ ඉරණම ඇෆ්ගනිස්ථානය සහ ඕමානය අත

ආසියානු නැගී එන ක්‍රිකට් කුසලානය යටතේ ශ්‍රී ලංකා කණ්ඩායම සහභාගී වන පළමු වටයේ අවසන් තරගය අද (18 වැනිදා) පස්වරු 2.00ට ඕමානය සමගින් කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී දිවා රාත්‍රී තරගයක් ලෙස පැවැත්වීමට නියමිතය.


ශ්‍රී ලංකා කණ්ඩායමට අදාළ අවසන් පූර්ව වටය සඳහා සුදුසුකම් ලැබීමට නම් අද (18 වැනිදා) තරගය ඉහළ ලකුණු ලබා ගැනීමේ වේගයක් සහිතව ජය ගැනීම අනිවාර්ය වේ.

සත්කාරක ශ්‍රී ලංකා කණ්ඩායම මුහුණ දුන් පළමු තරගයෙන් බංග්ලාදේශය හමුවේ ජය ලැබීය. අනතුරුව ඇෆ්ගනිස්ථාන 'ඒ' කණ්ඩායමට එරෙහිව පැවැති තරගයෙන් ශ්‍රී ලංකා කණ්ඩායමට අනපේක්ෂිත පරාජයකට මුහුණ පෑමට සිදු විය. අදාළ පරාජයත් සමගින් පළමු වටයෙන්ම නැගී එන ආසියානු කුසලානයෙන් ඉවත්වීමේ අවදානමට, ශ්‍රී ලංකා කණ්ඩායම මුහුණ දී ඇති අතර ශූරතා බලාපොරොත්තු තබා ගැනීමට නම් අද තරගය ජයග්‍රහණය කිරීම අනිවාර්ය වේ.

අද තරගය ශ්‍රී ලංකාව ජයග්‍රහණය කළත්, ශ්‍රී ලංකා කණ්ඩායමට අවසන් පූර්ව වටයට පිවිසීමට නම් අද උදෑසන පී. සරා ඕවල් ක්‍රීඩා පිටියේදී පැවැත්වෙන බංග්ලාදේශය සහ ඇෆ්ගනිස්ථානය අතර පැවැත්වෙන තරගයෙන් ඇෆ්ගනිස්ථානය ජයග්‍රහණය කළ යුතුය.

යම් හෙයකින් එම තරගය බංග්ලාදේශය ජයග්‍රහණය කළහොත් අවසන් පූර්ව වටයේ ප්‍රවේශය දළ ලකුණු වේගය මත තීරණය වනු ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළ ක්‍රීඩකයන් වැඩි පිරිසක් ඇතුළත්ව සිටින ශ්‍රී ලංකා කණ්ඩායමේ අවසන් පූර්ව වටයට පිවිසීම අද මධ්‍යම රාත්‍රිය වන විට විසඳී තිබෙනු ඇත.





# යන සල්ලි නවතා නැති සල්ලි හදන හැටි

## ක්‍රීඩා ඇමැති කියයි

■ ආර්.එෆ්.එම්. සුහෙල් - නුවරඑළිය

විදේශයන්හි පැවැත්වෙන තුරඟ තරගයන්ට ඔට්ටු අල්ලා දිනකට මෙරටින් ලක්ෂ ගණනින් මුදල් විදේශයන්ට ලබාදෙනු වෙනුවට නුවරඑළියේ තුරඟ තරග පවත්වා පිට රට මුදල් කෝටි ගණනින් මෙරටට ගෙන්වා ගැනීමට සැලසුම් කරන බව ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ නුවරඑළියේදී කියා සිටියේය.

අමාත්‍යවරයා ඒ බව කියා සිටියේ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් නුවරඑළිය තුරඟ තරග පිටිය ඇතුළුව ක්‍රීඩා සංකීර්ණය, ක්‍රීඩා පුහුණු පාසල, සංචාරක ප්‍රවර්ධන හෝටලය යනාදිය ඉදිකිරීමට වෙන්කර ඇති අක්කර අටක භූමි ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවට (16වැනිදා) එක් වීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ක්‍රීඩා අමාත්‍යවරයා 'මට කලින් පත්වුණු ක්‍රීඩා අමාත්‍යවරුන් රැසක් මෙම ක්‍රීඩා සංකීර්ණය සෑදීම සඳහා මුල්ගල් තබා ඇති නමුත් මා මෙයට මුල්ගල් තබනන්න සූදානම් නැහැ. මොකද දැන්මම ඒ කටයුතු සිදුවෙන්නේ නැති නිසා බැරි වැඩකට මුල්ගල් තියෙන එකෙන් වැඩක් නැහැ. මොකද රට වැටිල තියෙන අර්බුදකාරී තත්වයත් එක්ක සංවර්ධන කටයුතු කරන්න මෙවන් වූ විශාල ව්‍යාපෘතීන් දියත් කරන්න මුදල් නැහැ.

මට කලින් කටයුතු කළ සෑම අමාත්‍යවරයකුටම ක්‍රීඩා අමාත්‍යාංශය භාර දෙන විට අඩුම තරමින් බිලියන 500ක් වැනි විශාල මුදලකුත් එක්ක තමයි භාර දුන්නේ ඒත් මම භාර ගන්න විට අර්බුදයකුත් එක්ක 'එම්ටි පොකට්' තමයි භාරගත්තේ.

නුවරඑළියේ ක්‍රීඩා සංකීර්ණයකට අමතරව ක්‍රීඩා පුහුණු පාසලක් ආරම්භ කළ යුතු වනවා. ආසියාවටම හරි හැටි සියලුම ක්‍රීඩාවන් පුහුණු කිරීමට හැකි ක්‍රීඩා පුහුණු ආයතනයක් නැහැ. අපි ඒක හදන්න බලාපොරොත්තු වෙනවා නුවරඑළියේ. මේ එක්කම සංචාරක ව්‍යාපාරය ගොඩනගන්න සංචාරක හෝටලයක් සහ සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් මධ්‍යස්ථානයක්ද මේ තුළ ස්ථාපනය කරන්න බලාපොරොත්තු වෙනවා.

අක්කර අටක භූමි ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගන්න අවශ්‍යයි. මේ සඳහා විශාල ආයෝජනයක් සිදු කිරීමට අවශ්‍ය බැවින් අපි ආයෝජකයන් කිහිප දෙනකුටම ආරාධනා කරා මේ වැඩ කටයුත්ත සඳහා දායකත්වය ලබා දෙන්න කියලා. පිටරට ආයෝජකයන්ට ආරාධනා කරන්න කලින් මුලින්ම අපි ආරාධනා කළේ ලාංකීය ආයෝජකයන්ට මොකද අපේ සම්පත්වලින් සීයට සීයක් ප්‍රයෝජන ගත යුත්තේ අපේම අය නිසාවෙන්.' යැයි කියා සිටියේය.






## පැරා ලෝක ශූරතාවේදී දිනේෂ්ට ලෝකඩ පදක්කමක්

ප්‍රංශයේදී පැවැත්වෙන ලෝක ශූරතා පැරා මලල ක්‍රීඩා තරගාවලියේදී ලෝකඩ පදක්කමක් දිනා ගන්නට ශ්‍රී ලංකාවේ දිනේෂ් ප්‍රියන්ත හේරත් සමත් විය.

ඒ එෆ්-46 කාණ්ඩයේ පිරිමි හෙල්ල විසි කිරීමේ ඉසව්වේ තුන්වැනි ස්ථානය දිනා ගනිමිනි. මෙහිදී දිනේෂ් මීටර 65.38ක දක්ෂතාවක් දැක්වූයේය. එය දිනේෂ් මෙම තරගවාරයේදී දැක්වූ හොඳම දක්ෂතාව වේ. ඉසව්වේ ප්‍රථම ස්ථානය දිනූ ඉන්දියාවේ අජිත් සිං මීටර 65.41ක දක්ෂතාවක් දැක්වූ අතර එය දිනේෂ්ට වඩා සෙන්ටිමීටර 3ක් වැනි කුඩා ඉදිරියකි.

ඉසව්වේ රිදී පදක්කම ඉන්දියාවේ ම රින්කුට හිමිවූ අතර ඔහු සහ දිනේෂ් සම දක්ෂතා දක්වා තිබුණු නමුත් රින්කුගේ දෙවැනි හොඳම දක්ෂතාව දිනේෂ් ගේ දෙවැනි හොඳම දක්ෂතාව අභිබවා යෑම මත ඔහුට රිදී පදක්කම හිමිවිය.

දිනේෂ් නිමාවූ ටෝකියෝ පැරාලිම්පික් මලල ක්‍රීඩා උළෙලේදී මෙම ඉසව්වේ රන් පදක්කමද දිනා ගත්තේය.

## මධ්‍යම පළාත් පාසල් පිහිනුම් ශූරතා මහමායා හා ත්‍රිත්වට



බාලක ශූරතාවය ත්‍රිත්ව විද්‍යාලය



බාලිකා ශූරතාවය මහමායා බාලිකා විදුහල

■ ජානක එස්. බණ්ඩාර - කුණ්ඩසාලේ

මධ්‍යම පළාත් පාසල් පිහිනුම් තරගාවලියේ සමස්ත බාලක ශූරතාව දිනා ගන්නට මහනුවර ත්‍රිත්ව විද්‍යාලය සමත් වන අතරවාරයේදී එහි බාලිකා ශූරතාව මහනුවර මහමායා බාලිකා විද්‍යාලය විසින් දිනා ගන්නා ලදී.

දිගන පිහිටි මධ්‍යම පළාත් සභා ක්‍රීඩාංගණයේ පිහිනුම් තටාකයේදී ක්‍රියාත්මක වූ මෙම තරගාවලියේ සමස්ත බාලිකා ශූරතාව ලකුණු 838ක් ලබාගත් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයට හිමි වූ අතර, තරගාවලියේ බාලිකා අනුශූරතාව ලකුණු 475ක් හිමිකර ගත් මහනුවර හිල්වුඩ් බාලිකා විද්‍යාලය විසින් හිමිකර ගන්නා ලදී.

තරගාවලියේ සමස්ත බාලක ශූරතාව ලකුණු 755 ක් ලබා ගනිමින් මහනුවර ත්‍රිත්ව විද්‍යාලය දිනා ගන්නා ලද අතර, බාලක අනු ශූරතාව ලකුණු 575ක් ලබාගත් මහනුවර ධර්මරාජ විද්‍යාලයට හිමි විය.

වයස අවුරුදු 12න් පහළ, 14න් පහළ, 16න් පහළ, 18න් පහළ සහ වයස අවුරුදු 20 න් පහළ වයස් කාණ්ඩ නියෝජනය කරමින් තරග ඉසව් 124 ක් පවත්වන ලදී.

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සංවිධාන කරන ලද මෙම තරගාවලියේ සමාප්ති උළෙල සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ(පාලන) සී. මායාදුන්නේ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ක්‍රීඩා) අතුල ජයවර්ධන යන අය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## ලංකා සීනි ක්‍රිකට් ජය මූල්‍ය අංශය රසවිඳී



■ කැලුම් ගුණතිලක - මොනරාගල

ලංකා සීනි සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්ත ඒකකයේ සේවකයන්ගේ සහයෝගිතාව වර්ධනය කිරීම වෙනුවෙන් පැවැති සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට අදාළ මූල්‍ය අංශ කණ්ඩායම සමත් විය.

පැල්වත්ත ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පැවැති මෙම තරගාවලියේ අනුශූරතාව වගා ආරක්ෂක කණ්ඩායම විසින් දිනාගන්නා ලදී.

ලංකා සීනි සමාගම ප්‍රධාන විධායක නිලධාරි සමන් අමරකෝන් විසින් ජයග්‍රාහී කණ්ඩායමට ශූරතා කුසලානය පිරිනමනු ලැබීය.

## සවුදි යන්නේ නෑ, එංගලන්තෙම ඉන්නවා!



සුපිරි පාපන්දු ක්‍රීඩක සොන් හොන්-මින්ග් 2023/24 පාපන්දු තරගවාරයේදීත් ටොටෙන්හම් ස්පර්ස් කණ්ඩායම සමගින් ගිවිසුම්ගත වීමට තීරණය කර ඇත.

2021/22 තරගවාරයේදී ස්පර්ස් කණ්ඩායම නියෝජනය කරමින් ප්‍රිමියර් ලීග් පාපන්දු තරගාවලියේ දක්ෂතම ආක්‍රමණික ක්‍රීඩකයා බවට පත්වෙමින් රන් සපත්තුවද හිමි කරගැනීමට සොන්ට හැකියාව ලැබිණි. කෙසේ වෙතත් 2022/23 තරගවාරය සොන්ට එතරම්ම සාර්ථක තරගවාරයක් නොවුණු අතර මේ නිසා නව තරගවාරයේදී වෙනත් කණ්ඩායමක් සමගින් සොන් ගිවිසුම් ගත වේවිද යන ගැටලුව ප්‍රේක්ෂකයන් රැසකට පැන නැගී තිබිණි.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් සොන් පවසා තිබුණේ තමාට අවශ්‍යනම් තමාගේ පාපන්දු දිවියේ ඉදිරි කාලය සෞදි අරාබියානු ක්‍රීඩා සමාජයක ගත කළ හැකිව තිබුණත් තමන් එංගලන්ත ප්‍රිමියර් ලීගයේ ස්පර්ස් කණ්ඩායම සමගින් සිටීමට වඩාත් වැඩි ප්‍රියතාවක් දක්වන බවටයි.

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින් මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# බස්නාහිර කුණුවලින් මෙට්‍රික් ටොන් 800 ක් තවම මුදාහරින්නේ පරිසරයට

■ සාලිය කුමාර ගුණසේකර

බස්නාහිර පළාතේ දෛනිකව එකතු වන කසළවලින් මෙට්‍රික් ටොන් 800 ක් පමණ තවමත් විවෘත පරිසරයට බැහැර කෙරෙන බව බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ නලින් මාන්නප්පෙරුම පැවසීය.

බස්නාහිර පළාත තුළ දෛනිකව ඉවතලන ආහාර, පොලිතින්, ප්ලාස්ටික් ඇතුළු විවිධ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1800 ත් 1900 ත් අතර ප්‍රමාණයක් එකතු වන බවත්, පළාත් පාලන ආයතනවලින් කසළ එකතු කළද, සමස්ත කසළ ප්‍රමාණයෙන් සියයට 45 ක් එනම් මෙට්‍රික් ටොන් 700 ත් 800 ත් අතර ප්‍රමාණයක් තවමත් විවෘත පරිසරයට බැහැර කෙරෙන බවත් අධ්‍යක්ෂවරයා කීවේය.

බස්නාහිර පළාතේ එකතු වන කසළවලින් තවමත් ප්‍රතිචක්‍රීයකරණය කෙරෙන්නේ කසළවලින් සියයට එකක ප්‍රතිශතයක් (1%) පමණක් බවද, දෛනිකව එකතුවන පොලිතින් ප්ලාස්ටික් වලින් ප්‍රතිචක්‍රීයකරණය කෙරෙන්නේ සියයට හතරක් (4%) පමණක් බවත්, ඉතිරි සියයට 96 ම අවභාවිත වන බවද අධ්‍යක්ෂවරයා පැවසීය.

කසළවලින් බලශක්තිය නිපදවීමේ විශාල ව්‍යාපෘතියක දැඩි අවශ්‍යතාව පවතින බවද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනතෙක් පොලිතින්, ප්ලාස්ටික් විවෘත පරිසරයට බැහැර නොකිරීමට ජනතාව අවධානය යොමුකළ යුතුව ඇතැයිද ඔහු කීවේය.

විවෘත පරිසරයට පොලිතින් ප්ලාස්ටික් බැහැර කිරීම අවම කිරීමට බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත්, නිවාසවලදීම පොලිතින් ප්ලාස්ටික් වෙන් කරනු ලබන්නේ නම් ඒවා එකතු කිරීමට බස්නාහිර පළාත් සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් "හරිත බළකායක්" පිහිටුවා තිබෙන බවත් අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

මෙම බළකායට දැනට 200 ක පමණ පිරිසක් සම්බන්ධවී සිටින බවත්, එම කණ්ඩායම 1000 ක් දක්වා වැඩිකර ගැනීමට බලාපොරොත්තු වන බවත් ඔහු කීවේය.

මෙම පිරිස එකතු කරන පොලිතින් ප්ලාස්ටික් පිරිසිදු කර ප්‍රතිචක්‍රීයකරණ සමාගම්වලට ලබාදෙන බවත්, එම කණ්ඩායම සමාජයේ වැදගත් කර්තව්‍යයක් ඉටු කරන බවත් අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් කියා සිටියේය.

## ▶▶ 01 වැනි පිටුවෙන්...

## වතුර පිට යවන...

ඉදිරියේ නියං තත්ත්වයක් ඇතිවන බවට කාලගුණික අංශ විසින් අනාවැකි පළකර තිබෙන බවත්, වගා කටයුතු සඳහා වාරි අංශ විසින් ජලය නිකුත් කිරීමෙන් පසුවද ඇතැම් ගොවීන් එම ජලය වගා බිම්වලට නොයොදා නාස්ති කිරීම නිසා නිකරුණේ විශාල ජල ධාරිතාවක් මුහුදට ගලා යන බවත් කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසීය.

ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රයේදී ඊයේ (17 වැනිදා) පැවැති මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා මේ බව පැවසීය. මෙම මාධ්‍ය හමුවට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස අමරසිංහ, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පී.මාලතී, ගොවිජන කොමසාරිස් ජනරාල් ඒ.එච්.එම්.එල්. අබේරත්න ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

ජලය නාස්ති කරන ගොවීන්ට රජයෙන් සහන ලබා නොදීමට ඉදිරියේදී කටයුතු කරන බවද, ජල නාස්තිය අවම කිරීම සඳහා මෙම තීරණය ගන්නා බවද ඇමැතිවරයා කීවේය.

ඉදිරියේදී යම් නියං තත්ත්වයක් ඇති වුවහොත් ඊට මුහුණ දෙන ආකාරය සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා ආරම්භ කර ඇති බවත්, අඩු ජල ප්‍රමාණයකින් වගා කටයුතු කිරීම සම්බන්ධවද කෘෂිකර්ම අමාත්‍යාංශය අවධානය යොමුකර තිබෙන බවත් ඇමැතිවරයා වැඩිදුරටත් පැවසීය.

## දොස්තරලා නැතුව...

තවත් වෛද්‍යවරියක් සහ වෛද්‍යවරයෙක් අසනීප වී ලෙඩ නිවාඩු දමා ඇත.

වෛද්‍යවරුන් සිවුදෙනකුගේ සේවය දින 9ක් පුරා දිවා රාත්‍රී නොකඩවා සිදුකළ ප්‍රධාන වෛද්‍ය රංජිත් දිසානායකද අසනීප වී පෙරේදා (16 වැනිදා) නාගොඩ රෝහලට ඇතුළත් කර තිබේ.

මේ නිසා බාහිර රෝගී අංශයේ පමණක් වෛද්‍ය ප්‍රතිකාර සිදුකරන අතර නේවාසික ප්‍රතිකාර නතර කිරීමට සිදුව ඇත.

මේ පිළිබඳව කළ විමසීමකදී කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය රසාංජලී හෙට්ටිආරච්චි ප්‍රකාශ කළේ තාවකාලිකව මෙම රෝහලේ නේවාසික ප්‍රතිකාර නතර කළ බවය.

කෙසේ වෙතත් මෙම රෝහලේ දිනකට රෝගීන් 15ත් 25ත් අතර ප්‍රමාණයක් නේවාසිකව ප්‍රතිකාර ලබන අතර බාහිර රෝගී අංශයේ දිනකට රෝගීන් 150ක් පමණ ප්‍රතිකාර ලබන බව පැවසේ.

## ඇක්සිඩන්ට් ලෙඩාගේ...

මුල්ලේරියාව පොලිසිය මෙලෙස අත්අඩංගුවට ගත්තේ කඩුවෙල, වැලිවිට පදිංචි සමීර අසංක කුරේ නමැති සැකකරුවකි.

රිය අනතුරට මුහුණ පෑ 61 හැවිරිදි ක්‍රිස්ටි අශෝක පීරිස් නමැති අයගේ බිරිඳ වන අංගොඩ, කොහිලවත්ත පදිංචි උදයංගනී රම්‍යලතා පෙරේරා මුල්ලේරියාව පොලිසියට මේ පිළිබඳ පැමිණිල්ල ඉදිරිපත් කර තිබිණි.

තුවාලකරු මේ වන විට කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබන බව පොලිසිය කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයට දන්වා සිටියේය. අනතුරින් තුවාල ලැබූ පුද්ගලයා රෝහල්ගත කිරීමට රැගෙන ගිය අය මෙලෙස පසුම්බිය සොරකම් කර ඇති බවද පොලිසිය අධිකරණයට දන්වා සිටියේය. මුල්ලේරියාව පෞද්ගලික බැංකුවක් අසලදී මෙම අනතුර සිදුව තිබේ. ඔහුගේ පසුම්බියේ රුපියල් විසිදහසක (20,000) මුදලක් සහ බැංකු කාඩ්පත්, රියැදුරු බලපත්‍රය සහ ජාතික හැඳුනුම්පතද තිබී ඇතැයි පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

සැකකරු අදාළ බැංකු කාඩ්පත් භාවිත කරමින් ප්‍රධාන පෙළේ නිමි ඇඳුම්සලකින් රුපියල් 25,000ක් වටිනා ඇඳුම් මිලදීගෙන ඇති බවත්, රුපියල් 7000ක ඉන්ධන ලබාගෙන ඇති බවත් දන්වා සිටි පොලිසිය ඊට අමතරව සුපිරි වෙළෙඳසල් දෙකකින් රුපියල් 5000කට ආසන්න ආහාරපාන මිලදීගෙන ඇති බවද දන්වා සිටියේය.

## රාජ්‍ය සේවකයන්ගේ...

එම සංශෝධන කැබිනට් මණ්ඩලයට ඊයේ (17 වැනිදා) ඉදිරිපත් කිරීමට නියමිත විය.

ඒ අනුව ස්ථාන මාරු ලබන රජයේ නිලධාරීන්ට සුදුසු පාසලක් ලබා දීමට හැකි වන බව මේ සම්බන්ධයෙන් අප කළ විමසුමකට පිළිතුරු දුන් අධ්‍යාපන ඇමැති ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත පැවසීය.

එම නිලධාරීන් ද අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය අනුව සුදුසු පාසල් තුනකටවත් අයැදුම් කළ යුතු වන බවත් එම පාසල්වලින් පවත්වන සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටිය යුතු වන බවත් කී ඇමැතිවරයා එම ක්‍රියාවලියෙන් පිටස්තරව සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාව නොමැති බවත් සඳහන් කළේය.

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board

ඉරිදා 2023.07.16 ශීඝ්‍ර ප්‍රතිඵල www.nlb.lk

මහජන සම්පත — දිනුම් වාරය : 5177 — ඊළඟ දිනුම් වාරයේ සුපිරි ජයමලය රු. 22,819,376.00 — ජයග්‍රාහී අක්ෂරය U — ජයග්‍රාහී අංක 8 7 1 2 1 8

ගොවිසෙත — දිනුම් වාරය 3419 — ඊළඟ දිනුම් වාරයේ සුපිරි ජයමලය රු. 69,412,095.60 — ඉංග්‍රීසි අක්ෂරය T — ජයග්‍රාහී අංක 49 67 74 80

Lucky 7 — දිනුම් වාරය 0003 — ජයග්‍රාහී අංක 6 7 3 5 5 3 — L7 අංක 3 8 — ඊළඟ දිනුම් වාරයේ සුපිරි ජයමලය රු. 10,000,000.00

ධන නිධානය — ඊළඟ දිනුම් වාරයේ සුපිරි ජයමලය රු. 100,119,604.80 — ඉංග්‍රීසි අක්ෂරය W — ජයග්‍රාහී අංක 22 28 40 41 — විශේෂ අක්ෂරය W

හඳහන — දිනුම් වාරය 486 — ඊළඟ දිනුම් වාරයේ සුපිරි ජයමලය රු. 3,361,188.60 — ජයග්‍රාහී අංක 11 20 43 58

Mega Power — දිනුම් වාරය 1525 — Rs.401,383,528.00 — රු. 10,000,000.00 — රු. 10,000,000.00 — Y 17 08 37 77 79

## ▶▶ 01 වැනි පිටුවෙන්...

## තුන්දාහේ බුෂ් එක...



සිද්ධිය වූ අවස්ථාව

පොස්පේට් රාජ්‍ය සමාගමට පැමිණි රාජ්‍ය ඇමැතිවරයාට තේ පැන් සංග්‍රහයක් පිළිගැන්වීමෙන් අනතුරුව නිරීක්ෂණ චාරිකාවක යෙදුනේය. එහිදී සේවකයන් ඇමැතිවරයාට කියා සිටියේ ආයතනයට අවශ්‍ය නොවන වර්ගයේ ඇඹරුම් යන්ත්‍ර අමතර කොටසක් (ගියර් බොක්ස් එකක්) ගෙන්වීමෙන් ආයතනයට රුපියල් ලක්ෂ ගණනක පාඩුවක් සිදුව ඇති බවය. අදාළ අමතර කොටස භාවිතයට ගත නොහැකි බැවින් නැවත මාරු කිරීමටද කටයුතු කර නැති බවද සේවකයන් රාජ්‍ය ඇමැතිවරයාට පැවසූහ.

අදාළ අමතර කොටස ඇණවුම් කළ සැපයුම් නිලධාරියා එම ස්ථානයට කැඳවන ලෙස එහිදී ඇමැතිවරයා දැනුම් දුන්නේය. වැඩ කරන්න බැරි අමතර කොටසක් මිලදී ගත්තේ ඇයිදැයි එම නිලධාරියාගෙන් ඇමැතිවරයා විමසා සිටියේය.

ඇණවුම් කරන ලද අමතර කොටසම ගෙන්වූ බවත්, අදාළ අමතර කොටස ආයතනයට ගෙනා පසුව එහි සීරියල් අංකය වෙනස් බව නිරීක්ෂණය වූ බවත්, එහි වගකීම තමාට භාරගත නොහැකි බවත් එහිදී නිලධාරියා කීවේය.

මෙහිදී රාජ්‍ය ඇමැතිවරයා සැපයුම් නිලධාරියාට තදින් කතා කළේය. ඇමැතිවරයා ආයතනයේ සභාපතිනි සන්ධ්‍යා අඹන්වලට කියා සිටියේ "මේ මිනිහගේ වැඩ තහනම් කරලා දන්න.'' යනුවෙනි.

සේවකයෝ අදාළ නිලධාරියාට විරුද්ධව කතා කරන්නට වූහ. එවිට එක්වරම සේවකයකු විසින් අදාළ සැපයුම් නිලධාරිවරයාගේ කමිසයෙන් ඇද පහරදීමට උත්සාහ කළ අතර, එම පහරදීම පොලිස් නිලධාරීන් මැදිහත්ව වළක්වනු ලැබීය. අදාළ නිලධාරිවරයාගේ කමිසය ඉරී ගිය අයුරු දැක ගත හැකි විය. එහිදී උණුසුම් තත්ත්වයක් ඇති විය.

"රුපියල් 3000 ඇණේ බුෂ් එක රුපියල් 78000ට ගෙන ආවේ මෙයාලා. වැඩ තහනම් කරලා විතරක් මදි මේ මුදල් අය කර ගන්න.'' යැයි සේවකයන් පවසන්නට විය.

තමාට පොස්පේට් ආයතනය තුළදී කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරියේදී සේවකයකු විසින් පහරදීමක් කළ බවට ලංකා රාජ්‍ය පොස්පේට් සමාගමේ සැපයුම් නිලධාරි අශෝක අබේසිරි එප්පාවල පොලිස් ස්ථානයට ඊයේ (17 වැනිදා) පැමිණිල්ලක්ද කර ඇත.

## මූලික අයිතිවාසිකම්...

රෝයල් පාර්ක් මිනීමැරුම් සිද්ධිය සම්බන්ධයෙන් මරණීය දණ්ඩනය නියම වී සිටි ජූඩ් ශ්‍රමන්ත ජයමහ නමැති වින්තිකරුට සමාව ප්‍රදානය කර නිදහස් කිරීමට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ගත් තීරණය නීති විරෝධී යැයි තීන්දු කොට එය බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ගොනු කෙරුණු පෙත්සම ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ යළි විභාගයට ගත අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් නෙරින් පුල්ලේ මෙම දැනුම් දීම සිදු කළේය.

එස්. තුරෙයිරාජා, යසන්ත කෝදාගොඩ සහ ජනක් ද සිල්වාගෙන් සමන්විත ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල ඉදිරියේ නඩු විභාගය පැවැත්වේ.

පෙත්සම කැඳවූ අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් නෙරින් පුල්ලේ කරුණු ඉදිරිපත් කරමින් යම් නඩුවක තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එහි අධිකරණ ක්‍රියාදාමය අවසන් වන බව සඳහන් කළේය. සමාව දීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිවරයා වෙත පැවරී තිබෙන අනන්‍ය බලයක් බවත් එය අධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සම් මාර්ගයෙන් අභියෝගයට ලක් කළ නොහැකි බවත් ඔහු කියා සිටියේය.

එබැවින් විධායක ජනාධිපතිවරයා විසින් සමාව ප්‍රදානය කිරීම තුළින් අධිකරණ බලය අභියෝගයට ලක් නොවන බවත් එය අධිකරණයට මැදිහත්වීමේ ක්‍රියාවක් ලෙස අර්ථකථනය කළ නොහැකි බවත් සඳහන් කළ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විධායක ජනාධිපතිවරයා මහජන ඡන්දයෙන් පත්වන අතර සමාව දීමේ බලය ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී තිබෙන බවත් පෙන්වා දුන්නේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් සමාව දීමේ බලය ජනාධිපතිවරයා වෙත ලබාදී ඇත්තේ අධිකරණ තීන්දුවල යම් දෝෂ සහගත තත්ත්වයක් මතු වුණොත් එය නිවැරදි කිරීමේ අරමුණින් යැයි පෙන්වා දුන් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා එම බලයට අභියෝග කිරීම තුළින් ජනතා පරමාධිපත්‍ය උල්ලංඝනය වීමක් සිදුවන බවත් පෙන්වා දුන්නේය.

අතිරේක සොලිසිටර් ජනරාල්වරයා වැඩිදුරටත් කරුණු දක්වමින් කියා සිටියේ පෙත්සම්කරුවන් ඉල්ලා සිටින සහන දෝෂ සහගත බවයි.

මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුණේ කාන්තා මාධ්‍ය සංවිධාන එකමුතුව විසිනි. පෙත්සම්කරුවන් කියා සිටින්නේ රෝයල් පාර්ක් මිනීමැරුම් සිද්ධිය සම්බන්ධයෙන් මරණීය දණ්ඩනය ලබා සිටි වින්තිකරුට සමාව ප්‍රදානය කර නිදහස් කිරීමේදී ජනාධිපතිවරයා විසින් නිසි නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොමැති බවයි.

එබැවින් අදාළ සමාව නීතියට පටහැනි බවත් ඒ තුළින් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට තීන්දු කොට එය බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙසත් පෙත්සම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටී.

## කොළඹ-ගම්පහ-කළුතර...

බරවා රෝගීන් 35 ක් ඉකුත් මාස හයට සොයා ගෙන ඇත. මෙරට රෝගීන් 14ක් සහ ඉන්දියන් ජාතිකයන් 21 ද සොයා ගෙන තිබෙන අතර කකුල් ඉදිමීමේ රෝග ලක්ෂණ පෙන්වන බරවා රෝගීන් 366ක් සොයා ගත් බව ජාතික බරවා රෝග මර්දන ව්‍යාපාරය පැවැසීය.

අරුණ කළ විමසීමේදී එහි ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ඉන්දීවරී ගුණරත්න පැවැසුවේ සජීවී පණුවන් ශරීරගත රෝග ලක්ෂණ නොපෙන්වන රෝගීන්ගෙන් 05ක් Wucheraria bancrofti, රෝගීන් 09 ක් Brugia malayi රෝගීන් බවට හඳුනා ගත් බවය.

බෘගියා මලායි (Burgia malayi ) රෝගීන් ගාල්ල, පුත්තලම, කළුතර ඇතුළු ප්‍රදේශ කීපයකින් හඳුනාගෙන තිබෙන අතර නිවසේ ඇති කරන සුරතල් සතුන්ගෙන් එය බෝවන බැවින් දරුවන් කෙරෙහි වඩාත් අවදානයෙන් පසුවන්නැයි වෛද්‍යවරිය දෙමාපියන්ගෙන් ඉල්ලීමක් කරයි.

කොළඹ, ගම්පහ, කළුතර පුදේශවලින් සංකූලතා සහිත කකුල් ඉදිමුණු නව රෝගීන් 336 සොයාගෙන තිබේ. කොළඹ සහ ගම්පහ මහා පරිමාණ වැඩ බිම් ආශ්‍රිතව හඳුනාගත් විදේශීය බරවා රෝගීහු සේවය කරති.

ජලාශ සහ වැව් ආශ්‍රිතව පිරී තිබෙන සැල්වීනියා සහ ජපන් ජබර ආශ්‍රිතව බරවා මදුරුවන් බිත්තර හෙළන බව හඳුනාගෙන තිබේ. බරවා මදුරුවන් බෝවීම පාලනයට ජලාශ සහ වැව් ආශ්‍රිත ආක්‍රමණශීලී මෙවැනි පැළෑටි ඉවත් කර ගැනීමට උනන්දු වන ලෙස ගොවි සංවිධාන සහ අදාළ අංශවලින්ද ඉල්ලීමක් කෙරේ.

## ගෙවල් ගිනි තියලා...

"ගෙවල් ගිනි තියලා මිනී මරලා අපිව වට්ටන්න බැහැ. අපි දැන් ගේමට බැහැලා ඉවරයි." යැයිද ඇමැතිවරයා සඳහන් කළේය.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ පෙරේදා (16 වැනිදා) පැවති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මිනුවන්ගොඩ ආසන බල මණ්ඩලයට සහභාගී වෙමින්.

එහිදී ඇමැතිවරයා වැඩිදුරටත් මෙසේද කීය.

හොඳ සාර්ථක මිනිහෙක් වෙන්නේ වැටි වැටී නැගිටින අයයි. එදා මගේ පියාගේ නිවස ගිනි තිබ්බ වෙලේ ඔබතුමාලා එතුමා රැකගත්තා වගේ මිනුවන්ගොඩ ඔබ මාවත් රැකගනීවි කියලා මම විශ්වාස කරනවා. 77 අපේ ගෙවල් ගිනි තිබ්බා. 94දී විරුද්ධ පාක්ෂිකයන්ගේ ගෙවල් ගිනි තියන්න අපි ඉඩ දුන්නේ නැහැ. මම තරම් රනිල් වික්‍රමසිංහට බැණපු කෙනෙක් නැති තරම්. අරගලයත් සමග මහින්ද ප්‍රමුඛ ආණ්ඩුව ඉවත් වුණා. පසුව ගෝඨාභය ජනාධිපති ඉවත් වුණා. ඊට පසුව වගකීම භාරගෙන කටයුතු කරන්න කවුරුත් ඉදිරිපත් වුණේ නැහැ. පක්ෂය දෙකට දලා රට එකට දලා රනිල්ට අපි සහය දෙන්න ඉදිරිපත් වුණා.

## දිනපොත

### කොළඹ ශාස්ත්‍ර පීඨයේ 91/92 සුහද හමුව 29දා

කොළඹ විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍ර පීඨයේ 91/92 කණ්ඩායමේ වාර්ෂික සුහද හමුව ජූලි 29ද සෙනසුරාද පෙරවරු 8.30 සිට විශ්ව විද්‍යාල faculty club හිදී පැවැත්වේ.

### ලේ දන්දීමේ පිංකමක්

විශ්ව ෆවුන්ඩේෂන් සමාජ සත්කාරක පදනම, ප්‍රථම වරට සංවිධානය කරන ලේ දන්දීමේ පිංකමක් ජූලි විසිවැනිද දවස පුරා ඕපනායක ගල්හිර හන්දිය අසල "ටෙඩිබෙයා" ආයතනයේදී පැවැත්වේ.

## පාර්ලිමේන්තුව අද රැස් වේ

පාර්ලිමේන්තුව අද (18 වැනිදා) පෙරවරු 9.30ට රැස් වේ. රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අද පෙරවරුවේ විවාදයට ගැනීමට නියමිතය. එමෙන්ම පලස්තීන ජනතාව මුහුණදී සිටින දුෂ්කරතා පිළිබඳව විපක්ෂය ගෙනෙන සභාව කල්තැබීමේ විවාදයද පස්වරුවේ පැවැත්වේ.

## ආයතන 65කට අද පාර්ලිමේන්තුවේදී සම්මාන

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවලට අනුව 2019 සහ 2020 වර්ෂවල ඉහළ කාර්යසාධන මට්ටමක් ළඟාකරගත් ආයතන 65ක් සඳහා පාර්ලිමේන්තුවේ දී අද (18 වැනිදා) රන් සහ රිදී සම්මාන පිරිනැමේ.

මෙලෙස සම්මාන පිරිනැමෙන්නේ ඇගයීමට ලක් කර ඇති රාජ්‍ය ආයතන 833ක් අතරින් තෝරා ගත් ආයතනයන්ටය. 2019 හා 2020 යන වර්ෂවලදී තෝරාගත් ආයතන තිහකට රන් සම්මාන සහ ආයතන 60කට රිදී සම්මානද මෙලෙස පිරිනැමේ.

සම්මාන ප්‍රදානය ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් සහ අගමැති දිනේෂ් ගුණවර්ධනගේ හා කථානායක මහින්ද යාපා අබේවර්ධනගේ සහභාගිත්වයෙනි.

## ▶▶ 01 වැනි පිටුවෙන්...

## ඖෂධ මරණ හොයන්න...

බොරැල්ල වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ දේදුනු ඩයස්ගේ සභාපතිත්වයෙන් යුත් එම කමිටුවට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අසාත්මිකතා ප්‍රතිශක්තිවේදය හා සෛල ජීව විද්‍යා අංශයේ ප්‍රධානි ආචාර්ය චන්දිම ජීවන්දර, කොළඹ විශ්වවිද්‍යාලයේ ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති, වෛද්‍ය සෙනිතා ලියනගේ, මහාචාර්ය නෙතුෂි සමරනායක, මහාචාර්ය එස්.එස්.පී. වික්‍රමකුලසූරිය, වෛද්‍ය පිලිප් එම්. ලී යන නිලධාරීන් ඇතුළත් වේ.

පේරාදෙණිය සහ අනුරාධපුර රෝහල්වල පසුගිය දිනවල සිදු වූ මරණ සම්බන්ධයෙන් චෝදනා එල්ල වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශයටය. එම මරණ මෙන්ම ජාතික අක්ෂි රෝහලෙන් සහ නුවරඑළිය මහ රෝහලෙන් ලබා දුන් ඖෂධ හේතුවෙන් සිදු වූ බව කියන ඇස් අන්ධවීම් සම්බන්ධයෙන්ද විමර්ශන කිරීමට කමිටුවට පවරා තිබේ. එමෙන්ම ඖෂධ හේතුවෙන් රෝගීන්ට ඇති වූ අසාත්මිකතා පිළිබඳ සොයා බැලීමත් කමිටුවට පැවරී තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

කමිටු වාර්තා සති තුනක් ඇතුළත සෞඛ්‍ය ඇමැතිවරයාට භාරදීමට නියමිත බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන ප්‍රකාශ කරයි.

## 70 පැන්න උපදේශක...

සමාජ සවිබල ගැන්වීම පිළිබඳ දේශන පවත්වන මෙම පුද්ගලයාට එරෙහිව ලිංගික අතවර කිරීම පිළිබඳව පැමිණිලි කර ඇත. කළුතර ප්‍රදේශයේ පදිංචි 27 හැවිරිදි ගුරුවරියක විසින් සිදු කරනු ලැබූ පැමිණිල්ලක් අනුව පරීක්ෂණ ආරම්භ කර තිබේ. ආචාර්යවරයා විසින් පැමිණිලිකාර ගුරුවරියව පෙරේදා (16 වැනිදා) කොළඹ මහජන පුස්තකාලයේ දේශනයකට ගෙන්වාගෙන ඇති අතර, ඇය කොළඹට පැමිණි පසු දේශනය අවලංගු කර ඇති බව දැනුම්දී තිබේ.

ඇයගේ දේශනවලට අදාළ පරිගණක ඉදිරිපත් කිරීමක (presentation) අඩුපාඩු ඇති බවත් ඒවා නිවැරැදි කිරීමට යැයි පවසා ආචාර්යවරයා පදිංචි මොරටුව උයන ප්‍රදේශයේ නිවසට ඇය කැටුව ගොස් ඇති බව සඳහන් වේ. එහිදී ආචාර්යවරයා ගුරුවරිය දෙමහල් නිවසේ ඉහළ මාලයට කැටුව ගොස් තමන් නාඩි වෙදකම දන්නා බව පවසා තරුණියගෙ අත අල්ලා පසුව ලිංගික අතවර කිරීමට උත්සාහ කර ඇත.

පසුව ඔහුව පසෙකට තල්ලුකර දමා, කළුතර නිවසට ගොස් සිය පියා සමග පොලිසියට පැමිණ පැමිණිලි කර ඇත. සැකකාර ආචාර්යවරයා ඊයේ (17වැනිදා) පස්වරුවේ මොරටුව මූලස්ථාන පොලිසියට කැඳවා ප්‍රකාශ සටහන් කරගත් බවද පොලිසිය කීය. මෙම සිදුවීම පිළිබඳ දේපාර්ශ්වය කැඳවීමට නියමිත බව පොලිසිය කීවේය. මූලස්ථාන පොලිස් පරීක්ෂක නිහාල් ෆ්‍රැන්සිස්ගේ උපදෙස් පරිදි ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනිය ඇතුළු නිලධාරීන් පරීක්ෂණ පවත්වයි.

## රට හාලෙන් ...

සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය නිසා බාස්මතී සහල් පමණක් ආනයනය කෙරෙන බවද ඇමැතිවරයා කීවේය.

පසුගිය කාලයේදී බියර් නිෂ්පාදනය සඳහා සහල් ආනයනය කළ බවද ඔහු පැවසීය.

පසුගිය කාලයේදී ඩොලර් මිලියන 300 ක් වැයකර සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ අටක් ආනයනය කර ඇතැයිද ඔහු පැවසීය.

මෙවර යල කන්නයේ වී අස්වනු කිලෝවක් රුපියල් 95 බැගින් මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය කටයුතු යොදා තිබෙන බවත්, මණ්ඩලය සියයට 8 පොලියට ණය ලබාගෙන වී මිලදී ගැනීම සිදුකරන බවත් ඇමැතිවරයා කීවේය.

වී මිලදී ගැනීම සඳහා බැංකුවලින් රුපියල් මිලියන 750 ක ණය මුදලක් වී අලෙවි මණ්ඩලයට ලබා ගැනීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවද ඔහු පැවසීය.

වී කිලෝවක මිල රුපියල් 130 ක් දක්වා ඉහළ ගියහොත් කැකුළු සහල් කිලෝවක මිල රුපියල් 250 ක් දක්වා ඉහළ යනු ඇතැයිද ඇමැතිවරයා සඳහන් කළේය.

වී අලෙවි මණ්ඩලය යල කන්නයේ වී අස්වනු මිලදී ගන්නේ පාඩුපිට බවද ඔහු කීවේය.

ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රයේ ඊයේ (17 වැනිදා) පැවැති මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා මේ බව පැවසුවේය.



සෙතුෂ



අභිරු සිසුවා විදුහල්පතිවරයාට කැට පරිත්‍යාග කරමින්



කැට රැගෙන එන දරුවෝ

# රෙස්ලින් තරගෙට යන්න සල්ලි නැතිව සිටිය සෙතුෂට යාළුවෝ කැට කඩා සල්ලි දෙති



## අභිරු පුතා අනික් සිසුන්ටත් ආදර්ශයක් - විදුහල්පති

**අපේ රටේ පුංචි දරුවන්ගේ සිට තරුණ තරුණියන් දක්වා විවිධ දක්ෂතා ඇත්තෝ බොහෝ වෙති. ඉන් ඇතැමුන්ගේ දස්කම් සදාකාලයටම සැඟවුණු දක්ෂතා අතරට එක්වන්නේ දෙවියන්ගේ මල්ලී ඒ සියල්ලට හරස්වන බැවිනි. සිය දස්කම්වලින් ලක්මව රනින් බැබළවීමට පාසල් වියේ සිටම සිහින දකින එහෙත්, ඊට වත්කමක් නැති ඇතැමුන් උදේ හවා තිස්තුන් කෝටියක් දෙවියන්ට කන්නලව් කරන්නේ දෙයියන්ගෙ මල්ලීගේ ඇල්ම බැල්ම නිසි කලට ලැබේවායි ප්‍රාර්ථනා කරමිනි.**

පාසල් හා ජාතික මට්මෙන් දස්කම් දක්වා ජාත්‍යන්තර පදක්කමක් රැගෙන ඒමට එලෙස සිව්වරක් මග පෑදී තෙවරක්ම එය දැස් මානයේ ගිලිහී ගිය පොඩ්ඩකු සොයා පසුගියදා අපි මොරටුව වේල්ස් කුමර විද්‍යාලයට ගියෙමු.

මොරටුව වේල්ස් කුමාර විද්‍යාලය යනු ක්‍රිකට්, පාපන්දු, බැඩ්මින්ටන් හා මල්ලවපොර ඇතුළු ක්‍රීඩා රැසකින් මෙරට පාසල් ක්‍රීඩා පිටිය වර්ණවත් කළ පාසලකි. එම විදුහලේ ඉගෙනුම ලබන සිසුහු දෙදෙනෙක් ජාතික මට්ටමේ තරග ද ජයග්‍රහණ කර මේ දිනවල ජෝර්දානයේදී පැවැත්වෙන ආසියානු මල්ලවපොර තරගාවලියේ වයස අවුරුදු 20න් පහළ කාණ්ඩයෙන් තරග වැදීම සඳහා සුදුසුකම් ලැබූහ. ඔවුන්ගේ දක්ෂතාව හා කැපවීම මෙන්ම පුහුණුකරුගේ මගපෙන්වීම ද ඊට බෙහෙවින් ඉවහල් වූවා විය හැකිය.

මෙලෙස අදාළ තරගාවලියට සුදුසුකම් ලැබූ

"මෙවර අපේ දරුවන් දෙදෙනකු ආසියානු මල්ලවපොර ශූරතාවලියට සුදුසුකම් ලැබුවා. එය පාසලට ගෞරවයක්. ඉන් එක් සිසුවකු වන සෙතුෂ සේනානායක සිව්වරක් මෙම ශූරතාවලිය සඳහා සුදුසුකම් ලැබුවත් ආර්ථික අපහසුකම් නිසා තෙවරක්ම එයට සහභාගි වීමට නොහැකි වුණා. මෙම තරග සංචාරයට පෞද්ගලිකව වියදම් දරාගැනීමට සිදු වෙනවා.

පාසල් කාලයේදී ජාත්‍යන්තර තරග අවස්ථාවක්

## ඉගෙනගන්නේ මොරටුව වේල්ස්කුමර විදුහලේ

රෙස්ලින්වලින් දිනලා පිටරට තරග අවස්ථාවලට යන්න බැරුව ඉඳලා තියෙනවා. එහෙම වුණේ ඒ අයියාට සල්ලි නැති නිසයි. ඉතින් ඒ අයියාගේ හීනය සැබෑ කරන්න තමයි මම මගේ කැටය ගෙනල්ලා දුන්නේ. මම ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ අයියාගේ සතුට සහ ඒ අයියා ගන්න අත්දැකීමෙන් රටට පදක්කමක් ලබා ගන්නවා දැකීමයි. මට වුණත් එහෙම අවස්ථාවක් ලැබිලා ඒකට යන්න බැරි වුණොත් දුක හිතෙනවා. මගේ අම්මයි, තාත්තයි කිව්වේ මම වගේම තමයි ඒ අයියලා දෙන්නත් කියලා."

තමාට සිව්වැනි වරට හිමිවූ එම ජයග්‍රහණය

"1993 වර්ෂයේ සිට වේල්ස් කුමර විදුහලේ මල්ලවපොර ක්‍රීඩා පුහුණුකරු ලෙස සේවය කරනවා. මෙම දරුවන්ගේ දක්ෂතා කුඩා කල පටන් හඳුනා ගැනීමට හැකි වුණා. මුල් කාලයේ ගෝනි සහ පොහොර උර මෙට්ට ලෙස සකසා පුහුණුවීම් කටයුතු සිදු කළා. එම පුහුණුවීම් වලින් තමයි ජාතික තලයට ගියේ. සාෆ් ක්‍රීඩා තරගාවලියේ මල්ලව පොර ක්‍රීඩා ඉසව්වෙන් මෙම පාසලේ ඉගෙනුම ලැබූ රොෂාන් ඉන්දික ලියනගේ මගේ පුහුණුව යටතේ 2006 දී රිදී පදක්කම ලබාගෙන තිබෙනවා. පකිස්තානයේ පැවැති තරගාවලියකදී සබෙස් සල්ගාදු ලෝකඩ පදක්කමක් ලබා ගත්තා. මෙම පාසලෙන් ඉගෙන ගත් බොහෝ දෙනකු මෙම ඉසව්වෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ රැසක් දිනාගෙන තිබෙනවා. මෙවර

සෙතුෂ සහ නිම්ෂාන් යන ක්‍රීඩකයන් දෙදෙනාට එම ජාත්‍යන්තර තරග අවස්ථාවක් ලැබී තිබෙන මොහොතේ ඔවුන්ට නිසි අනුග්‍රහය ලැබෙන්නේ නම් එම අත්දැකීම කරණ කොටගෙන ඔලිම්පික් පදක්කමක් පවා ලබා ගත හැකියි."

අභිරු රුත්මිණ සිසුවා අනුගමනය කරමින් පාසලේ සිසුන් බොහෝ පිරිසක් සිය මුදල් කැට විදුහල්පතිතුමා වෙත භාරදී ඇත. එම කැටවලින් විශාල මුදලක් නොලැබුණද ඔවුන්ගේ ආකල්ප කියාපාන්නේ මනුසත්කමේ ගුණ සුවඳ තවමත් එම පුංචි සිත් තුළ ඇති බවයි.

විදුහල්පතිවරයා විසින් පාසලේ ප්‍රතිපාදනවලින් රුපියල් එක්ලක්ෂ විසි පන්දහසක්, විදුහලේ ආචාර්යවරුන්ගෙන් එක්රැස් වූ රුපියල් ලක්ෂයක මුදලක්, ආදි ශිෂ්‍ය සංගමයෙන් ලැබුණු රුපියල් හතළිස් දහසක මුදලකුත් වශයෙන් විවිධ පරිත්‍යාගශීලීන්ගෙන් ලද උපකාරවලින් සෙතුෂ සිය මිතුරු නිම්ෂාන් සමගින් ඊයේ (17 වැනිදා) ජෝර්දානය බලා පිටව ගියේ මේ සඳහා උපකාර කළ සියලුදෙනාගේ දෙනෙත් සතුටු කඳුළුවලින් පුරවමිනි.

**දර්ශාන් කානිල් - මොරටුව**

## සල්ලි නැති නිසා තුන් සැරයක් ජාත්‍යන්තර තරග මගහැරුණා

## - සෙතුෂ සේනානායක සිසුවා

සිසුන් වන්නේ සෙතුෂ සේනානායක සහ නිම්ෂාන් සමරක්කොඩි ය. සෙතුෂ සේනානායක ආසියානු ශූරතා මල්ලවපොර ශූරතාවලියට සුදුසුකම් ලැබූ සිව්වැනි අවස්ථාව මෙය වුවද, ඔහු මෙතෙක් එකදු තරගයකට හෝ සහභාගී නොවූයේ ඒ වෙනුවෙන් වැය කිරීමට තරම් කාසි පනම් සිය පවුල සතුව නොමැතිවීම හේතුවෙනි. දුප්පත් පවුලක දරුවකු වූ සෙතුෂට එම තරගාවලියට යෑම සඳහා උදව් කිරීමට ඉදිරිපත්වූවන් ද අල්පය.

ඒ සියල්ල මොහොතකට අමතක කළ සෙතුෂ පසුගිය දිනෙක පාසලේ විදුහල්පති හසිත කේසර වෙත්තමුණි හමුවී ලද අවස්ථාව ගැන පැවසුවේ ඉහේ මලක් පිපුණු ගානටය. විදුහල්පතිවරයා ද සෙතුෂ අගයා ඔහුට සුබපැතුම් එක්කිරීමට ද අමතක නොකළේය.

"සර්, මේ පාරත් මට මේ තරගයට යන්න වෙන්නේ නැහැ. මෙච්චර සල්ලියක් හොයාගන්නේ කොහොමද?" යැයි විදුහල්පතිවරයා හමුවේ සෙතුෂ සඳහන් කළේ දැස් කඳුළින් පුරවාගෙනය.

අවස්ථා තුනක් අහිමි වූ සෙතුෂට සිව්වැනි අවස්ථාවත් අහිමි කරලීමට අකැමැති වූ විදුහල්පතිවරයා සෙතුෂගේ වීඩියෝවක් සිය මුහුණු පොතේ සහ වට්ස්ඇප් ගිණුමේ පළ කරමින් සිතැත්තන්ගෙන් ආධාර උපකාර ඉල්ලා සිටියේ සෙතුෂ තරගාවලියට සහභාගී කරවීමේ අපේක්ෂාවෙනි.

යහපතට ලැබෙන්නේ යහපත් ප්‍රතිචාරමය බව සනාථ කරමින් එම මුහුණුපොතේ සටහන දුටු මනුසත් හදවත් එකිනෙක එක්රොක් වන්නට පටන්ගෙන ඇත. එහි ආරම්භක පියවර තබන්නේ මෙවර ශිෂ්‍යත්ව විභාගය සඳහා මුහුණ දෙන වේල්ස් කුමර විදුහලේම පහ (එෆ්) ශ්‍රේණියේ ඉගෙනුම ලබන අභිරු රුත්මිණගේ සිසුවාය.

අභිරු රුත්මිණ මුදල් එකතු කළ කැටය සහෝදර සෙතුෂ සේනානායක අයියා වෙනුවෙන් වෙන් කරන්නට තීරණය කරන්නේ උතුම් හදවත් ඇත්තවුන් වේල්ස් කුමර විදුහලේ තවමත් සිටින බව පසක් කරමිනි. සිය දරුවාගේ එම ක්‍රියාව තව තවත් අගය කරමින් ළඟ ළඟම එන අභිරුගේ උපන්දින සැමරුම වෙනුවෙන් ඔහුගේ මවුපියෝ රැස්කර තිබූ රුපියල් දසදහසක මුදල ද ඊට එකතු කර විදුහල්පතිවරයාට භාර දුන්හ.

අභිරුගේ එම ආදර්ශමත් ක්‍රියාව අගය කරමින් විදුහල්පතිවරයා 'අරුණ' වෙත මෙසේ අදහස් දැක්වීය.



ආසියානු මල්ලවපොර තරගාවලියට වේල්ස් කුමර විදුහලෙන් දෙදෙනෙක්

කියන්නේ විශාල අත්දැකීමක්. ජෝර්දානයේ පැවැත්වෙන ශූරතාවලියට මෙවර අප පාසලෙන් දෙදෙනකු සුදුසුකම් ලබා ඇති නිසා ඔවුන්ට මෙම ශූරතාවලිය සඳහා සහභාගි වීමට උදව් උපකාර කරන ලෙස මුහුණු පොත ඔස්සේ වීඩියෝවක් පළ කරමින් වේල්ස් කුමරුවන්ට සහ ක්‍රීඩාවට ආදරය කරන අයට ආරාධනා කළා.

එය දුටු අභිරු පුතා තමන් නිවසේ මුදල් එකතු කළ කැටය සහ ඔහුගේ දෙමව්පියන් අභිරුගේ උපන්දින සැමරුම වෙනුවෙන් රැස්කර තිබූ මුදල මට ගෙනැවිත් දුන්නා. අභිරු පුතාගේ එම ක්‍රියාව ගැන නැවත මම වේල්ස් කුමර විදුහලේ මාධ්‍ය ඒකකය සම්බන්ධ කරගනිමින් වට්ස්ඇප් ඔස්සේ කෙටි වීඩියෝවක් ප්‍රචාරය කළා. එය දුටු පාසලේ අනෙක් දරුවන් ද අභිරු ආදර්ශයට ගනිමින් තමන්ගේ නිවසේ තිබූ මුදල් එකතු කළ කැට මට ගෙනැවිත් දුන්නා."

අභිරු රුත්මිණ සිසුවා ද සිය අදහස මෙසේ වචන බවට පෙරළුවේය.

"අපේ ඉස්කෝලේ සෙතුෂ අයියා තුන් වතාවක්

ගැන සෙතුෂ සේනානායක සිසුවා ද මෙසේ අදහස් දැක්වීය.

"පී. දිල්රුක් ද සිල්වා පුහුණුකරු යටතේ කුඩා කල සිට මල්ලවපොර ක්‍රීඩාවෙන් පුහුණුව ලැබුවා. 2021 වසරේ රුසියාවේ පැවැත්වීමට තිබූ වයස අවුරුදු 23න් පහළ ලෝක කනිෂ්ඨ මල්ලවපොර ශූරතාවලියට 92 බර පන්තියෙන්, එම බර පන්තියෙන්ම ස්පාඤ්ඤයේ පැවැත්වීමට නියමිතව තිබූ ලෝක කනිෂ්ඨ ශූරතාවලියට, 2023 වසරේදී කිරිකිස්ථානයේ පැවැති මල්ලවපොර තරගාවලියටත් මම සුදුසුකම් ලැබුවා. නමුත් ආර්ථික ප්‍රශ්න නිසා ඒ කිසිවකට සහභාගි වීමට මට නොහැකි වුණා. මෙවර ආසියානු මල්ලවපොර ශූරතාවලියට සහභාගි වී පාසලට සහ රටට පදක්කමක් ගෙන ඒමට මම බලාපොරොත්තු වෙනවා. මගේ දෙමව්පියන්, ක්‍රීඩා භාර ආචාර්ය උපේක්ෂා ද අල්විස් ගුරුතුමිය සහ විදුහල්පතිතුමා මට ගොඩක් උදව් කළා."

සිය සිසුන්ගේ දස්කම් අගයන පී. දිල්රුක් ද සිල්වා පුහුණුකරු පැවසුවේ නාගරික පාසලක වුවත් නිසි ලෙස මෙට්ට කට්ටලයක් පවා නොමැතිව සීමිත පහසුකම් යටතේ මෙම ක්‍රීඩකයන් දෙදෙනා පුහුණුව ලැබූ බවත් මොවුන්ට සම්පූර්ණ අනුග්‍රහය දක්වන්නේ නම් ඔලිම්පික් පදක්කමක් පවා රට වෙනුවෙන් ලබා ගත හැකි බවත්ය.

පුහුණුකරු වැඩිදුරටත් මෙසේද පැවසීය.

## සෙතුෂ අයියා රටට පදක්කමක් අරන් ඒවී

## - අභිරු රුත්මිණගේ සිසුවා




කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# පුහුණු ගාස්තු ගෙවා ගන්න බැරි උන් ගෙනා රන් පදක්කම්

රටක ජාතික හැඟීම එක මිටට ගත හැකි 'මන්තරයක්' වේ නම් ඒ ක්‍රීඩාවයි. ජාත්‍යන්තරය හමුවේ ජාතික කොඩිය පෙරටු කරගනිමින් ක්‍රීඩාව නමැති මන්තරයේ 'ජයග්‍රහණ මුමුණන' මොහොතක් පාසා ජාති, ආගම්, කුල, බාල මහලු වෙනසකින් තොරව රටක ජනතාව ඒකාත්මික කළ හැකිය. වර්ෂ 2000 සැප්තැම්බර් 28 වැනිදා සිඩ්නි ඔලිම්පික් උළෙලේ කාන්තා මීටර 200 අවසන් මහා තරගයේදී තත්පර 22.28ක කාලයකට මුළු ශ්‍රී ලාංකේය ජාතියම දැහැන්ගත කරවීමට සුසන්තිකා ජයසිංහට හැකිවද්දී, ලෝක කුසලාන අවසන් මහා තරගය පැවැති 1996 මාර්තු 17 වැනිදා සැන්දෑවේ පටන් රාත්‍රී මැදක් ගෙවෙනතුරු සමස්ත ශ්‍රී ලාංකේය ජාතියේ ඇස් ලාහෝරයේ ගඩාෆි ක්‍රීඩාංගණය අඛණ්ඩව යොමුකරවා ගැනීමට අර්ජුණ රණතුංග ප්‍රමුඛ පිරිසට හැකිවීම මෙයට උදාහරණ දෙකක් පමණි. මේවා හුදෙක් ක්‍රීඩාවේ 'ජාතික භාවනා' පමණක් නොව රටක ජයග්‍රාහී මානසිකත්වය නංවන 'ජාතික පණ පෙවීම්' ද වේ.

පෙරේදා (16 වැනිදා) තායිලන්තයේ බැංකොක්හිදී අවසන් වූ 25 වැනි ආසියානු මලල ක්‍රීඩා උළෙලේ ප්‍රතිඵලය ශ්‍රී ලාංකේය ජාතියට ක්‍රීඩාවෙන් පණ පෙවීමක් බඳුය. එහිදී රන් පදක්කම් 3ක්, රිදී පදක්කම් 2ක් සහ ලෝකඩ පදක්කම් 3ක් ආසියානු මලල ක්‍රීඩා ශූ රතා ඉතිහාසයේ ශ්‍රී ලංකාවේ වැඩිම පදක්කම් ස ට හ න වාර්තා කිරීම පමණක් නොව ආසියානු වාර්තා දෙකක අයිතිය ශ්‍රී ලංකාවට දිනාදීමටද අප ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.

මලල ක්‍රීඩාවේ පදක්කම් පැලඳීම ශ්‍රී ලංකාවට ආගන්තුක නැත. ලෝක සිතියමේ අපට වෙන්ව ඇති ඉඩ මොන තරම් පුංචි වුවද මලල ක්‍රීඩාවේදී අප විසින් වෙන්කරගත් ඉඩ සුළු නැත. සුනිල් ගුණවර්ධනලා, ඩබ්ලිව්. විමලදාසලා, ඒ. ප්‍රේමචන්ද්‍රලා, කෝසලා සහබන්දුලා, එස්.එල්.බී. රෝස ලා ජාත්‍යන්තර මලල ක්‍රීඩා පිටියේ හරඹ පෑ 70 දශකය සමයේ West Indies for Athletics හෙවත් මලල ක්‍රීඩාවේ බටහිර ඉන්දීය කොදෙව්ව ලෙසින් ලංකාව නමැති මේ කොදෙව්ව හැඳින්වීමට යෙදුණේ එබැවිනි. අනතුරුව එස්. බී. දිසානායක ක්‍රීඩා අමාත්‍ය යුගයේදී සුසන්තිකා ජයසිංහ, සුගත් තිලකරත්න, දමයන්ති දර්ශා, ශ්‍රියානි කුලවංශ, රොහාන් ප්‍රදීප් කුමාර, ප්‍රසන්න අමරසේකර, රංග විමලවංශ, අසෝක ජයසුන්දර ආදීන් විසින් මැවූ මලල ක්‍රීඩා අභිමානය, මලල ක්‍රීඩා ආනන්දය මහ මෙරක් තරම්ය.

නමුත් ඒ ඇවෑමෙන් ගෙවුණු දශක දෙකම පමණ කාලයේදී අප මලල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තරයේ කැපී පෙනෙන ජයක් වාර්තා වූයේ අහම්බයෙන් මෙනි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් දුසිම් ගණනින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගොස් හිස් අතින් ආපසු පැමිණි ආසියානු ක්‍රීඩා උළෙල ආදිය කිහිපයක් ගෙවුණු අතර පරාජයන් ගැන සොයන්නට කමිටු පත් කළද ජයග්‍රහණයක් සොයාගත හැකි සාධකයක් ඒවායෙන් මතු නොවීය.

ඉකුත්දා පැවැති ආසියානු ශූරතා මලල ක්‍රීඩා උළෙලේදී තරුෂි කරුණාරත්න, නදීෂා රාමනායක, ගයන්තිකා කුමාරි, නදීෂා ලේකම්ගේ, අරුණ දර්ශන, පබසර නිකු, රාජිත රාජකරුණා, කාලිංග කුමාරගේ, ලක්ෂිමා මෙන්ඩිස්, හර්ෂනී ප්‍රනාන්දු, පසිඳු කොඩිකාර ආදීන් විසින් පෙන්වා දුන්නේ ඒ පදක්කම් ඉඩෝරය අහවර වෙමින් පවතින බවය.

නමුත් ඉහතින් නම් සඳහන් වූ තරුණ තරුණියන් පිරිස විසින් මේ පදක්කම් ඉඩෝරය හමාර වීමේ ලකුණු පෙන්වන ලද්දේ රට ආර්ථිකය ඇතුළු සකලාකාරයේක කරුණුවලින් ඉඩෝරයක සිටියදී වීම මෙම ජයග්‍රහණයන්ගේ වටිනාකම තීව්‍ර කරන්නේය.

තායිලන්තයේ බැංකොක් නුවරදී ඉකුත්දා ඒ මලල ක්‍රීඩා පිටිය දිග්විජය කළෝ වනාහී කොවිඩ් වසංගතය පහවීමෙන් අනතුරුව මෙරට ජාතික සංචිතයට කෑම ටිකක් සැපයිය නොහැකි පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයේ සංචිත සිඳී යද්දී කොස් තම්බාගෙන කමින් තම 'ක්‍රීඩා පණ කෙන්ද' රැක ගත්තෝය. අවම පෝෂණය හෝ රැකගැනීම වෙනුවෙන් දයක වූ බිත්තරය ද හැට පැනයද්දී අන්ත අසරණ වූයෝය. එපමණක් නොව ක්‍රීඩාවේ මෙලෝ හසරක් නොදන්නා, ක්‍රීඩාව ගැන කිසිදු සංවේදීත්වයක් නොමැති පරිපාලන නිලධාරීන් නිසා අන්ත අසරණ වූවෝය. පෙරේදා බැංකොක්හිදී වසර 25ක් පැරණි මීටර 800 ආසියානු වාර්තාව සියතට ගත් තරුෂි කරුණාරත්න ඉකුත් දෙසැම්බරයේ දිනක දිගන ක්‍රීඩාංගණයේ ගේට්ටුව අබියස කඳුළු සලමින් සිටියේ එහි පුහුණුවීම් සඳහා පැයකට අය කෙරෙන ගාස්තුව ගෙවා ගැනීමට නොහැකිවීමෙන් ඈයට ක්‍රීඩාංගණයේ ගේට්ටු වසා දැමීම නිසාය. මෙම ජයග්‍රහණවල වටිනාකම දෙගුණ තෙගුණ වන්නේ මේවා ඒ සා කර්කශ අත්දැකීම් මතින් ලබාගත් ජයග්‍රහණ නිසාය.

එසේම මේ ආසියානු මලල ක්‍රීඩා ශූරතාවේදී පදක්කම් දිනූ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ කී දෙනෙක් විදෙස් පුහුණුව ලැබුවෝ දැයි අපි බලධාරීන්ගෙන් අසමු. එවැනි පුහුණුවක් ලැබූ කිසිදු ක්‍රීඩකයෙක් මේ අතර නැත. යෝගානන්ද විජේසුන්දර, ලක්ෂ්මන් ද අල්විස්, ඩර්වින් පෙරේරා, සුනිල් ගුණවර්ධන වැනි මලල ක්‍රීඩා පුහුණුවේ විදෙස් හැදෑරීම් සහිත පුහුණුකරුවන් කී දෙනෙක් මේ වන විට ශ්‍රී ලංකාව සතුද? බැංකොක් ආසියානු ශූරතාවේදී හෙල්ල විසිකිරීමෙන් අප පදක්කම් ලැබුවද අප සතුව එම ක්‍රීඩාව වෙනුවෙන් නිසි දැනුම සහිත පුහුණුකරුවෙක් සිටින්නේද? ඇති පදම් පුහුණුව ලැබීමට පහසුකම් සහිත සින්තටික් ධාවන පථ පහසුකම් අප සතුද?

ඒ අතින් බැලූ විට ආසියානු ශූරතාවේදී ලැබූ මෙම පදක්කම් කෙසේ වෙතත් මේ සා බැරි අමාරුකම් මැද ඔවුන් දුවනවා දැක්කත් හිත පිරෙන්නට ඒ ඇතිය. එබැවින් ඔවුන්ගේ පදක්කම් කෝටියක් වටින්නේය. නමුත් එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ රාජකාරිය මෙතැනින් හමාර නැත. මෙයට වඩා අභියෝගය ඉහළ ආසියානු ක්‍රීඩා උළෙල නුදුරේම යෙදෙනු ඇත. මෙම ජයග්‍රහණය ආසියානු ක්‍රීඩා උළෙලේදී විජයග්‍රහණයක් කර දිය යුතුය. මෙම ජයග්‍රාහී ක්‍රීඩක ක්‍රීඩිකාවන් කිහිප දෙනෙක්ම ලෝක මලල ක්‍රීඩා ශූරතා පරිසාධනයේ දෙරට තට්ටු කරමින් සිටියි. ඔවුනට එම දෙරටුව විවරකර දිය යුත්තේය. ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ඔවුන්ගේ හයියෙන් යා හැකි උපරිමය ගොස් ඇත්තාහ. ඉන් ඔබ්බට ඔවුන්ව රැගෙන යා හැක්කේ ජාතික මට්ටමේ දූරදර්ශී වැඩපිළිවෙළකටය. ඒ සා ගමනක් සැකසීමට මත්තෙන්, දවල්ට පුහුණුවීම්වල යෙදී රෑට ත්‍රිරෝද රිය රැගෙන හයර් දුවන ක්‍රීඩකයන් කී දෙනෙක් ජාතික සංචිතවල වේ දැයි සොයා බලා එතැනින් ඉදිරි වැඩකටයුතු අරඹන්නේ නම් මැනවි.

# හැම පළාත් ප්‍රවාහන අධිකාරියක්ම හොරට බස් ධාවන බලපත්‍ර ලබාදෙනවා



**පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථ කිහිපයක් ආසන්න දින කිහිපය තුළ දරුණු අනතුරුවලට ලක්විය. විනයක් නැති රියැදුරන් ගේ අපරීක්ෂාකාරී ධාවනය සහ බස් රථ නියමාකාරයෙන් නඩත්තු නොකිරීම වැනි කාරණා නිසා ඒවාට වන්දි ගෙවීමට සිදුව ඇත්තේ අහිංසක මිනිස් ජීවිතවලිනි. මෙවැනි ඛේදවාචක දිනෙන් දින වැඩිවෙමින් තිබුණ ඒ පිළිබඳ සොයා බැලිය යුතු අධිකාරීන් නිද්‍රාශීලී පිළිවෙත සිටින බව ද ජනතාව චෝදනා කරති. තමන්ට අසාධාරණයක් වූ විට රට පුරා බස් වර්ජනයන් සිදුකරන පෞද්ගලික බස් රථ සංගම් මෙවැනි රියැදුරන් පිළිබඳ සොයා නොබැලීම ගැන ද එම සංගම් දෝෂාරෝපණයට ලක්වෙමින් තිබේ. අප මේ පිළිබඳ විමසුවේ ශ්‍රී ලංකා පෞද්ගලික බස් රථ සංගමයේ සභාපති ගැමුණු විජේරත්න ගෙනි.**

**දිනෙන් දින පෞද්ගලික බස් රථ අනතුරු වැඩිවෙමින් තියෙනව. පසුගිය දිනවල සිදුවුණු අනතුරු බොහෝමයක් රියදුරන්ගේ නොසැලකිල්ලෙන් සිදුවූ බවට චෝදනා එල්ල වෙනවා. මිනිස් ජීවිත බිලිගන්නා මේ රියැදුරන් ගැන පෞද්ගලික බස් සංගම් සොයා බැලීමක් කරන්නෙ නැද් ද?**

ඇත්තට ම අනතුරු සිදුවෙලා මගීන්ට කරදර විඳින්න සිදුවීම ගැන අපි කණගාටු වෙනවා. රියදුරන් ගේ නොසැලකිල්ලෙන් සිදුවන අනතුරු ගැන අපේ අවධානය යොමු කරල තියෙනවා. අපේ බස්රථ සේවකයින්ටත් නොයෙක් ගැටලු තියෙවා. ඔවුන් සමහරක් අය දැඩි පීඩනයකට ලක්වෙලා. මම 2004 එළිදැක්වූ මගෙ පොතෙන් මේ ගැන කියල තියෙනවා. එදා කිව්ව දේවල් අදටත් එහෙම ම යි. විසඳිලා නෑ. බස් රථ නැවතුම් පොළවල් සකස් කරලා නෑ. බස් ගාල් කරන්න නිශ්චිත තැනක් නෑ. කොළඹ ඉඳලා දුරගමන් යන බස් තමන් ගේ වාරය එන තුරු තැනින් තැන පරවල් අයිනේ තමයි නතර කරලා තියා ගන්නෙ. දුර පළාත්වල ඉඳලා එන අයට විවේක ගන්න සෞඛ්‍යය පහසුකම් සහිත තැනක් නෑ. මේවා ගැනත් හිතන්න ඕනේ. අනතුරක් වුනාම රියදුරුට වරද පටවනවා වගේ ම ඒ අය ගේ මානසිකත්වය ගැනත් හිතන්න ඕනේ.

**රියදුරන්ට මුහුණ දීමට සිදුව ඇති අපහසුතා ගැන කියමින් ඔබ උත්සහ කරන්නෙ මේ සිදුවන අනතුරු සාධාරණීකරණය කරන්නද?**

අපේ රටේ බස් කර්මාන්තයට කුඩම්මා ගේ සැලකිල්ලක් තියෙන්නෙ. බොහෝ අය කියන්නෙ සෞඛ්‍යය හා අධ්‍යාපනය අපේ රටේ පළමු තැනට අවධානය යොමු විය යුතු විෂයයන් කියල යි. නමුත් ඇත්තට ම ආණ්ඩුව ප්‍රමුඛ අවධානය යොමු කරන්න ඕනේ මෙරටේ ප්‍රවාහනයට යි. මොක ද අනෙක් කොයි දේට යන්නත් හොඳ ප්‍රවාහනයක් තියෙන්න ඕනේ. බස් සංගම්වලට ප්‍රවාහන පරිපාලනයේ වගකීමක් නැනෙ. ඒක රජය සතුවයි තියෙන්නෙ. ඒ නිසා ප්‍රවාහනය දියුණු තත්ත්වයට පත් කිරීම රජයක වගකීමක්. එහෙමයි කියල අපි මේ සිදුවන සමහර අනතුරු සාධාරණීකරණය කරන්නෙ නෑ

**බස් කර්මාන්තය පිරිහීම ගැන රජයට චෝදනා කළත්, මේ කර්මාන්තය අන්ත දූෂිත තත්ත්වයට පත්ව තියෙන බවට චෝදනා එල්ල වෙනවා. ඒ ගැන ඔබ මොනවද කියන්නෙ?**

මෙ රටේ නිලධාරීන් ගෙන් 75%ක් හරියට වැඩක් කරන අය නොවෙයි. මේ බොහෝ දෙනෙක් පගාවට හුරුවෙලා. ඒ අතර හොඳ අවංක නිලධාරීනුත් ඉන්නවා. නැගෙනහිර පළාතේ ප්‍රවාහන අධිකාරිය හොරට බස් ධාවන බලපත්‍ර ලබා දී ඇති බව දැන් හෙළිව තිබෙනවා. මේක හැම පළාත් ප්‍රවාහන අධිකාරියක ම කෙරෙනවා. මේවාට වගකියන්න ඕනේ මෙරටේ පාදඩ දේශපාලනඥයින් හා සමහර පාදඩ විද්‍යුත් නාලිකා කියල අපි බය නැතුව කියනවා.

**රටේ ආර්ථික අර්බුදය නිසා බස් කර්මාන්තය කර ගෙන යන්න අමාරුයි කියල එදා තිබුණ බස් ගාස්තුව 400%කින් විතර වැඩි කරගෙන, දැන් ආර්ථිකය යහපත් අතට හැරෙමින් තිබියදී ඒ සහනය බස් හිමියන් භුක්ති විඳිමින් එය ජනතාවට දෙන්නෙ නෑනේ. ඒකත් පාදඩ වැඩක් කියලයි ජනතාව කියන්නෙ?**

බස් ගාස්තු අඩු වැඩි කරන්න ක්‍රමවේදයක් තියෙනවා. ඒ අනුව අපි මෙතෙක් කටයුතු කරලා තියෙනවා. මම මුලින් කිව්ව පාදඩ වැඩේ සිද්ධ වෙන්නෙ මේ තැන්වලදී තම යි. අධ්‍යාපනයක් නැති බස් සංගම් ගෙනත් මාධ්‍යයේ කතා කරලා රටට වැරදි තොරතුරු දෙනවා. මේකෙන් හානිය සිදු වෙන්නෙ රටේ ජනතාවටයි. මෙරටේ බස් කොන්දෙස්තර බලපත්‍රයක් දෙන්න යම් සුදුසුකම් ප්‍රමාණයක් බලනවා. නමුත් බස්හිමියන්ට මාර්ග බලපත්‍ර දෙන්න සුදුසුකම් බලන්නෙ නෑ. මාර්ග බලපත්‍රයක් දෙනකොටත් බස් හිමියා ගේ අධ්‍යාපන සුදුසුකම් බලන්න ඕනේ. එහෙම නොකරන එක බරපතළ අර්බුදයක් බවට පත්ව තිබෙනවා.

**මාර්ග බලපත්‍ර හා අධ්‍යාපනය අතර තිබෙන සම්බන්ධය මොකක්ද?**

අපි බස්හිමියෝ විදියට වැඩකරන ජනතාවටයි. අධ්‍යාපනයක් නැති බස්හිමියෝ මුදල් ගැන හිතනවා මිසක් ජනතා සේවය ගැන හිතන්නෙ නෑ. ඒ අය බස් ගාස්තු වැඩි කරන්න ඕනේ කියල කීවාම සමහර විද්‍යුත් මාධ්‍යයත් ඒක රසකරල උලුප්පලා දෙනවා. ඒකෙන් වෙන්නෙ ඒ ප්‍රචාරය අයිතිවාසිකමක් විදියට අරගෙන බස් ස්ට්‍රයික් කරනවා. පසුගිය කාලේ එහෙම දේවල් වෙලා තියෙනවා. අධ්‍යාපනයක් නැති බස්ගාස්තුවල මිනුම් දඬු ගැන අවබෝධයක් නැති සමහර බස් සංගම් බස් ගාස්තු වැඩි කරන්න කියල ඉල්ලුවාම ඒක මාධ්‍ය රටට පෙන්වන්නෙ ජාතික ප්‍රශ්නයක් විදියට. එහෙම වුනාම යම් ප්‍රතිපත්තියක සිට කටයුතු කරන අපිත් අසරණ වෙනවා.

**පෞද්ගලික බස් කර්මාන්තය දූෂිත තැනක් බවට පත්වෙලා ජනතාව ගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්නෙ කාගේ හයියෙන් ද?**

මම මුලින් කීවේ ඒක තමයි. මාර්ග බලපත්‍රයක් දෙන කොටත් අධ්‍යාපන සුදුසුකම් බලන්න ඕනේ කියල. සමහර බස් හිමියෝ දේශපාලනඥයෝ. සමහරු කුඩුකාරයෝ හෝ මත්ද්‍රව්‍යට සම්බන්ධ අය. චණ්ඩි, පාතාල කෙරුමෝ හැමෝම දැන් බස් අයිතිකරුවෝ. ඒ බස් දැන් මගී ප්‍රවාහනයට එකතුවෙලා.

**මෙරටේ අනෙක් බස් සංගම් ගැමුණු පසුකර යෑමේ කේන්තිය නිසා ගැමුණු දැන් සාධාරණ ජනතාවාදී කඳවුරට වෙලා අනෙක් බස් සංගම්වලට පහර ගහනවා කියල ඔබට චෝදනා කරනවා නේ ද?**

නෑ. මම ජනතාව ගේ පැත්තෙ ඉන්නෙ. ජනතාව තමයි අපිව ඔසවා තබා තියෙන්නෙ. මම 2004 දී මගේ පළමු පොත ලියන විට මෙරට තිබුණ පෞද්ගලික බස් ඇණියේ ප්‍රමාණය බස් විසිදහක්. ඔබ දන්නවා ද අද වෙද්දි ඒ බස් ඇණිය දෙලොස් දහසකට අඩු වී තියෙනවා. එහෙම වුනේ හිතුවක්කාරි විදියට බස් ගාස්තු ඉහළ දාන්න කියල සටන් කරලා බස් ගාස්තු වැඩි කළා ම ජනතාව පෞද්ගලික බස් කර්මාන්තයෙන් ඉවත් වුනා. මම 2011 දී මේ ගැන සමීක්ෂණයක් කළා. එයින් මම හෙළිදරව් කරගත්තා දිනකට මගීන් 1500 බැගින් පෞද්ගලික බස්වල යන එක නතර කරලා විකල්ප ප්‍රවාහනවලට යොමුව තියෙන බව. එහෙම වුනේ ගුණාත්මක සේවාවක් නැතිව ගාස්තු වැඩි කිරීම නිසයි. දැන් පෞද්ගලික බස්වල සිදුවන අනතුරු විදියට තව ටික කාලයකින් මිනිස්සු පෞද්ගලික බස්වල ගමන් යෑම සම්පූර්ණයෙන්ම නවතින්නත් ඉඩ තියෙනවා. මොකද මේ වන විටත් ජනතාව තේරුම් ගෙන තිබෙනවා පෞද්ගලික බස්වල යන එක ජීවිත අවධානමක් කියල.


**ප්‍රවාහන අමාත්‍යාංශය කොන්දොස්තරවරු රහිතව බස් ධාවනය සඳහා වැඩ පිළිවෙලක් හඳුන්වා දෙන්න හදනවා. මේ ගැන මොකද හිතෙන්නෙ?**

අපේ රටේ ප්‍රවාහන වැඩපිළිවෙළ සාර්ථකව කර ගෙන යන්න නම් එවැනි අලුත් ක්‍රම භාවිතා කරන්න ඕනේ. බස් ඇතුළත මූල්‍ය ගනුදෙනු තමයි පෞද්ගලික බස් කර්මාන්තය පිරිහෙන්න ප්‍රධානම හේතුවක් වෙලා තියෙන්නෙ. බස් ඇතුළෙ මුදල් ගනු දෙනු නොමැතිව කොන්දෙස්තර සහිතව හෝ රහිතව බස් ධාවනය කරන්න පුළුවන්. ලෝකයේ බොහෝ රටවල ඒ ක්‍රමය ක්‍රියාත්මකයි. අපේ රටෙත් මේ ක්‍රමය විවිධ ආකාරයෙන් ආරම්භ කරන්න හැදුවත් ඒ හැම අවස්ථාවක් ම අසාර්ථක වුණා. ලෝකයේ සමහර රටවල රියදුරන් නැතුව බස් ධාවනය කෙරෙනවා.

**ගෝඨාභයට ජනාධිපති වෙන්න ඔබේ බස් සංගමයත් සෑහෙන්න මහන්සි වුනා. ඒ වගේ ම ගෝඨාභය ජනාධිපති ධුරයෙන් එලවන්නත් ඔබලා අරගලයට සහය වුනා. අරගලයට අවුරුද්දකින් පස්සෙ දැන් ඒව ගැන මොනවද හිතෙන්නේ...**

අපේ සංගමය අරගලයට සහය දුන්නෙ නම් නෑ. නමුත් ගෝඨාභය රාජපක්ෂ ජනපති කරන්න සහය දුන්න බව ඇත්ත. ඇත්තට ම මම එජාපයේ රනිල් වික්‍රමසිංහවාදියෙක්. මම පාර්ලිමේන්තු මැතිවරණයකදී එජාපයෙන් තරග කළ අයෙක්නෙ. මම ගෝඨාභය රාජපක්ෂට උදව් කරන්න පටන් ගත්තෙ සජිත්ලා එජාපය කඩාගෙන වෙන ම කණ්ඩායමක් විදියට කටයුතු කරන්න පටන් ගත්තාට පසුවයි. මම එහෙම කළෙත් පක්ෂයේ නායකයා විදියට රනිල් වික්‍රමසිංහ මහතාට කියල යි. රජුන් තනන්නත් රජුන් එළවන්නත් මට පුළුවන්. අපි මහජනතාව සමග ඉන්න නිසා ජනතාව අපිව විශ්වාස කරනවා. ඒ අනුව තමයි මම ගෝඨාභය රාජපක්ෂට උදව් කළේ. එයා හොඳ මහත්මයෙක් කියල මම අදත් කියනවා. මෙවර උපන්දිනය දවසෙත් මම එතුමා මුණ ගැහිල සුබ පැතුවා. අරගලය මෙහෙය වූයේ ජාත්‍යන්තර ත්‍රස්තවාදය විසින් කියලයි අපි විශ්වාස කරන්නෙ. ආගම්වාදයත් එහි තවත් කොටසක්. මෙරට බොහෝ ගැටුම් නිර්මාණය කරන්නෙ මේ බලවේග කියල හුගක් අය දන්නෙ නෑ. ගෝඨාභයට රට කර ගෙන යන්න තරම් හොඳ දේශපාලන පළපුරුද්දක් තිබුනේ නෑ. නමුත් ඔහු ඉතා හොඳ මානව හිතවාදියෙක් කියල දන්නෙ ඉතාම සුළු පිරිසක් විතරයි.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර



## ගපිරීගේ කවිය

### බය හිතෙනවනෙ...

කිහිල්ලට බෙහෙත් කෙරුව ම මැරෙන එක
පුදුමයි නේද ඔව් මුළු ලෝකෙන් ම එක
සිහි නැති කළොත් ආපහු සිහි ගන්න එක
සතපහකට ෂුවර් නැතිවලු, 'නිවිස් එක'

"ගන්නට බේත් සල්ලිත් නැතිවිටදි අතේ
ගියහොත් රෝහලට ජීවිත ෂුවර් නැතේ
එහෙට ගියත් ගෙයි හිටියත් එකලු පුතේ
මේවගෙ කතා පැතිරෙනවා හතර අතේ

# බටහිර ප්‍රතිකාරවලින් අවදානමක් නොගෙන දේශීය වෛද්‍ය ප්‍රතිකාර ගන්න

## - පශ්චාත් උපාධි රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති

■ චාමර පල්ලේගෙදර

බටහිර වෛද්‍ය ක්‍රමය ඔස්සේ ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් දිනෙන් දින අවදානමට ලක්වීම වළක්වා ගැනීමට ඇති හොඳම විසඳුම රෝගීන් දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයට යොමුවීම බව පශ්චාත් උපාධි රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති චමල් ආර්. කුලතිලක පැවැසීය.

වත්මන් තත්ත්වය නිසා බටහිර වෛද්‍ය ක්‍රමය ඔස්සේ ප්‍රතිකාර ලබා ගැනීමට රෝගීන් දැඩි බියක් දක්වන බවත් දැනටමත් බහුතර පිරිසක් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට යොමුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන බවත් සභාපතිවරයා සඳහන් කළේය.

බටහිර වෛද්‍ය ක්‍රමය ඔස්සේ ඖෂධ ලබා ගන්නා රෝගීන්ට කුමක් හෝ අසාත්මිකතාවක් ඇති වූ බවට සෑම දිනකම පුවතක් වාර්තා වන අතර මේ මගින් බොහෝ රෝගීන් බටහිර වෛද්‍ය ක්‍රමය ප්‍රතික්ෂේප කරන තත්ත්වයට පත්ව ඇති බවද චමල් ආර්. කුලතිලක පවසයි.

මෙරට දියුණු ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් තිබියදී අකාලයේ සිය ජීවිත අහිමි කර ගැනීම අනුවණ ක්‍රියාවක් බව පැවසූ සභාපතිවරයා දේශීය වෛද්‍ය ක්‍රමයට හුරුවිය යුතු කාලය එළැඹ ඇති බවද පැවැසීය.

# නාලන්ද ඝාතන සිද්ධියේදී

# යූඑන්පී පාක්ෂිකයන්ගේ දේපොළ ගිනිතැබූ 9කට වසර 26කට පසු සිර දඬුවම්

■ සුනිල් පියතිලක - කුරුවිට

පාර්ලිමේන්තු මන්ත්‍රී නාලන්ද එල්ලාවල ඝාතන සිද්ධිය පාදක කොටගෙන එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ නිවාස හා දේපොළ ගිනිතැබීමට සම්බන්ධ 9 දෙනකුට රත්නපුර මහාධිකරණයෙන් නියම කර තිබූ බරපතළ වැඩ සහිත සිරදඬුවම් ක්‍රියාත්මක කෙරේ.

1997 වසරේදී පාර්ලිමේන්තු මන්ත්‍රී නාලන්ද එල්ලාවල ඝාතන සිද්ධිය පාදක කොටගෙන එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ නිවාස හා දේපොළ ගිනි තැබීමට හා දේපොළ කොල්ල කෑමට සම්බන්ධ විත්තිකරුවන්ට 2008 වසරේදී එවකට රත්නපුර මහාධිකරණ විනිසුරු අනෝමා ජයවර්ධන ලබා දී තිබූ තීන්දුව ක්‍රියාත්මක කළ රත්නපුර මහාධිකරණ විනිසුරු ලංකා ජයරත්න ඊයේ (17 වැනිදා) එම සිදුවීමට සම්බන්ධ 9 දෙනකුට බරපතළ වැඩ සහිත වසර පහ හමාරේ සිට හත හමාර දක්වා සිරදඬුවම් ක්‍රියාත්මක කෙරිණි.

වසර 26ක් තිස්සේ මෙම නඩු කටයුත්ත පැවැති අතර මෙම කාලය තුළ විත්තිකරුවන් 9 දෙනාගෙන් තිදෙනකු මේ වනවිට මියගොස් ඇත. එම තිදෙනාටත් මෙසේ සිරදඬුවම් නියම කෙරිණි. මේ අනුව පළමුවන හා පස්වන විත්තිකරුවන්ට අයුතු ජන රැශියක සාමාජිකයන් වීම සම්බන්ධ චෝදනාවට බරපතළ වැඩ සහිත මාස 6ක සිර දඬුවම්ද, නිවාස හා දේපොළ ගිනිතබා විනාශ කිරීමේ චෝදනාවට බරපතළ වැඩසහිත වසර පහක සිරදඬුවම්ද, දේපොළ කොල්ල කෑම යටතේ තවත් බරපතළ වැඩ සහිත වසර දෙකක සිර දඬුවම්ද නියම විය. ඉතිරි විත්තිකරුවන් හත් දෙනාට අයුතු ජන රැශියක සාමාජිකයන් වීම සම්බන්ධ චෝදනාවට බරපතළ වැඩ සහිත මාස 6ක සිර දඬුවම්ද, නිවාස හා දේපොළ ගිනිතබා විනාශ කිරීමේ චෝදනාවට බරපතළ වැඩසහිත වසර



පහක සිර දඬුවම්ද නියම විය.

2008 වසරේදී රත්නපුර මහාධිකරණ විනිසුරු අනෝමා ජයවර්ධන ලබාදුන් තීන්දුවෙන් පසු නඩු පොත් පරිශීලනය කිරීමේ පනත අනුව එවකට අධිකරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා අදාළ නඩු වාර්තාව අමාත්‍යාංශයට ලබා ගෙන තිබිණි. පසුව එය අස්ථාන ගත වූ බවට වාර්තා විය. මේ අතරතුර අදාළ චූදිතයන් අභියාචනයක් ඉදිරිපත් කර ඇපපිට නිදහස්ව තිබිණි. මෙම නඩු කටයුත්ත වෙනුවෙන් නීතිඥ නිරෝෂ් නින්දවත්ත වසර 26ක් පැමිණිලි පාර්ශවය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය නොකර පෙනී සිට ඇත.

# දේශපාලනඥයෙක් පන්නෙගමුව වැවේ අක්කර පහක් අල්ලාගෙන

## හෝටලයකුත් ඉදිකරලා



වාන් දොරින් පිටවන ජලයේ පැහැය

■ අමිල සම්පත් ශ්‍රී - තිස්සමහාරාමය

තිස්සමහාරාම, පන්නෙගමුව වැවේ අක්කර පහක පමණ භූමියක් ප්‍රාදේශීය දේශපාලඥයකු විසින් අල්ලා ගෙන හෝටලයක් ඉදිකිරීම නිසා වසර දොළහක් තිස්සේ කිසිදු ප්‍රතිසංස්කරණයක් කටයුත්තක් සිදු නොකෙරුණු බවට ගොවීහු චෝදනා කරති.

"බොන්න වතුර ටික නැතුව පන්දහසක් විතර පිරිසක් මේ ගමේ පොරොත්තු ලේඛනයේ ඉන්නවා. එහෙම එකේ මේ වැවේ තියෙන හෝටලයට ජල නළ පහසුකම් දෙන්න ජලසම්පාදන මණ්ඩලය කටයුතු කරලා තියෙනවා. අනෙක් කාරණය මේ දේශපාලනඥයා විසින් ඉදිකළ ගොඩනැගිල්ල මොනම හේතුවකටවත් පේන්නේ නෑ. මොකද වැවේ අඩි දහයක් පහළොවක් උස මහ ගස් වැවිලා වැව කැලෑවෙන් වට වෙලා තියෙන්නේ. ළඟටම යන්න ඕනේ අර කියන ඉදිකිරීම බලා ගන්න." යැයි ප්‍රගති ගොවි සංවිධානයේ සභාපති කේ.එච්. අනුර සඳහන් කළේය.

මෙම අනවසර ඉදිකිරීම හේතුවෙන් වැවේ ජලය ද අපවිත්‍ර වී තිබෙන බවත් අධික දුර්ගන්ධයක් ඇති බවත් ඒ හේතුවෙන් මදුරුවන් බෝ වී ඇති බවත් ගොවීහු පෙන්වා දුන්හ.

මේ සම්බන්ධයෙන් ලුණුගම්වෙහෙර වාරිමාර්ග ඉංජිනේරු කේ. හර්ෂණ කුමාරගෙන් "අරුණ" කළ විමසීමකදී සඳහන් කළේ අනවසර ඉදිකිරීම් සහ වැවට ඉඩම් අල්ලාගෙන කොටුකර ගැනීම හේතුවෙන් මැනුම් කටයුතු සිදු කිරීමට අපහසු වී තිබෙන බවයි. වැවේ ඉඩම් අල්ලා ගත් පිරිස විසින් ඊට මුදා හරින අපද්‍රව්‍ය හේතුවෙන් වැව් ජලය අපවිත්‍ර වී ඇති බවත් ඉන් ප්‍රදේශයට අධික දුර්ගන්ධයක් පැතිරෙන බවත් වාරිමාර්ග ඉංජිනේරුවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

මීට වසර දහයකට පමණ පෙර අක්කර අඩි අටසීයක ජල ධාරිතාවකින් යුක්ත වැව අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් මේ වන විට අක්කර අඩි දෙසීයකටත් වඩා අඩුවී ඇත. තිස්සමහාරාම මහජන සෞඛ්‍ය පරීක්ෂක අනුර විජයමුණිගෙන් කරන ලද විමසීමේ දී ඔහු පැවසුවේ ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යෑමට අපවිත්‍ර වූ ජලය සහිත පන්නෙගමුව වැව විශාල කරදරයක්ව ඇති බවයි. ඒ පිළිබඳව වාරිමාර්ග ඉංජිනේරුවරයාට සහ ජලජීවී පරීක්ෂණ ආයතනයටද ලිඛිතව දැනුම්දීමට කටයුතු කරන බව ඔහු සඳහන් කළේය.

මෙම වැව ප්‍රතිසංස්කරණයට රජයෙන් මුදල් ලබා නොදෙන්නේ නම් රුපියල් පනහ සීය හෝ එකතුකර ගොවි සංවිධානයේ වියදමින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ගැනීමට අවස්ථාව සලසා දෙන්න යැයි පන්නෙගමුව ගොවි සංවිධානයේ උප සභාපති අමරජීව හෙට්ටිආරච්චි ඉල්ලා සිටියේය.

# කැටගොඩට එරෙහිව බල්තසාර් ශ්‍රේෂ්ඨාධිකරණයට

■ කේ. එස්. උදය කුමාර

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මහ නගර සභා හා ප්‍රාදේශීය සභාවලට අදාළ සංශෝධන පනත් කෙටුම්පතේ ඇතැම් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි යැයි තීන්දු කරන ලෙස ඉල්ලා ජාතික ජන බලවේගයේ කොළඹ මහ නගර සභාවේ නගරාධිපති අපේක්ෂිකාව වන ව්‍රායි බල්තසාර් විසින් ඊයේ (17 වැනිදා) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කරනු ලැබීය. එහි වගඋත්තරකරුවන් ලෙස නීතිපතිවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ නම් කර තිබේ.

පෙත්සම්කාරිය කියා සිටින්නේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ මහ නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනතට සංශෝධනයක් එක් කිරීමේ අරමුණින් නව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බවයි. එය මේ මස 05 වැනිදා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කර ඇති බවත් පෙත්සමේ සඳහන් වේ. එම පනත් කෙටුම්පත තුළින් විසුරුවා හැර තිබෙන පළාත් පාලන ආයතන ආපසු කැඳවීමට විෂයභාර අමාත්‍යවරයාට බලය පවරා දී ඇති බවත් එසේ ආපසු කැඳවනු ලබන පළාත් පාලන ආයතනවල නිල කාලය නිර්ණය කිරීමේ බලයද විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බවත් පෙත්සම්කාරිය සඳහන් කර ඇත.

පළාත් පාලන ආයතන සඳහා වසර හතරකට වරක් මැතිවරණ පැවැත්විය යුතු බවට නීතිය සඳහන් වුවද මේ ආකාරයෙන් එම ආයතනවල නිල කාලය දීර්ඝ කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයාට පැවරීම තුළින් මහජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝනය වන බවත් පෙත්සම්කාරිය චෝදනා කර සිටියි. එබැවින් අදාළ පනත් කෙටුම්පත සම්මත කිරීමට අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් සහ ජනමත විචාරණයකින් එය අනුමත විය යුතු බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් පෙත්සම්කාරිය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැඩිදුරටත් ඉල්ලා තිබේ.

# අක්කරයක අඹ පැළ 408ක් හිටවන්න සැලැසුම්

■ සාලිය කුමාර ගුණසේකර



අක්කරයක අඹ පැළ 80ක් වගා කරනවා වෙනුවට පැළ 408ක් සිටුවා එහි අස්වැන්න අපනයනය කිරීමට කටයුතු යොදා ඇතැයි කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහන් කරයි. මෙතෙක් කාලයක් අක්කරයක වගා කරනු ලැබුවේ අඹ පැළ 80ක් වුවත්, නවීන තාක්ෂණික ක්‍රමෝපායන් යටතේ ටී.ජේ.සී. වර්ගයේ අඹ පැළ 408ක් අක්කරයක වගා කළ හැකි බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවැසුවේය. මෙම අඹ සඳහා ලෝකයේ රටවල්වල ඉහළ ඉල්ලුමක් ඇතැයිද ඔහු කීවේය.

එමෙන්ම ඉන්දියාව, බංග්ලාදේශය ආදී රටවල්වලින් මෙරටට මහා පරිමාණයෙන් ආනයනය කරන රතු දෙළුම් මෙරට ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇතැයිද ඇමැතිවරයා පැවැසුවේය. අපනයනය කිරීම සඳහා පමණක් අනෝදා විශාල වගාවක් මොණරාගල ප්‍රදේශයේ පවත්වාගෙන යන බවද, මීට අමතරව අපනයනය සඳහා අලිපේර වගාව (ඇවකාඩෝ හෑෂ්) බණ්ඩාරවෙල සහ බදුල්ල ප්‍රදේශවල ව්‍යාප්ත කර ඇතැයිද ඇමැතිවරයා කීවේය.

මිරිස් අක්කර භාගයක වගා කර රුපියල් ලක්ෂයක් උපයාගත හැකි පරිදි අවශ්‍ය තාක්ෂණික දැනුම තරුණ ගොවි ප්‍රජාවට ලබා දෙන බවද ඔහු පැවසීය. ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රයේ ඊයේ (17 වැනිදා) පැවැති මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා මේ බව කියා සිටියේය. රටට වියළි මිරිස් වසරකට මෙට්‍රික් ටොන් 52,000ක් අවශ්‍ය වුවද, ඉන් මෙට්‍රික් ටොන් 49,000ක්ම ආනයනය කරන බවත් 2025 වසර වන විට රටේ අවශ්‍යතාවයෙන් සියයට 80ක්ම රට තුළ නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇතැයිද ඇමැතිවරයා පැවැසුවේය.

# වාණිජ මහාධිකරණ මූල්‍ය සීමාව කෝටි 2 සිට 3 දක්වා ඉහළට

■ ඉෂාර රත්නකාර

වාණිජ මහාධිකරණවල නඩු විභාග කිරීම සඳහා දැනට පවතින මූල්‍ය සීමාව රුපියල් කෝටි දෙකේ සිට කෝටි 03 දක්වා ඉහළ දැමීමට පියවර ගන්නා බව අධිකරණ ඇමැති විජයදාස රාජපක්ෂ ඊයේ (17 වැනිදා) සඳහන් කළේය. වාණිජ මහාධිකරණවල නඩු විභාග කිරීම ප්‍රමාද බවට විවේචන පවතින බැවින්, එම නඩු කඩිනමින් විසඳීමට තවත් වාණිජ මහාධිකරණයක් කඩිනමින් ස්ථාපිත කරන බව ද අධිකරණ ඇමැතිවරයා සඳහන් කළේ ය.

"ඉඩම් සම්බන්ධ විශේෂ සමථ මණ්ඩලවල ආරවුල් විසඳීමේ ප්‍රතිශතය 70% ක මට්ටමක පවතිනවා. රුපියල් ලක්ෂ 20 ට අඩු මූල්‍ය හිමිකම් පාන නඩු විභාග කිරීම සඳහා සුළු හිමිකම් අධිකරණ ස්ථාපිත කර තිබෙනවා.'' යැයිද අධිකරණ ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# මන්නාරමේ නිධන් සෙවූ 4ක් කොටු

■ දීපා වසන්ති එදිරිසිංහ

මන්නාරම තාල්පාඩු ප්‍රදේශයේ නිධන් හාරමින් සිටි සැකකරුවන් සිව්දෙනකු, පොළොව කැණීම සඳහා භාවිත කරන ස්කෑන් යන්ත්‍ර දෙකක් ඇතුළු උපකරණ තොගයක් සමග මන්නාරම විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

මෙලෙස අත්අඩංගුවට ගත් සැකකරුවන්, කැකිරාව, කැලණිය හා අලුත්ගම වැල්විල්ල යන ප්‍රදේශවල පදිංචිකරුවන් බව සඳහන්ය. තාල්පාඩු ප්‍රදේශයේ සැකකටයුතු ලෙස පිරිසක් හැසිරෙන බවට මන්නාරම විශේෂ කාර්ය බළකා කඳවුරට ලැබුණු තොරතුරක් මත පෙරේදා (16 වැනිදා) රාත්‍රියේ කළ වැටලීමකදී මෙම පිරිස අත්අඩංගුවට ගෙන තිබේ.

# කලවාන රෝහල තුළ පිහි ඇනුමකින් පුද්ගලයෙක් මරුට

■ එෆ්. අස්ලම්

■ ඉන්දික වික්‍රමාරච්චි - රක්වාන

රත්නපුර, කලවාන ප්‍රදේශයේදී ගැටුමකට මැදිව තුවාල ලැබූ දෙපිරිසක් කලවාන රෝහලේදීද ඇතිකර ගත් ගැටුමක් නිසා එක් අයකු පිහි ප්‍රහාරයකට ලක්ව ඝාතනයට ලක්ව තිබේ. මෙලෙස ඝාතනයට ලක්ව ඇත්තේ කලවාන, දෙල්ගොඩ ප්‍රදේශයේ පදිංචි 42 හැවිරිදි පුද්ගලයකි. ඝාතනයේ සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. ඝාතනයට ලක්වූ පුද්ගලයා තවත් මිතුරන් දෙදෙනකු සමග දෙල්ගොඩ ජනපදයේ දී පෙරේදා (16 වැනිදා) රාත්‍රියේ මත්පැන් පානය කරමින් සිට ඇත. එම අවස්ථාවේදී මරණකරුගේ මිතුරකු විවාහ වී සිට පසුව දික්කසාද වූ කාන්තාවගේ පියා සහ සොහොයුරා එම ස්ථානයෙන් ගමන් කර සිටියදී බීමතින් සිටි පිරිස ඔවුන් දෙදෙනාට පහරදී තිබේ. ඒ ඇතිවූ බහින්බස්වීමක් දුරදිග යෑම මතය.

මෙම ගැටුමේදී තුවාල ලැබූ පුද්ගලයකු කලවාන රෝහලට ඇතුළත් කෙරිණි. පහරදීම සිදුකළ පුද්ගලයාගේ මිතුරකුද තුවාල ලබා කලවාන රෝහල වෙත ඇතුළත් කර තිබිණි. මෙහිදී බීමත් පිරිසගෙන් පහර කෑ පුද්ගලයා බැලීමට ඔහුගේ පුතු සහ දියණිය රෝහලට පැමිණි අවස්ථාවේදී දියණියගේ කලින් සැමියා සහ පහරදුන් පුද්ගලයාද රෝහල තුළට පැමිණ ඇත.

එහිදී දෙපිරිස අතර යළි ගැටුමක් හටගෙන ඇත. එහිදී මුල් සිද්ධියේදී පහරකෑමට ලක්වූ පුද්ගලයාගේ පුතා තම පියාට පහරදුන් පුද්ගලයාට පිහියකින් ඇනීමට උත්සාහ කර ඇත. එහිදී දිවි බේරාගැනීමට රෝහල තුළ දිව ගොස් සැඟවී සිටීමට උත්සාහ කළ පුද්ගලයා හඹා ගොස් පහරකෑමට ලක්වූ පුද්ගලයාගේ පුතා ඔහුට පිහියකින් ඇන ඝාතනය කර ඇති බව පොලිසිය කළ මූලික විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් කලවාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්. එම්. ඩබ්ලිව්. කේ. හේරත් ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ සිදුකරති. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායම් කිහිපයක්ම යොදවා ඇත.

# ග්‍රහචාරය

2023 ජූලි 18 වැනිදා අඟහරුවාදා

රාහු කාලය
සවස 3.23 - සවස 04.47
රාත්‍රි 3.10 - රාත්‍රි 4.37

ශුභ දිශාව - උතුර
මරු - බස්නාහිර

## මේෂ
**ප්‍රබල බාධක**

බොහෝ දුරට යහපත් දවසක් වේ. බුද්ධිමත් ලෙස හෝ උසස් අයගෙන් උපදෙස් ලබා හෝ කටයුතු කිරීමට ඉඩ ලැබේ. සිතේ පවතින ස්වභාවයන් පාලනය කරගැනීමට උත්සාහ කරන්න. ප්‍රබල බාධක ඇති වේ.

## වෘෂභ
**විනෝදකාමී හැඟීම්**

සිතේ විනෝදකාමී ඉක්මන් හැඟීම් ඇති වුවද පාලනය කරගත යුතු වේ. විශේෂයෙන් තරඟකාරී කටයුතු සම්බන්ධවයි. නව නිවාස සම්බන්ධ කටයුතුවලට අවකාශ ඇතද එහි ඵලදායිත්වය ඉතා අඩු බවක් පෙනේ. රාජ්‍ය සේවාවන්හි අයට විශේෂයි.

## මිථුන
**බාධක සහිතයි**

සාමාන්‍යයෙන් කතාබහට ඉඩ ඇතත් පාලනය කරගන්න. කතාව බොහෝ දුරට අවාසි ගෙනදිය හැකිය. අන්‍යයන් වැරදි අයුරින් තේරුම් ගැනීමට ඉඩ ඇත. බාධක ඇතත් මිල මුදල් ගනුදෙනු අවාසි නොවේ.

## කටක
**නිදහස් අදහස්**

සුපුරුදු කරදර බාධක මැද්දේ වුවද දවස ගත කිරීමට ඉඩ ලැබේ. නිදහස් අදහස් හෝ සිතිවිලි ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට අපහසුතා ඇතිවේ. වචන භාවිතය ගැන සැලකිලිමත් වන්න. විහිළු කතා ඇනුම්පද සේ අන්‍යයන්ට වැටහෙනු ඇත.

## සිංහ
**අහඹු වාසි**

ඉක්මන් සිතිවිලි පාලනය කරගන්න. වියහියදම්වල වැඩිවීමකට ඉඩ ඇත. මවු පාර්ශ්වීය අහඹු වාසි ඇතිකළ හැකිය. ආගමික කටයුතු කෙරේද උනන්දුවක් ඇතිවීමට පුළුවන. විවාහ යෝජනා සම්බන්ධව එතරම් සුබ නොවේ.

## කන්‍යා
**වැටීම් තැළීම්**

ඔබගේ වැඩකටයුතු කෙරේ සුබවාදී බලපෑම්වලට ඉඩ ඇතත් කාර්යය අවසන් වනතෙක් එහිම නියුතු වන්න. බාධක බොහෝ දුරට මගහැරෙන බැවිනි. කතාබස් අවම වීම වඩාත් යහපත්ය. වැටීම් තැළීම් ගැන සැලකිලිමත් වන්න.

## තුලා
**සුබඵල**

සාමාන්‍ය හැසිරීම් රටාවෙහි නිශ්චබ්ද බවක් ඇතද කරන දෙයින් මඳ වශයෙන් හෝ සුබඵල අත්කර දේ. අලංකරණය, රූපලාවණ්‍ය සම්බන්ධ කටයුතුවලින් වීම විශේෂයි.

## වෘශ්චික
**සුළු සහන**

ආරක්ෂක, ක්‍රීඩා හෝ යාන්ත්‍රික කටයුතුවල යෙදෙන අයට වැඩ අධික වේ. ඉක්මනින් නිම කිරීමේ අවශ්‍යතාවන් ඇතිවේ. කරදරකාරී මානසිකත්වය තුළම සුළු සහන අවස්ථාවනට ඉඩ ඇතිවේ. නිවාස කටයුතුවලට කරදර සහිතයි.

## ධනු
**ජලයෙන් ප්‍රවේශම් වන්න**

සුපුරුදු ලෙස ඔබගේ අනන්‍යතාවන් රකිමින් හෝ රැකෙන අයුරින් වැඩ කිරීමට ඉඩ ලැබේ. උසස් අදහස් ඇතද ඒවා ඉදිරිපත් කිරීමට පසුබට වීම් ඇතිවේ. ජලය සම්බන්ධ කටයුතුවලදී ප්‍රවේශම අවශ්‍යයි. පිහිනුම් තටාක හෝ විවෘත ජලාශ සම්බන්ධ විශේෂයි.

## මකර
**සිතිවිලිවලට බාධා**

වඩාත් ඉස්මතු වන අයුරින් වැඩකටයුතුවල ප්‍රගතියක් නොදැනේ. සිතිවිලි බොහෝ දුරට ක්‍රියාත්මක වීමට බාධා ඇතිවේ. අන්‍යයන් හා එකඟවීම්වලදී විශේෂයි. එහෙත් නිහඬ බව සමගම වැඩ කෙරීගෙන යනු ඇත.

## කුම්භ
**සැලකිලිමත් වන්න**

නායකත්ව අවස්ථා ඇතද ඊට යොමුවීමේදී දුෂ්කරතා ඇති කළ හැකිය. මිල මුදල් සම්බන්ධව ඉතාමත් සැලකිලිමත් විය යුතුය. විශේෂයෙන් නව තැන්පතු සම්බන්ධයෙනි. අතපය හිරිවැටීම් ගැනද සැලකිලිමත් වන්න.

## මීන
**විවාහ යෝජනා**

මිල මුදල් ගනුදෙනු බොහෝදුරට අවාසි බවක් ගෙන නොදේ. මුදල් ආයෝජනයකට වුව වරදක් නොවේ. ප්‍රසිද්ධ කටයුතු (ප්‍රාසාංගික)වලදී සාමාන්‍ය සුබවාදී වීමක් ඇතිවේ. විවාහ යෝජනා කෙරෙහි විශේෂ බාධකයන් ඇති නොවේ.

# සංඝාධිකරණ පනත කඩිනම් කරන්න මහනායක හිමිවරු සාකච්ඡාවක

## ඇමැති විදුර කියයි

■ අශිකා ජයවීර

කතිකාවත් පනත හා සංඝාධිකරණ පනත කඩිනමින් ගෙන ඒම සඳහා මහ නායක ස්වාමීන් වහන්සේලා සාකච්ඡා සිදුකරමින් පවතින බව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමැති විදුර වික්‍රමනායක පවසයි.

එමෙන්ම භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් සමාජය තුළ පවතින කතිකාව හා මතභේදාත්මක තත්ත්වයන් සම්බන්ධයෙන් යළි සලකා බලන ලෙස මහ නායක ස්වාමීන් වහන්සේලා වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකර ඇති බව ඇමතිවරයා ඊයේ [ 17ද ] මාධ්‍ය වෙත අදහස් දක්වමින් කියා සිටියේය.

විනයක් සහ භික්මීමක් නොමැතිව කිසිවක පැවැත්මක් නොමැති බැවින් මෙම තීරණය ගත් බව ඔහු පැවසීය.

රාජ නීතියට වැඩියෙන් බුද්ධ නීතියට අනුව ස්වාමීන් වහන්සේලා කටයුතු කළ යුතු බවත් උන්වහන්සේලා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත යුත්තේ ගිහියන් නොව මහා නායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ කාරක සංඝ සභාව බව ඇමැතිවරයා පැවසීය.

චීවර දරන ස්වාමීන් වහන්සේ නමකගේ චීවරය ඉවත් කරන්නට හෝ උන්වහන්සේට දඬුවම් පමුණුවන්නට කිසිදු ගිහියකුට අයිතියක් නොමැති බවත් උන්වහන්සේලා සම්බන්ධ පූර්ණ අයිතිය ඇත්තේ මහ නායක ස්වාමීන් වහන්සේලාට පමණක් බවත් බුද්ධශාසන ඇමැතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

# මැතිවරණ කොමිසමේ කරුණු විමර්ශනයට විශේෂ කාරක සභාවක්

පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ වරප්‍රසාද කඩවීමේ සිද්ධි සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට අදාළ කරුණු විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ඊයේ ( 17 වැනිදා) තීරණය කර ඇත.

විමර්ශනවලින් පසු සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම ද කාරක සභාවට පැවරෙන අතර ඊට අදාළ යෝජනාව පාර්ලිමේන්තුවට අද ( 18 වැනිදා) ඉදිරිපත් කෙරේ. ඒ පිළිබඳ විවාදයක් ඉදිරි වෙනත් දිනයකදී පැවැත්වීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ එකඟත්වය හිමි වී තිබේ.



# මුතුරාජා අද පාර්ලිමේන්තු කාරක සභාවට

■ නිලන්ත මදුරාවල

ඉමහත් ආන්දෝලනයක් ඇති කළ මුතුරාජා හස්තියා යළිත් තායිලන්තයට ගෙන්වා ගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පරිසරය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වනජීවී දෙපාර්තමේන්තුව ඇතුළු වගකිව යුතු ආයතනවලින් අද ( 18 වැනිදා) ප්‍රශ්න කරයි.

වනජීවී හා වන සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු ආයතනය අද එම කාරක සභාවට කැඳවා තිබෙන අතර මුතුරාජා හස්තියාට අවශ්‍ය ප්‍රතිකාර නොදීමට වගකිව යුත්තේ කවුරුන්ද යන්න සම්බන්ධයෙන් ද කරුණු විමසීමට නියමිත ය.

2001 වසරේ දී මෙරටට පරිත්‍යාග කෙරුණු මෙම හස්තියා අලුත්ගම කන්දේ විහාරයට භාර දී සිටි අතර එහිදී මුතුරාජා විවිධ වධ හිංසාවට ලක්කර ඇති බව සත්වවේදීහු පෙන්වා දුන්හ. ඉන් පසු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට භාර ගත් මෙම හස්තියා ඉකුත් පළමු වැනිදා තායිලන්තයට රැගෙන යන තෙක් වූ මාස කිහිපයේ එහි රඳවා සිටියේ ය.

මෙම හස්තියා සුවය ලැබීමෙන් පසු යළිත් මෙරටට ගෙන ඒමට අදාළව එකඟතාවක් තිබෙන බව අගමැති දිනේෂ් ගුණවර්ධන පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළ නමුත් මුතුරාජා යළිත් මෙරටට භාර නොදෙන බව තායිලන්තය මේ වන විට ප්‍රකාශ කර තිබේ.

පරිසරය පිළිබඳ කාරක සභාව රැස් වෙන්නේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුමගේ සභාපතිත්වයෙනි.

# අජිත් රෝහණගේ පෙත්සම අගෝස්තු 03 යළි කැඳවයි

■ කේ.එස්. උදයකුමාර

දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කළ තමන් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව නැගෙනහිර පළාතට ස්ථාන මාරු කර හැරීමට ජාතික පොලිස් කොමිසම විසින් ගනු ලැබූ තීරණය තුළින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් සිය ස්ථාන මාරුව බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ විසින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම සලකා බැලීම සඳහා අගෝස්තු මස 3 වැනිදා කැඳවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (17ද) නියෝග කළේය.

මෙම පෙත්සම ඊයේ ප්‍රීති පද්මන් සූරසේන සහ මහින්ද සමයවර්ධන යන මහත්වරුන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල ඉදිරියේ කැඳවීමෙන් අනතුරුව මෙම නියෝගය නිකුත් කෙරිණි.

පෙත්සම කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයට දන්වා සිටියේ මෙම පෙත්සමට අදාළ විරෝධතා ගොනු කර තිබෙන බවයි. මෙම විරෝධතා අධ්‍යයනය කර ප්‍රති විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා කාලය ලබා දෙන ලෙස පෙත්සම්කාර අජිත් රෝහණ මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ෆයිස් මුස්තාපා මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ විනිසුරු මඩුල්ල අනතුරුව පෙත්සම සලකා බැලීම සඳහා අගෝස්තු මස 3 වැනිද කැඳවන ලෙස නියෝග කළේය.

පෙත්සම්කාර අජිත් රෝහණ මහතා කියා සිටින්නේ දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කළ තමන් කිසිදු සාධාරණ හේතුවක් නොදන්වා නැගෙනහිර පළාතට මාරු කර හැරීමට ජාතික පොලිස් කොමිසම කටයුතු කළ බවයි. මෙම මාරුවීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන ලෙස තමා ජාතික පොලිස් කොමිසම වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ බවත් ඒ අනුව ජාතික පොලිස් කොමිසම විසින් බස්නාහිර පළාත් සභාවේ ලේකම් රෝහණ රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් විමර්ශනයක් පැවත්වූ බවත් පෙත්සම්කරු කියා සිටී.

ඉන්පසුව පරීක්ෂණ කමිටුව වාර්තාව ඉදිරිපත් කළ අතර ඒ අනුව තම ස්ථාන මාරුව නිවැරැදි බවට එම කමිටුව විසින් තීරණය කළ බවත් ඔහු පෙන්වා දෙයි.

පෙත්සම්කාර අජිත් රෝහණ මහතා කියා සිටින්නේ තමන්ට මෙම පරීක්ෂණ වාර්තාව පිළිගත නොහැකි බවයි. එම පරීක්ෂණය පැවැත්වූ ආකාරය පක්ෂග්‍රාහී යැයි චෝදනා කළ අජිත් රෝහණ මහතා පරීක්ෂණ වාර්තාවද පක්ෂග්‍රාහී බව කියා සිටී.

මේ තුළින් සිය මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් සිය ස්ථාන මාරු කිරීමේ ලිපිය බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා තිබේ. ඊට අමතරව අදාළ පෙත්සම විභාග කොට අවසන් තීන්දුවක් ලබා දෙන තුරු සිය ස්ථාන මාරුව ක්‍රියාත්මක වීම වැළැක්වීමේ අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටී. මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා, මහජන ආරක්ෂක අමාත්‍යවරයා, ජාතික පොලිස් කොමිසම, පොලිස්පති, නීතිපතිවරයා ඇතුළු පිරිසක් නම් කරනු ලැබ සිටිති.

# සා.පෙළ ප්‍රතිඵල එනතුරු පාසල්වලදීම වෘත්තිය පාඨමාලා

සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට උසස් පෙළ හැදෑරීම සඳහා ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසු වන මාස තුනක පමණ කාලයේ දී තමන් කැමති වෘත්තීය පාඨමාලාවක් පාසල්වලදීම හැදෑරීමේ අවස්ථාව සිසුන්ට හිමි කර දීමට අපේක්ෂා කරන බව අධ්‍යාපන ඇමැති ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත පැවසීය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ඉකුත් ද පැවති ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා හා සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට සහභාගී වෙමිනි.

විදෙස්ගත ව පවතින පුහුණු ශ්‍රම ඉල්ලුමට සරිලන පුහුණුවක් ලබා දිය හැකි පරිදි දිවයින පුරා පිහිටුවා ඇති මධ්‍යස්ථානවලින් පාඨමාලා හැදෑරීමේ දී එහි කාලය අඩු කරගැනීමට ද පාසලේ දී මූලික ව ලබන මෙම වෘත්තීය පුහුණු පාඨමාලා කාලය ඉවහල් කරගත හැකි බව කී ඇමැතිවරයා මෙසේද කීවේ ය.

" අද ලෝකය ඉල්ලන්නේ නිපුණතාවෙන් හෙබි වෘත්තිකයන්. ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස (ජර්මන් ටෙක්) ආයතනයේ පාඨමාලාවන් හදාරන සිසුන්ට එවැනි වෘත්තීය පිළිගැනීමක් ජාත්‍යන්තර මට්ටමින් පවතිනවා. රැකියාවන් ඔවුන් සොයා පැමිණෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉදිරියේ දී ජර්මන් රජයේ සහයෝගය මත මෙම ආයතනය හා එහි පාඨමාලා තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කරනවා.

# "බාල ඖෂධ එපා"



බාල ඖෂධ භාවිතයෙන් ජීවිත අහිමි වීම, ඖෂධ හා උපකරණ හිඟය ඇතුළු කරුණු මුල් කර ගනිමින් ඊයේ (17දා) කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිට පැවැති විරෝධතාව

- ඡායාරූප ප්‍රදීප් දඹරගේ

# ශ්‍රී ලංකා නීතිඥ සංගමය පක්ෂග්‍රාහී අදහස් සමග පෙළගැසෙන බව පෙනෙනවා

## බෞද්ධ නීතිඥ සංගමය

ශ්‍රී ලංකා නීතිඥ සංගමය යුක්තියේ මූලධර්ම සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි අවධානය යොමු කරනවා වෙනුවට වඩා පක්ෂග්‍රාහී අදහස් සමග පෙළගැසෙන බව පෙනෙන්නේ යැයි ශ්‍රී ලංකා බෞද්ධ නීතිඥ සංගමය පවසයි.

එම පිළිවෙත හෙළා දැක නිවේදනයක් නිකුත් කරමින් මේ බව පවසන එම සංගමය එහි මෙසේද සඳහන් කර තිබේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය සරත් වීරසේකර විසින් කුරුන්දි විහාරයේ භික්ෂූන් වහන්සේලා කිහිප නමකගේ ආගමික නිදහස අහිමි කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වද්දී එය අධිකරණයට කරන ලද අශික්ෂිත ප්‍රහාරයක් බවට කඩිනමින් ප්‍රකාශයක් නිකුත් කිරීමට ශ්‍රී ලංකා නීතිඥ සංගමය කටයුතු කිරීම අපි පිළිකුලෙන් යුතුව සටහන් කරමු.

එමෙන්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයකු ද වන පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් විසින් අධිකරණයට පාර්ලිමේන්තුවේ දී එල්ල කරන ලද දැඩි ප්‍රහාරය හෙළා දකිමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එවැනිම ප්‍රකාශයක් නිකුත් කිරීම සුදුසු යැයි කල්පනා නොකිරීම හා ඒ සම්බන්ධයෙන් දැඩි නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම පුදුමයට කරුණකි.

සංගමයෙහි ස්ථාවරයේ වරණාත්මක ස්වභාවය අපි නිරීක්ෂණය කරන්නේ දැඩි බලාපොරොත්තු සුන්වීමකින් වන අතර, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සිය මූලධර්ම භාවිතයේදී එය නොගැළපෙන බව පෙනේ.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය ප්‍රකාශ නිකුත් කිරීමේදී යටි අරමුණු ඇතිව සිදුකරන බාහිර දේශපාලන බලපෑම්වලට යටත් නොවී අපක්ෂපාතීව ක්‍රියා කළ යුතු බව අපගේ අදහසයි.



# මාස දහයකදී රුසියානුවන් ලක්ෂයක් මෙරටට ඇවිත්

■ ටී.කේ.ජී.කපිල - කටුනායක

රුසියාවේ මොස්කව් නුවර සිට සෘජු ගුවන් ගමන් මගින් එරටට අයත් ගුවන් සේවා තුනකින් ඊයේ (17ද) වනවිට රුසියානු සංචාරකයන් ලක්ෂයක් පැමිණීම වෙනුවෙන් විශේෂ උත්සවයක් කටුනායක ගුවන් තොටුපොළේදී පැවැත්වුණි.

ඉකුත් 2022 වසරේ ඔක්තෝබර් මස 02 දින සිට 2023 ජූලි මස 17 දින දක්වා මෙසේ රුසියානු සංචාරකයන් ලක්ෂයක පිරිසක් පැමිණ තිබිණි .

ඊයේ (17ද) දින මෙරටට පැමිණි ගුවන් යානය තුළ රුසියානු සංචාරකයන් 292 සහ කාර්ය මණ්ඩලය 12 දෙනකුගෙන් සමන්විත වුණි.

පසුගිය වසරේ (2022) ඔක්තෝබර් මස 02 වැනිද රුසියානු ඒරොෆ්ලොට් ගුවන් සේවය සහ එම වසරේ නොවැම්බර් මස අසූර් එයාර් (Azur Air) ගුවන් ගමන් සම්බන්ධතා කටුනායක ගුවන් තොටුපොළ සමග ආරම්භ කළේය.

එසේම 2022 දෙසැම්බර් මාසයේ රෙඩ් වින්ග්ස් ( Red Wings ) ගුවන් සේවය මත්තල ගුවන් තොටුපොළ සමග ගුවන් ගමන් ආරම්භ කර තිබිණි.

මෙම රුසියානු ගුවන් සේවා යානා 314ක් මගින් මෙසේ ශ්‍රී ලංකාවට මෙම කාල වකවානුව තුළ රුසියානු සංචාරකයන් ලක්ෂයක ප්‍රමාණය රැගෙන විත් තිබිණි.

# SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලයේ නව උපකුලපති මහාචාර්ය වේරංජ



SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලයේ නව උපකුලපති සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස මහාචාර්ය වේරංජ කරුණාරත්න පත් වී තිබේ. කැනඩාවේ බ්‍රිටිෂ් කොලොම්බියා විශ්ව විද්‍යාලයේ කෘත්‍රිම කාබනික රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය උපාධියක් හිමි ඔහු ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා විශේෂඥතාවක් දක්වයි. වර්තමානයේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති සහ ජාතික පර්යේෂණ කවුන්සිලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන මහාචාර්ය කරුණාරත්න පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ හිටපු ප්‍රධානියාය. ඔහු ජාතික බුද්ධිමය දේපළ කොමිසමේ හිටපු සභාපති සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) සහකාර අධ්‍යක්ෂ, විද්‍යා කණ්ඩායම් නායක ලෙසද කටයුතුකර ඇත. මහාචාර්ය කරුණාරත්න SLINTEC ඇකඩමියේ උපකුලපති තනතුරද හොබවා ඇත.



# ඉඩක් ලැබුණොත් රිළවි හෙට හරි රට යවනවා

## ඇමැති මහින්ද අමරවීර

■ සාලිය කුමාර ගුණසේකර

රිළවුන් රට යැවීමට හෙට හෝ අවස්ථාවක් ලැබුණහොත් එය ක්‍රියාත්මක කරන බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසීය.

ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රය විසින් ඊයේ (17 වැනිද) පවත්වන ලද මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

චීනයේ පුද්ගලික සමාගමක් විසින් එරට සත්වෝද්‍යාන විසි දහසක් සඳහා මෙරට රිළවුන් ඉල්ලා සිටි බවත්,පළමු අදියර යටතේ රිළවු 2000 ක් ලබා ගැනීමට එම සමාගම සැලසුම් කර සිටි බවද ඇමැතිවරයා කීවේය.

පරිසරවේදීන් අධිකරණයට යෑම නිසා රිළවුන් රට යැවීම මේ වනවිට නතරවී තිබෙන බවත්,මෙම පරිසර සංවිධාන බොහොමයක් පිටරට ඩොලර් මත යැපෙන ඒවා බවද ඇමැතිවරයා කීවේය.

රිළවුන් නිසා වගාවට විශාල හානියක් සිදුවන බවද,එම හානියට ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පරිසර සංවිධාන පිළිතුරු දියයුතුව ඇතැයිද ඇමැතිවරයා සඳහන් කළේය.



# සිව්වැනි මහලෙන් ඇද වැටී කතක් මරු දකී

■ මනෝජ් එදිරිසිංහ-මීරිගම

අලුත්ගම - බෝගමුව ප්‍රදේශයේ නිවාස සංකීර්ණයක සිව්වන මහලින් ඇද වැටුණු එක්දරු මවක් ජීවිතක්ෂයට පත්වීමේ සිද්ධියක් පිළිබඳ පරීක්ෂණ පවත්වන බව බෙම්මුල්ල පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ වෙරගලගේ චතුරිකා මදූෂානී අබේරත්න නමැති 31 හැවිරිදි එක් දරු මවකි.

මියගිය කාන්තාව කලක සිට අලුත්ගම - බෝගමුව ප්‍රදේශයේ පිහිටි නිවාස සංකීර්ණයක , නිවසක් කුලියට ගෙන පදිංචිව සිට ඇතැයි පොලිසිය කියයි. මියගිය තැනැත්තිය සැමියා සහ දරුවා සමග වාසය කොට ඇති අතර පෙරේද (16ද) රාත්‍රී 11.00 ට පමණ නිවසේ සිව්වැනි මහලින් බිමට වැටී ඇති බවත් සැමියා කාන්තාව ගම්පහ රෝහලට ඇතුළත් කරන විටත් මියගොස් සිටි බවත් මූලික විමර්ශනවලදී හෙළිවී ඇත.

කාන්තාව බිම ඇද වැටුණාද නැතහොත් බිමට තල්ලු කර දැමුවාදැයි හෙළි කර ගැනීමට පොලිස් පරීක්ෂණ සිදු කරයි. මහෙස්ත්‍රාත් පරීක්ෂණය පැවැත්වීමට නියමිතව තිබිණි.

ගම්පහ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් රෝහණගේ උපදෙස් පරිදි සහකාර පොලිස් අධිකාරී තුසිත කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ බෙම්මුල්ල වැඩබලන පොලිස් ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ආර්.එම්.පී.ඒ.රණවීර මහතාගේ මෙහෙයවීමෙන් වැඩිදුර පරීක්ෂණ පැවැත්වේ.

# උඩ යන පොල් මිලට ලොකුම හේතුව අතරමැදියන්

## - පොල් සංවර්ධන අධිකාරිය



■ නිර්මාණී තිලකසිරි

මේ දිනවල වෙළෙඳපොළේ පොල් මිල විශාල වශයෙන් ඉහළ යාමට මූලික හේතුව අතරමැදියන් විසින් වැඩි ලාභයක් තබා ගනිමින් පාරිභෝගිකයන් වෙත පොල් අලෙවි කිරීම බව පොල් සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

වගාකරුවන් විසින් පොල් ලබා දෙන මිල සහ වෙළෙඳපොළේ පවතින පොල්වල මිල අතර විශාල වෙනසක් පවතින බව පොල් සංවර්ධන අධිකාරිය සිදුකළ සමීක්ෂණයකින් හෙළිවී ඇති බවත් මේ වන විට අතරමැදියන් විසින් පාලනයකින් තොරව පොල් මිල හසුරුවමින් ඇති බවත් එම අධිකාරියේ සභාපති මහාචාර්ය රොෂාන් පෙරේරා පැවසීය.

පොල් වගාකරුවන්ගෙන් රුපියල් 50 - 55ත් අතර මිලකට ලබාගන්නා පොල් ගෙඩියක් කොළඹ වැනි නාගරික ප්‍රදේශවල රුපියල් 100 - 120ත් අතර මිලකට අලෙවි වන බව පැවසේ. පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යන පොල් වෙන්දේසියේදී පොල් ගෙඩියක් රුපියල් 57 - 60ත් අතර මිලකට අලෙවි වන අතර, එහි උපරිම මිල රුපියල් 63ක් පමණ වන බව සභාපතිවරයා කීවේය. එහෙයින් පොල් මිලදීගන්නන්හට විකල්පයක් ලෙස එම වෙන්දේසියට එකතුවිය හැකි බවද හෙතෙම සඳහන් කළේය.

පොල් මිල යම් පාලනයකට නතු කිරීමට නම් පොල් වගාකරුවන් හා අලෙවිකරුවන් අතර නිසි ක්‍රමවේදයක් ඔස්සේ සම්බන්ධතාවක් ඇති කළ යුතු බවද ඒ මහතා කීවේය.

# මාස 12කදී ඖෂධ සහ ශල්‍ය උපකරණ 64ක් බාල බව තහවුරු කරලා



## - විශේෂඥ වෛද්‍ය චමල් සංජීව

■ චාමර පල්ලේගෙදර

වසරක පමණ කාල සීමාවකදී ඖෂධ සහ ශල්‍ය උපකරණ වර්ග 64ක් තත්ත්වයෙන් බාල බවට ඖෂධ නියාමන අධිකාරිය විසින්ම තහවුරු කර ඇතැයි වෛද්‍ය හා සිවිල් අයිතිවාසිකම් ක්‍රම පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සන්ධානය පවසයි.

කොළඹ ඊයේ (17 වැනිදා) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් එම සන්ධානයේ සභාපති විශේෂඥ වෛද්‍ය චමල් සංජීව ප්‍රකාශ කළේ අදාළ ඖෂධ සහ ශල්‍ය උපකරණ ගෙන්වීම සඳහා වැය කළ ඇමරිකානු ඩොලර් බිලියන ගණනක මුදල් අවභාවිතයට සෞඛ්‍ය අමාත්‍යාංශය වගකිව යුතු බවයි.

හදිසි වෛද්‍ය ප්‍රතිකාර ඒකකවල භාවිත කරන dobutamine නමැති ඖෂධය ද පෙරේදා (16 වැනිදා) භාවිතයෙන් ඉවත් කර ඇතැයි කී හෙතෙම මෙසේද පැවසීය.

"මෙම ඖෂධය හදිසි ප්‍රතිකාරවලදී හෘදයේ වේගය අඩුවන අවස්ථාව සහ රුධිර පීඩන වේගය අඩුවන අවස්ථාවලදී භාවිත කරනවා. මීට අමතරව ඇස්ප්‍රීන්, බෙටඩීන්, කොඇමොක්සික්ලෙව්, මෙට්‍රනයිඩසොල්, පිපරසිලින්, අක්ෂි කාච, සේලයින් හා කැනියුලා ඇතුළු මෙරට සෞඛ්‍ය පද්ධතියට අත්‍යවශ්‍ය දිනපතා භාවිත කරන ඖෂධ හා ශල්‍ය උපකරණ රැසක් තත්ත්වයෙන් බාල බවට ලද පැමිණිලි මත පසුගිය මාස 6ක කාල සීමාවේදී වෛද්‍ය සැපයුම් ඒකකය විසින් භාවිතයෙන් ඉවත් කර තිබෙන බව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිල වෙබ් අඩවිය සඳහන් වෙනවා. මෙම ඖෂධ බොහොමයක් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන හෝ ඉන්දියාවෙන් ගෙන්වන ලද ඖෂධ වීම විශේෂත්වයක්."

# සූර් පිට දඹුමොනරෙන් ඇවිත් අධිවේගයේ රෑං ගාලා ගිහින්



■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

දක්ෂිණ අධිවේගී මාර්ගයට අනවසරයෙන් ඇතුළුවී යතුරුපැදියක් ධාවනය කරමින් සිටි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත.

කළුතර - මතුගම මාර්ගයේ සිට පැමිණ දෙඩම්ගොඩ අධිවේගී පිවිසුමෙන් මාතර දෙසට ඇතුළු වී වැලිපැන්න දෙසට යාමට උත්සාහ දැරීමේදී යතුරුපැදිය පසුපස හඹා ගිය අධිවේගී රථවාහන පොලිසියේ දෙඩංගොඩ පිවිසුමේ පොලිස් නිලධාරීන් පිරිසක් සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ මතුගම ප්‍රදේශයේ පදිංචි විදුලි කාර්මිකයකු වන අතර, ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි අධික ලෙස මත්පැන් පානයකර සිට ඇතැයි ද පොලිසිය පැවසීය.

සැකකරු අධිවේගී මාර්ගය ඔස්සේ යතුරුපැදිය ධාවනය කරන අයුරු වාහනයක සවිකර තිබූ කැමරාවක ද සටහන්ව තිබිණි.

# පාසල් සිසුන්ට සහන මිලට 'අලුත් බීමක්'

■ නිර්මාණී තිලකසිරි

තල් ආශ්‍රිතව සිදුකරන අගය එකතු කරන ලද නිෂ්පාදනයක් වන 'තල් යුෂ පානය' (තල් බීම) ඉදිරියේදී පාසල් සිසුන් අතර ප්‍රචලිත කරන බව තල් සංවර්ධන මණ්ඩලය සඳහන් කරයි.

ඒ අනුව තල් යුෂ පානය පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් සහනදායී මිලක් යටතේ ලබාදීමට එම මණ්ඩලය බලාපොරොත්තු වන අතර, මෙහි මූලික පියවර කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් ඉලක්ක කරගනිමින් සිදුකිරීමට නියමිතය.

බොහෝ පාසල් සිසුන් මේ වන විට විවිධ පැණි බීම වර්ග භාවිතයට යොමුව ඇති නමුත් එය සෞඛ්‍යයට අහිතකර බවත්, සෞඛ්‍යමය ප්‍රතිලාභ හා රසවත් බව අතින්ද ඉහළ මට්ටමක පවතින මෙම තල් යුෂ පානය පාසල් මට්ටමින් ප්‍රචලිත කිරීම මගින් පාසල් සිසුන් එවැනි නිෂ්පාදන වෙත නැඹුරුවීම වළක්වා ගත හැකි බවද තල් සංවර්ධන මණ්ඩලය පවසයි.

එම මණ්ඩලය විසින් දැනටමත් තල් යුෂ පානය දේශීය වෙළෙඳපොළ වෙත නිකුත් කරන අතර, හොඳින් පැසුණු තල් ගෙඩිවල යුෂ යොදා ගනිමින් මෙම නිෂ්පාදනය සිදු කෙරේ. තල් යනු වියළි කලාපයට ආවේණික කිසිදු රසායනික පොහොරක් අවශ්‍ය නොවන ස්වභාවිකව වර්ධනය වන ශාකයක් වන බැවින් තල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන භාවිතය මගින් කිසිදු අතුරු අබාධයක් ඇති නොවන බව ද තල් සංවර්ධන මණ්ඩලය වැඩිදුරටත් පෙන්වා දෙයි.

# පාකිස්තානයේ වැඩමුළුවකට ගිය බෞද්ධ දූත පිරිස යළි මවුබිමට



■ ටී.කේ.ජී.කපිල - කටුනායක

පාකිස්තානයේ ඉස්ලාමාබාද් නුවර 'ගාන්ධාර සහ තක්ෂිලා සම්ප්‍රදාය' පිළිබඳව පැවැති පරේයෂණ නිබන්ධන පත්‍රිකා ඉදිරිපත් කිරීමේ වැඩමුළුවකට සහ සම්මන්ත්‍රණයකට සහභාගී වීම සඳහා එරටට ගොස් සිටි ශ්‍රී ලාංකික බෞද්ධ දූත පිරිසක් පෙරේදා (16 වැනිදා) රාත්‍රියේ යළි මෙරටට පැමිණියහ.

අභයගිරිය විහාරාධිකාරී, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කල්ලංචියේ රතනසිරි හිමි, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී වැලිවිටියේ සුජීව හිමි සහ බුද්ධ ශාසන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) නිශාන්ත පුෂ්පකුමාර යන ගිහි පැවිදි දූත පිරිසක් මෙම වැඩසටහනට ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගී වීමට පාකිස්තානය වෙත ගොස් තිබිණි.

එම වැඩසටහනට ශ්‍රී ලංකාව අවට කලාපයේ බෞද්ධ රටවල් 09ක දූත පිරිසක් සහභාගී වූ අතර, එය ඉකුත් 10 වැනිද සිට දින 07ක කාලයක් පැවැත්විණි.

ඔවුන් විසින් ඉදිරිපත් කළ පරේයෂණ නිබන්ධන පත්‍රිකාවල තිබූ ඇතැම් කරුණු එතෙක් පාකිස්තාන රජය හෝ දැන නොසිටි ඒවා බව ඊට සහභාගී වූ භික්ෂූහු පැවසූහ.

# මෙරට වනාන්තර අක්කර 67ක් දිනපතා විනාශ වෙනවා

## - පරිසරවේදී රවීන්ද්‍ර කාරියවසම්



■ සාලිය කුමාර ගුණසේකර

දිනකට මෙරට වනාන්තර අක්කර 67ක් විනාශ වන බව පරිසර හා සොබාදහම් අධ්‍යයන මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක පරිසරවේදී රවීන්ද්‍ර කාරියවසම් පැවසීය.

එම ආයතනය විසින් කොළඹදී ඊයේ (17 වැනිදා) පැවැත්වූ මාධ්‍ය හමුවකදී ඔහු මේ බව කීවේය.

ආණ්ඩුව විසින් සකසා ඇති 2011 - 2048 ජාතික භෞතික සැලැස්මට අනුව මෙලෙස වනාන්තර විනාශ කරන බවත්, මේ වන විට රට තුළ මහා පරිමාණ ඉඩම් මංකොල්ලයක් සිදුවන බවත් හෙතෙම අනාවරණය කළේය.

තවද රජය තැන් තැන්වල සිදුවන පරිසර විනාශයන් ඔප් නංවමින් මහ සැලැස්ම සඟවමින් සිටින බව කී ඒ මහතා මෙම ජාතික භෞතික සැලැස්ම හේතුවෙන් ඉදිරියේදි ජලය පෞද්ගලිකරණය, වනාන්තර විනාශ කිරීම සහ ශ්‍රී ලංකාවේ ඉඩම් මංකොල්ලය වැනි දෑ සිදුවීමට නියමිත බවත් ඒ අනුව ලංකාවේ දැවැන්ත පරිසර විනාශයක් සිදුවීමට නියමිත බවත් අවධාරණය කළේය.

## DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය — www.dlb.lk — 2023.07.16 වන ඉරිදා නිල ප්‍රතිඵල

**අද කෝටිපති (ADA KOTIPATHI)** — දිනය 2023.07.16 | දිනුම් වාරය 1977 | වර්ණය ලා කොළ

ජයග්‍රාහී අංක: 01 06 14 36 | ඉංග්‍රීසි අක්ෂරය: O

මීළඟ සුපිරි ජයමල්ල රු. 57,879,422/-

අද කෝටිපති "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 10 21 42 76 | ඉංග්‍රීසි අක්ෂරය: N

**කප්රුක** — දිනය 2023.07.16 | දිනුම් වාරය 1327 | වර්ණය කහ

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක: Z 07 (සුපිරි අංකය) 26 31 36 75

මීළඟ සුපිරි ජයමල්ල රු. 417,433,604.20

කප්රුක "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 44 51 52 69 | ඉංග්‍රීසි අක්ෂරය: S

**ලග්න වාසනාව** — දිනය 2023.07.16 | දිනුම් වාරය 3863 | වර්ණය දම්

ජයග්‍රාහී අංක: 24 25 38 59 | කන්‍යා

මීළඟ සුපිරි ජයමල්ල රු. 4,586,936/-

ලග්න වාසනාව "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 01 11 28 56 | තුලා

**සසිරි (SASIRI) රට දිනවන වාසනාව** — දිනය 2023.07.16 | දිනුම් වාරය 350 | වර්ණය දුඹුරු

ජයග්‍රාහී අංක: 17 22 30

අද බිහිවූ දෙලක්ෂපතියන් ගණන | 07

දිනා ඇති මුළු මුදල රු. 2,672,120/-

**ශනිදා (Shanida)** — දිනය 2023.07.16 | දිනුම් වාරය 4312 | වර්ණය රෝස

ජයග්‍රාහී අංක: 23 24 45 53 | ඉංග්‍රීසි අක්ෂරය: G

මීළඟ සුපිරි ජයමල්ල රු. 51,215,756.00

ශනිදා "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 25 39 48 67 | ඉංග්‍රීසි අක්ෂරය: U

**SUPER BALL** — දිනය 2023.07.16 | දිනුම් වාරය 2151 | වර්ණය තැඹිලි

ජයග්‍රාහී අංක: 04 28 31 76 | ඉංග්‍රීසි අක්ෂරය: G

මීළඟ සුපිරි ජයමල්ල රු. 55,534,436.40

සුපර් බෝල් "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 01 22 38 69 | ඉංග්‍රීසි අක්ෂරය: P

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.

* මේ වන විට සුපිරි ජයමල්ල දිනාගෙන ඇත්නම් එදිනට පවතින ජයමල්ල වලංගු වේ.



# සැරයන්ගේ පෙට්ටිය කඩා කොස්තාපල් බඩු සොරාගෙන



■ මනෝජ් එදිරිසිංහ - මීරිගම

මීරිගම පොලිසියේ නේවාසිකව රැඳී සිටි පොලිස් සැරයන්වරයකුගේ ඇඳුම් පෙට්ටිය කඩා භාණ්ඩ සොරා ගැනීමට උත්සාහ කළ කොස්තාපල්වරයකු අත්අඩංගුවට ගෙන ඇත. පෙරේද (16 වැනිදා) රාත්‍රියේ අත්අඩංගුවට ගත් පොලිස් කොස්තාපල්වරයාගෙන් කළ ප්‍රශ්න කිරීම්වලදී මීරිගම පොලිස් ස්ථානයේම සේවය කරන තවත් නිලධාරියකුගේද ඇඳුම් අල්මාරිය කඩා දේපළ සොරාගෙන ඇති බවට අනාවරණය වී තිබේ.

සැකකාර පොලිස් කොස්තාපල්වරයා පරීක්ෂා කිරීමේදී ඔහු සතුව තිබූ අබිං මිලිග්‍රෑම් 50ක්, පතොරෙම් 5ක්, විවිධ වර්ගයේ පිහි 3ක්, ඉස්කුරුප්පු නියන්, අඬු, විවිධ හැඩයේ කුඩා ගල් කැබලි, දුරකතනයක්, ස්මාර්ට් අත් ඔරලෝසුවක්, බෙහෙත් කරල්, ඇතුළු භාණ්ඩ තොගයක් පොලිස් භාරයට ගෙන ඇත.

සැකකාර පොලිස් කොස්තාපල්වරයා මොරොන්තුඩුව පොලිසියේ සිට මීරිගම පොලිසියට මීට සතියකට පමණ පෙර ස්ථාන මාරු ලබා පැමිණි අයකි. ඔහු 24 හැවිරිදි මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවකි. අත්අඩංගුවට ගත් සැකකරු අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

# සැමියා හෙරොයින් විකුණනවැයි බොරු ඔත්තුවක් දුන් බිරිඳ අත්අඩංගුවට

■ එෆ්. අස්ලම්

අනියම් පෙම්වතා සමග එක්ව විවාහක සැමියා හෙරොයින් අලෙවි කරන බවට පොලිසියට වැරැදි තොරතුරක් ලබාදුන් කාන්තාවක් බියගම පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ බියගම, බණ්ඩාරවත්ත ප්‍රදේශයේ පදිංචි 34 හැවිරිදි කාන්තාවකි.

මෙම කාන්තාවගේ සැමියා සොරකම් නඩුවකට සිරදඬුවමක් විඳ වසර කිහිපයක් බන්ධනාගාරගතව සිට ඇති අතරේ මෙම කාන්තාව මාතර පදිංචි ශ්‍රී ලංකා යුද හමුදා මුලතිව් කඳවුරේ ලාන්ස් කෝප්‍රල්වරයකු සමගින් සම්බන්ධයක් ඇතිකරගෙන ඇත. ඒ මුහුණු පොතින් දැන හඳුනාගෙනය. මොවුන් අවස්ථා හතරකදී කඩුවෙල නගරයේ ලැගුම්හලකදී හමුවී තිබේ. අදළ කාන්තාවගේ සැමියා පසුගිය මස 05 වැනිද සිරදඬුවම අවසන් කර නිදහස්ව පැමිණීමෙන් පසු එය ඔවුන්ගේ සම්බන්ධයට බාධාවක් වී ඇති බව පොලිස් විමර්ශනවලින් හෙළිවී ඇත.

සිරගතව පැමිණි සැමියා නිවස ආසන්නයේ තැඹිලි ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇත. ඔහු සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම බියගම පොලිසියට තොරතුරු ලැබී ඇත්තේ තැඹිලි ව්‍යාපාරයක් මුවාවෙන් හෙරොයින් ජාවාරමක් කරගෙන යන බවටය. නමුත් ඔහු ගැන කළ සොයා බැලීම්වලදී එවැන්නක් අනාවරණය වී නැත. බියගම වැඩබලන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික කත්‍රිආරච්චිගේ රාජකාරී දුරකතන අංකයටද පසුගියද එම තොරතුරම ලැබී ඇති අතර මේ අනුව තැඹිලි වෙළෙන්ද පොලිසියට රැගෙන විත් ප්‍රශ්න කිරීමට පොලිසිය පියවර ගෙන තිබිණි.

එහිදීද ඔහු හෙරොයින් ජාවාරම් කරන බවට හෙළි වී නැත. බිරිඳ සම්බන්ධයෙන් කළ ප්‍රශ්න කිරීම්වලදී ඔහු පවසා ඇත්තේ ඇය තමා සිරගතව සිටියදී වෙනත් අයකු සමගින් අනියම් ඇසුරක් පවත්වා ඇති බවය.

# සබරගමුව වගේ වෙන්නැයි කෝපා කළ නිර්දේශයට අධ්‍යාපන නිලධාරීන් පස්ස හරවලා

■ නිලන්ත මදුරාවල

සබරගමුව පළාතේ ක්‍රියාත්මක වන ආකාරයට අධ්‍යාපන අමාත්‍යාංශ දත්ත පද්ධතියද සකස් කරන ලෙස පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව කර ඇති නිර්දේශය සම්බන්ධයෙන් නිලධාරීන් එතරම් තැකීමක් නොකරන බව එම අමාත්‍යාංශ ආරංචි මාර්ග සඳහන් කරයි. කාරක සභාව මෙම නිර්දේශය කර ඇත්තේ රුපියල් එක්කෝටි හතළිස් ලක්ෂයක වියදමක් දරමින් මීට වසර එකොළහකට පෙර සිට ආරම්භ කර මේ දක්වා අවසන් කිරීමට නොහැකිව පවතින අධ්‍යාපන අමාත්‍යාංශ දත්ත පද්ධතිය එතරම් සාර්ථක නොමැති බව අනාවරණය වීමෙන් පසුවය. අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් ඉකුත්ද එම කාරක සභාව හමුවට කැඳවූ අවස්ථාවේ දී මේ බව අනාවරණය විය.

අමාත්‍යාංශයේ දත්ත පද්ධතියට වඩා කාර්යක්ෂමව සබරගමුව පළාතේ දත්ත පද්ධතිය ක්‍රියාත්මක වන බව මෙම කාරක සභාවේ දී හෙළි වී ඇත. අමාත්‍යාංශයේ දත්ත පද්ධතියට අදළව නිලධාරීන්ට විදෙස් පුහුණුව ලබා දීමට රුපියල් කෝටි හයක් වැයකර තිබෙන නමුත් මේ වනවිට එම නිලධාරීන් විශ්‍රාම ගොස් සිටින බවත් දේශීය පුහුණුව සඳහා රුපියල් කෝටි අටක් වැයකර තිබෙන බවත් මෙහිදී ප්‍රකාශ වී තිබේ.

සබරගමුව පළාතේ මීට වසර කිහිපයකට පෙර සිට ක්‍රියාත්මක කෙරෙන දත්ත පද්ධතියට ජාත්‍යන්තර සම්මානද හිමි වී තිබේ. දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් විධිමත් දත්ත පද්ධතියක් අධ්‍යාපන අමාත්‍යාංශයට අත්‍යවශ්‍ය බව කාරක සභා සභාපති, රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මෙම කාරක සභාවේ දී සඳහන් කර ඇත.

# නිසි ප්‍රමිතියෙන් කුළු බඩු වගාකර යුරෝපයට යවන්න අලුත් වැඩක්

■ සාලිය කුමාර ගුණසේකර

නිසි ප්‍රමිතියෙන් යුතුව කුළු බඩු වගා කිරීම සඳහා ගොවීන් යොමුකර එම නිෂ්පාදන යුරෝපා රටවලට අපනයනය කිරීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සැලසුම්කර ඇත. ඒ අනුව උසස් තත්ත්වයෙන් වගා කිරීම සඳහා කුරුඳු, ගම්මිරිස්, කෝපි සහ කොකෝවා යන භෝග දැනට තෝරාගෙන තිබෙන බව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සංවර්ධන) ජනක ලින්දර පැවැසීය.

අපනයන භෝග අතරින් මෙම භෝග සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් "යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP - Good Agriculture Practices )"හඳුන්වාදීමට කටයුතු යොද තිබේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් මීට අදළ ප්‍රමිතීන් සකස්කොට ඇත. එයට අනුකූලව අදළ භෝග සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මාර්ගෝපදේශ මාලාවක්ද සකස් කර ඇතැයි අධ්‍යක්ෂවරයා කීවේය.

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හෙවත් ගැප් (GAP) සහතිකකරණයට අදළ අධීක්ෂණ කටයුතු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සිදු කරන අතර මෙම සහතික අදළ වගාකරුවන්ට නොමිලේ ලබාදීමට කටයුතු යොද ඇත. කුළු බඩු භෝග ප්‍රමිතියෙන් තොරව වගා කිරීම හේතුවෙන් එම නිෂ්පාදන සඳහා යුරෝපීය රටවලින් ඇත්තේ අඩු ඉල්ලුමකි. මෙම ගැටලු සඳහා විසඳුමක් ලෙස මෙම ගැප් (GAP) සහතිකකරණය හඳුන්වා දී තිබේ.

එතෙර අරුණ

# ලෝකයේ සුපිරි නළු නිළියන්ටත් ජීවත් වෙන්න ආදායම මදි වෙයි



මෙරිල් ස්ට්‍රීප් සහ ජෙනිෆර් ලෝරන්ස්

■ නිහාල් පීරිස්





වර්ජකයන් උද්ඝෝෂණයේ

ඇමරිකානු හොලිවුඩ් සිනමාවේ නළු නිළියන් සහ තිරනාටක රචකයන් වැඩි පඩි ඉල්ලා දැවැන්ත වැඩ වර්ජනයක් දියත් කර තිබේ. ලෝකයේ ප්‍රධානම සිනමා කර්මාන්තයක් වන හොලිවුඩය සැලකෙන්නේ ලොව ඉහළම ආදයම් ලබන නළු නිළියන් ඇතුළු ශිල්පීන් ශිල්පිනියන් සිටින සිනමා කර්මාන්තයක් ලෙසටය.

නළු නිළියන් 160,000ක් සහ තිර රචකයන් 11,500ක් පමණ මෙම වර්ජනයට එක්ව ඇති බව සඳහන්ය. මෙතරම් පුළුල් පරිමාණයේ වැඩ වර්ජනයක් හොලිවුඩ් සිනමාව තුළ මෙයට පෙර දියත්ව තිබුණේ මීට වසර 60කට පමණ පෙරය. 1960 ගණන්වල ඇති වූ එම වැඩ වර්ජනයට ඇමරිකාවේ හිටපු ජනාධිපති රොනල්ඩ් රේගන් ද සහභාගි වී තිබිණි. ඔහු ඒ කාලයේ හොලිවුඩ් සිනමාවේ ජනප්‍රිය නළුවෙකි.

මෙවර වැඩ වර්ජනය මුලින්ම ආරම්භ කළේ තිර රචකයන්ය. ඊට නායකත්වය දුන්නේ තිර රචකයන්ගේ වෘත්තීය සංවිධානයක් වන ඇමරිකානු රචකයන්ගේ සංසදයයි. ඔවුන්ගේ වැඩ වර්ජනය ආරම්භ වූයේ මැයි මාසයේය. පසුගිය දිනවල මෙම වර්ජනයට නළු නිළියන්ගේ වෘත්තීය සංවිධානද එක් විය. වර්ජකයන්ගේ ප්‍රධානම චෝදනාවක් වන්නේ චිත්‍රපට සමාගම් සහ අලුතෙන් බිහි වී ඇති (නෙට්ෆ්ලික්ස් වැනි) ස්ට්‍රීමිං (Streaming) සේවා සමාගම් විශාල වශයෙන් ලාභ ලබමින් සිටියත් ඒවා සාධාරණ ආකාරයෙන් බෙද ගැනීමට සූදනම් නැති බවයි. මෙම සමාගම්වල ඉහළ විධායක නිලධාරීන් ඉතා ආකර්ෂණීය වැටුප් ලැබුවත් බොහෝ නළු නිළියන්, තිර රචකයන් වැනි අය ලබන්නේ බෙහෙවින් අඩු ගෙවීම් බව ඔවුහු පෙන්වා දෙති.




ඔවුන් පවසන්නේ මෙම තත්ත්වය ඇති වී තිබෙන්නේ ස්ට්‍රීමිං සේවා සමාගම්වල ආගමනයෙන් පසුව බවයි. චිත්‍රපට සහ ටෙලි නාට්‍ය ආදිය නැවත නැවත ප්‍රදර්ශනය කරද්දී ඒවාට සම්බන්ධ නළු නිළියන් ඇතුළු අනෙකුත් ශිල්පීන්ටද යම් ගෙවීමක් කිරීමේ සාර්ථක ක්‍රමයක් කලින් පැවතිණි. මේ තුළින් බොහෝ ශිල්පීන්ට වසර පුරා යම් අඛණ්ඩ ආදයමක් ලබා ගැනීමට හැකි විය. නමුත් ස්ට්‍රීමිං සේවාවල පැමිණීමත් සමග මෙම අමතර ගෙවීම් විශාල වශයෙන් අඩු වී ඇති බවට චෝදනා එල්ල වේ. 'අප ඉතා තණ්හාධික පිරිසකගේ ගොදුරු බවට පත් වී සිටිනවා' වර්ජනයේ නායිකාවක වන සිනමා නිළි ෆ්‍රෑන් ඩෙස්චර් පවසයි.

මේ වනවිට ඇමරිකාව වැනි රටවලද ජීවන වියදම බෙහෙවින් ඉහළ ගොස් තිබේ. තමන්ට ලැබෙන ආදයම් ප්‍රමාණවත් නොවීම නිසා මෙම තත්ත්වයට මුහුණ දීම බොහෝ සිනමා නළු නිළියන් ඇතුළු ශිල්පීන් ශිල්පිනියන්ට අසීරු වී ඇති බව සඳහන් වේ. මේ වනවිට නිෂ්පාදනයේ පවතින දැවැන්ත සිනමා නිර්මාණ සහ රූපවාහිනී මාලා නාටක (TV Series) රැසක කටයුතු වැඩ වර්ජනය නිසා අඩාල වී ඇති බවද විදෙස් මාධ්‍ය වාර්තා කරයි. ඉදිරියේදී ප්‍රේක්ෂකයන් හමුවට පැමිණීමට නියමිත Avatar-3, Deadpool-3, Mission: Impossible- Dead Reckoning Part Two, Gladiator-2 වැනි චිත්‍රපටවල ද, Stranger Things වැනි ජනප්‍රිය මාලා නාටකවලද කටයුතු නතර වී ඇති බව සඳහන් වේ. ඉහළම මට්ටමේ නළු නිළියන්ට මෙම ගෙවීම් පිළිබඳ ප්‍රශ්නය එතරම් බලපාන්නේ නැත. නමුත් ඔවුන් ද වර්ජනයට සහය පළ කරමින් සිටිනු දැකිය හැකි වේ. මෙරිල් ස්ට්‍රීප්, ජෙනිෆර් ලෝරන්ස්, මැට් ඩේමන්, ජේමී ලී කර්ටිස්, ජෙරමි රෙනර් වැනි සුපිරි නළු නිළියෝ මේ අතර වෙති.

වර්ජනයේ නිරත නළු නිළියන්ට ගැටලුවක් වී ඇත්තේ සාධාරණ ගෙවීමක් නොලැබීම පමණක් නොවේ. මේ වනවිට චිත්‍රපටවල සහ මාලා නාටකවල විශාල වශයෙන් භාවිත වන කෘත්‍රිම බුද්ධි (Artificial Intelligence) තාක්ෂණය හේතුවෙන්ද ඔවුන්ට තර්ජනයක් එල්ල වී ඇත. එවැනි තත්ත්වයක් මතුව ඇත්තේ ඇතැම් නළු නිළියන්ගේ හැඩ රුවට සමාන පිටපත් කෘත්‍රිම බුද්ධි තාක්ෂණය ඔස්සේ නිර්මාණය කර නළු නිළියන් වෙනුවට එම කෘත්‍රිම පිටපත් භාවිත කිරීම නිසාය. මෙම පිටපත් නැවත නැවත භාවිත කිරීමේදී ඒ සඳහා අදළ නළු නිළියන්ගෙන් අවසර ගැනීමක් සිදු නොවන බවද, ඔවුන්ට ගෙවීමක් නොකරන බවද වාර්තා වේ. මෙය වැඩ වර්ජනයට බලපා ඇති තවත් ප්‍රධාන හේතුවකි.

## නෙට්ෆ්ලික්ස් වැනි සමාගම් ආදායම් හූරගෙන කනවලු

## නළු නිළියන් 160,000ක් දැවැන්ත වර්ජනයක

වැඩ වර්ජනය තව කොපමණ කලක් ක්‍රියාත්මක වනු ඇත්ද යන්න සම්බන්ධයෙන් තවමත් පැහැදිලිව කිව හැකි නොවේ. වර්ජකයන් සහ සිනමා, ස්ට්‍රීමිං සමාගම් අතර පැවැති සාකච්ඡා අසාර්ථක වී ඇති බවද පසුගිය දිනවල වාර්තා විය. සම්මාන දිනූ මාලා නාටකයක් වන Succession හි ප්‍රධාන චරිතයක් නිරූපණය කළ බ්‍රයන් කොක්ස් පවසන්නේ එය වසර අවසානය දක්වා වුවද ඇදී යාමට ඉඩ ඇති බවයි. එසේ වුවහොත් හොලිවුඩ් සිනමා කර්මාන්තය දැවැන්ත අර්බුදයකට මුහුණ දෙනු ඇති අතර ප්‍රේක්ෂකයන් නොඉවසිල්ලෙන් බලා සිටි නිර්මාණ රැසක් ප්‍රදර්ශනය වීම කල් යනු ඇත. පවතින තත්ත්වය තුළ සමහර නිර්මාණවල කටයුතු සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති බවද ඇතැම් මාධ්‍ය වාර්තාවල සඳහන් වේ.





මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ නව ව්‍යාපෘතිය නිරීක්ෂණය කරමින්

# "කොයි" ලංකාවට එයි

■ කේ.කේ. ආරියදාස - දඹුල්ල

අද ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේද ඉතා ඉහළ ආදායමක් ඉපැයීමට හැකි ස්වයං රැකියා අතරින් එකක් ලෙසට විසිතුරු මසුන් අභිජනනය හැඳින්වීමට පුළුවන. ඉතා කුඩා ඉඩක වුවද ආරම්භ කර හැකි නිසා බොහෝ මත්ස්‍ය ලෝලීන් මසුන් අභිජනන සඳහා යොමුවී සිටිති.

මෙරට තරුණයකු ද පසුගියද ජපන් මිතුරන් කිහිප දෙනකු සමග එක්ව රුපියල් කෝටි හතළිස් අටක වියදමකින් දඹුල්ල වල්ගමවැව දී විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබීය. මෙම අභිජනනය මධ්‍යස්ථානය මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණි.

ජපානයේ කවසාකි නගරයේ පදිංචිව සිටින දඹුල්ල ප්‍රදේශයේ තරුණයකු වූ අමිල ඉන්දික බණ්ඩාර සිය ජපන් මිතුරන් පිරිසක් සමග එක්ව මෙම නව ව්‍යාපෘතිය ලංකාවට රැගෙන විත් තිබිණි.

ව්‍යාපෘතිය සඳහා ඔහු තෝරාගෙන තිබුණේ ජපන් රටෙහි ප්‍රසිද්ධ "කොයි'' නමැති විසිතුරු මසුන් විශේෂයයි.

මෙම මත්ස්‍ය විශේෂය ලෝකයේ බොහෝ රටවල දැඩි ඉල්ලුමක් සහ ඉහළ මිල ගණන් යටතේ අලෙවි වන්නේය.

"මේ මාළුවෙක් රුපියල් ලක්ෂ තිහේ ඉඳලා රුපියල් ලක්ෂ පනහා දක්වා වූ වැඩි මුදලකට ලෝකයේ අලෙවි කෙරෙනවා. මේ වන විටත් ජපන් "කොයි'' කියන විසිතුරු මාළුවා රටවල් ගණනාවක් ඇණවුම් කරලත් තියෙනවා. ඉදිරියේදී වැඩිපුර ඉල්ලුම් කරලා තියෙන ඉන්දියාවට මේ මාළු දෙන්න තමයි මගේ බලාපොරොත්තුව. යැයි ව්‍යාපෘතියේ නිර්මාණකරු වූ අමිල ඉන්දික බණ්ඩාර කියා සිටියේය.

මෙම අවස්ථාව සඳහා ජපන් ජාතික කණ්ඩායමක් එක්ව සිටි අතර "කොයි'' නමැති මත්ස්‍ය අභිජනනය කරන ජාන විශේෂඥවරයා වන norichika ogata ද පැමිණියේය.

තරුණයකු ජපානයට ගොස් එහි රැකියා කරන අතරතුර විශාල මුදලක් මෙරටට ආයෝජනය කරමින් ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අගය කළ යුතු බව ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ උත්සව අවස්ථාවට සහභාගී වෙමින් කියා සිටියේය.



අමිල ඉන්දික බණ්ඩාර



# උම්බෑ කිය කියා.. මරණ බයේ පන්සල් ආ වසු පැටියා



නිදහස් කර ගන්නා ලද ගවයා.





හිමියන්ට නීතියානුකූල අයිතිය ලබා දෙමින්


■ සමන් විජය බණ්ඩාර - මාවනැල්ල

මස් කඩයට ගෙනයමින් සිටි ගවයකු දෙවනගල රාජමහා විහාරයේ භාරකාර ස්වාමීන් වහන්සේ විසින් බේරා ගත් පුවතක් වාර්තා වූයේ මාවනැල්ල ප්‍රදේශයෙනි.

මීට දින ගණනාවකට පෙර මෙම ගවයා මර බියෙන් දිව ගොස් හෙම්මාතගම වඩුවාවල ගම්මානයේ සැඟව සිටියදී ගම්වැසියන් විසින් බේරාගෙන තිබිණි. පසුව ඔවුන් ඒ බව දෙවනගල භාරකාර ස්වාමීන් වහන්සේ වන මැදිරිගිරියේ පුඤ්ඤසාර හිමි වෙත මේ බව දන්වා තිබිණි.

පසුව ගම්වාසීන් විසින් ගවයා අල්ලාගෙන විත් පන්සල වෙත භාර දී ඇත්තේය. දින කිහිපයක් ගතවත්ම ගවයා සොයා අයිතිකරුවන් යැයි කියා ගත් පිරිසක් හෙම්මාතගම පොලිසියේ පැමිණිල්ලක් දමා තිබිණි.

පැමිණිල්ල විභාග කිරීම සඳහා පොලිසිය දෙවනගල විහාරස්ථානයට පැමිණ ඇත්තේය. ඒ නැවත ගවයා ලබා ගැනීමට පැමිණි අයිතිකරුවන් යැයි පවසන පිරිස සමගය. එම අවස්ථාවේදී සතාගේ වටිනාකම කොපමණද යන්න විහාරස්ථානයේ හිමි විමසා ඇති අතර රුපියල් ලක්ෂ දෙකයි අසූවක මුදලක් ලබා දෙන ලෙසට ඔවුන් පවසා ඇත. එම මුදල ලබා දීමෙන් පසු ගවයාගේ නීතියානුකූල අයිතිය විහාරාධිපති හිමි වෙත ලබා දීමට පොලිසිය කටයුතු කර තිබිණි.


මෙවර ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

රුපියල් 850ක මිලකට

5 වසර කිරණ

විශේෂ අනුමාන ප්‍රශ්න පත්‍ර 20ක මල්ලක්...

ගුරු මණ්ඩලයෙන් මෙවර විභාගය ඉලක්ක කර සැකසූ

දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන් සහ පොත්හල්වලින් දැන් මිලදී ගත හැක

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 0762568348